පාලි භාෂාව

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

3 වැනි ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**

පාලි භාෂාව

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

3 වැනි ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

පිරිවෙන් තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධ ව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත්වෙමි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් ද සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑත කාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑත කාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරිමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සෑම විෂයයක් ම ආවරණය කරමින් සකස් කර ඇති ගුරු මාර්ගෝපදේශ සියල්ල පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවා ලීම උදෙසා සැබෑ මෙහෙවරක් වනු ඇති බව ද මගේ විශ්වාසය යි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, කෘතවේදී ස්තුතිය පිරිනමමි.

අකිල විරාජ් කාරියවසම්

අධ්‍යාපන අමාත්‍ය

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදායය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයේ අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් අපට මිදිය නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත. ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගෙන වඩාත් උචිත ක්‍රමශිල්පයන් යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපන අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ ව පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලුම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

එම්. එන්. රණසිංහ

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයාට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සන්තතිය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තව ද ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

පෙරවදන

පිරිවෙන ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍යපරම්පරාව වෙත අච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මඟින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙන මඟින් සිදුවූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක වන විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙන සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මඟින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක වන විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි.එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණි.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අප පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගුරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස්වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017-03-16 දිනැති 412'5'12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යවලට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජු ව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පංති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්වල ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් තම පංති කාමරය තුළ ශිෂ්‍ය මිත්‍රභාවයෙන් හා ප්‍රබෝධාත්මක ව කටයුතු කරමින් ඉහළ සාධනයක් කරා පිරිවෙන් අධ්‍යාපනය නංවා ලීමට උත්සුක වන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ 500ක් සංඝයා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් සමය හා සමයාන්තර ඥාණයත්, සම්භාව්‍ය හා නූතන භාෂාවනුත්, ශිල්ප කලා ඥාණයත්, ජ්‍යෝතිර්විද්‍යා වාස්තුවිද්‍යා ඥාණයත්, ආදි ඥාන සම්භාරයත්, කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදිත කෙරේ.

21 වන සියවසේ අධ්‍යපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රමශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම සහ මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳ අනතිමානී ආනන්දයක් ලබමි. පංතිකාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත්, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත්, උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත් දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත්, මාගේ කෘතඥතාව පිරිනමමි.

විජිත වෙලගෙදර
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

උපදේශකත්වය හා අනුමැතිය : ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

මෙහෙයවීම	:	ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර, අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය විජිත වෙලගෙදර මයා, අධ්‍යාපන අධ්‍යක්ෂ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය
අධීක්ෂණය	:	ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය ජාතික අධ්‍යාපන ආයතනය එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මයා අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය
සම්බන්ධීකරණය	:	පූජ්‍ය කුකුරම්පොළ ඥාණවිමල හිමි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන පිරිවෙන් අධ්‍යාපන ඒකකය ජාතික අධ්‍යාපන ආයතනය පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව අධ්‍යාපන අමාත්‍යාංශය
විෂය නියාමනය	:	පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය ජාතික අධ්‍යාපන ආයතනය කේ. ඒ. සුමිත් ධර්මශ්‍රී මයා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලි භාෂාව) පිරිවෙන් අධ්‍යාපන ශාඛාව අධ්‍යාපන අමාත්‍යාංශය
විෂය විශේෂඥ උපදේශනය	:	පූජ්‍ය මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය කැලණිය විශ්වවිද්‍යාලය

ලේඛක මණ්ඩලය : පූජ්‍ය පුස්සල්ලාවේ ඤාණරතන හිමි
කථිකාචාර්ය (බාහිර), බෞද්ධ අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

පූජ්‍ය මුවපැටිගේවෙල පඤ්ඤාලෝක හිමි
කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය හඳුන්ගමුවේ සද්ධාතිස්ස හිමි
පරිවෙණාචාර්ය, සිරි බුවනෙකබා පිරිවෙණ
ගම්පොළ

කේ. ඒ. සුමිත් ධර්මශ්‍රී මයා
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලි භාෂාව)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

භාෂා හා විෂය කරුණු සංස්කරණය
: පූජ්‍ය මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය විමල් හේවාමානගේ මයා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බෞද්ධ අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

සෝදුපත් කියැවීම : පූජ්‍ය වල්පොළ පියරතන හිමි
පරිවෙණාචාර්ය, විද්‍යොදය පිරිවෙණ
මාලිගාකන්ද, කොළඹ

පරිගණක වදන් සැකැසීම : නදී අමා ජයසේකර මිය
ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ, විභාග දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පිටකවර නිර්මාණය :

ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

පාලි භාෂාව වූකලී ලෝකයේ අතිචමත්කාරජනක මධුර මනෝහර භාෂාවන්ගෙන් එකකි. එයින් රචිත ත්‍රිපිටක සාහිත්‍යය ඇතුළු අටුවා ටීකා හා ප්‍රකරණ සාහිත්‍යාගත කෘති දාර්ශනික හා සාහිත්‍යමය වශයෙන් ලෝකයේ කිසිදු සාහිත්‍යයක දක්නට නොමැති වටිනාකමකින් යුක්ත ය. මෙබඳු භාෂාවක් හා සාහිත්‍යයක් රැක ගැනීම හා පෝෂණය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකේය ථේරවාද සම්ප්‍රදායකට ලෝකයෙන් හිමි වන්නේ වර්ණනා විෂයාතික්‍රාන්ත වූ ගරුත්වයක් බව අපි දනිමු. මිනිසකු විසින් ලැබිය හැකි නිරාමිෂ ආස්වාදය හා බුද්ධත්වය දක්වා වූ උත්තරීතර ආධ්‍යාත්මික පරිපෘෂ්ටියත්, තදනුබද්ධ භාවිකත්වය හා බුද්ධිමය සංවර්ධනයත්, ලබා ගත හැකි විශිෂ්ට සාහිත්‍යයක් ශ්‍රී ලාංකික අප සතු වන බව මැනවින් හඳුනා ගත් බටහිර උගතුන් පවා එකී ගරුත්වය හා කෘතඥතාව ශ්‍රී ලංකාව වෙත පුද කොට ඇත. එපමණක් නො ව එම සවිඥ්ඤාණිකත්වය මුළු මහත් ලෝකයට ම ලබා දීම ජීවිත කාලයක කළ හැකි උත්කෘෂ්ට කර්තව්‍යයක් බව හඳුනා ගත් ඔවුන් එය යුරෝපා රටවලට හඳුන්වා දීමට ක්‍රියා කළ බව ද අප විසින් තේරුම් ගත යුත්තක් වේ. ශ්‍රී ලංකාවේ එවකට විසූ විශිෂ්ට පඬිවරයකු වූ **යාත්‍රාමුල්ලේ ධම්මාරාම** හිමියන්ගෙන් පාලි භාෂාව උගත් **රීස් ඩේවිඩ්ස්** පඬිතුමා එංගලන්තයේ **පාලි මූලාශ්‍රය ග්‍රන්ථ ප්‍රකාශන සංගමය**(Pali Text Society) පිහිටුවා අද දක්වා පමණක් නො ව අනාගතයේ ද මුළු ලෝකයාට ම පාලි භාෂාව හා බුද්ධවචනය ආශ්‍රිත ඥාන සම්භාරය ආධ්‍යාත්මගත කිරීමට ඉඩ සලසා තිබීම මෙයට එක් නිදසුනක් පමණකි. මෙහි වටිනාකම මැනවින් හඳුනාගෙන ඇති බටහිර උගත්හු ඉතා උද්‍යෝගයෙන් හා කැපවීමෙන් යුතු ව මීට සම්බන්ධ හැදෑරීම් මේ වන විටත් සිදු කරමින් සිටිති. ත්‍රිපිටක ධර්මයෙහි ඇතුළත් දාර්ශනික සිද්ධාන්ත පමණක් නො ව භාවනාව හා එමගින් සිදු කෙරෙන මානසික සංවර්ධනය මිනිස් ජීවිතයේ ලැබිය හැකි ලෞකික අලෞකික සියලු පුරුෂාර්ථයන් සාධනය කිරීමෙහි ලා මහඟු පිටිවහලකි. එහෙත් ශ්‍රී ලාංකික අප මෙබඳු වටිනා ඉගැන්වීමක් හා ධර්ම සාහිත්‍යයක් ළඟ තබා ගනිමින් වර්තමානයෙහි අවිඥ්ඤාණික ව සිටීම බලවත් අභාග්‍යයක සලකුණකි.

ශ්‍රී ලාංකේය සම්බුද්ධ ශාසනය ශෝභමාන කිරීම හා චිරස්ථායී කිරීම සඳහා උගත් බුද්ධිමත් හා ගුණගරුක භික්ෂු භික්ෂුණී පරපුරක් සිටීම අවශ්‍ය වේ. එසේ ම උපාසක, උපාසිකා, ගිහි පිරිස ද ධර්මානුධර්ම ප්‍රතිපන්න විය යුතු ය. මෙම කාර්යය සඳහා නිර්දිෂ්ට මාර්ගය සනිටුහන් වන්නේ පාලි භාෂාවෙන් රචිත ත්‍රිපිටක සාහිත්‍යයේ මිස අන් කිසිදු තැනක නො වේ. එම මාර්ගය සුරක්ෂිත කිරීමත් විවරණය කිරීමත් සඳහා අතීත ශ්‍රී ලාංකික උතුම් මහ සඟරුවන විසින් ජීවිත පරිත්‍යාගයෙන් ඉටු කරන ලද කාර්යය නමස්කාර පූර්වක ව සිහිපත් කළ යුතු ය. එහෙත් වර්තමාන සඟ පරපුරෙන් එම වගකීම හා කාර්යභාරය ගිළිහී ගොස් ඇති බව උකටලී සිතින් මෙනෙහි කිරීමට සිදු වී ඇති බව ද නොවළහා කිව යුතු ය. ශ්‍රී ලාංකේය ථේරවාද සම්ප්‍රදායට අයත් එය සුරක්ෂිත කිරීමට අවශ්‍ය වන අමුද්‍රිත පාලි ටීකා ප්‍රකරණ ග්‍රන්ථාදියෙහි පුස්කොළ හා අත්පිටපත් සිය දහස් ගණනක් මෙතෙක් කිසිවකුගේ අවධානයට පත් නො වී තිබීමත්, ඒවා ඒ ඒ තැන්හි දිරාපත් වෙමින් තිබීමත්, ඇතැම් විට මුදලට විකිණීමත්, යනාදි කරුණු රාශියක් නිසා අපට අහිමි වෙමින් පවතී. මෙයට එක ම හේතුව වන්නේ පාලි භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නො තිබීම හා එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදු වී ඇති විශේෂයෙන් ත්‍රිපිටක සාහිත්‍යයේ ගැඹුර හා අනේකවිධ වටිනාකම් පිළිබඳ අවබෝධයක් නො තිබීමත් ය.

මෙයට විසඳුම කුමක් ද? එය අන් කිසිවක් නො ව පාලි භාෂාව හා සාහිත්‍යය පිළිබඳ අනාගත පරපුර ප්‍රවීණයන් කිරීම යි. එය කළ හැකි වන්නේ අනුක්‍රමික ව පාලි භාෂාව ඉගෙනීම සඳහා ආධුනිකයන් පුරුදු පුහුණු කිරීමෙන් හා එය වැඩි දුරටත් ප්‍රගුණ කිරීම සඳහා ශිෂ්‍යයන් තුළ උත්තේජනයක් ඇති කිරීමෙනි. ලෝකයේ විශිෂ්ටතම සාහිත්‍යය, දර්ශනය හා ජීවිත විද්‍යාව ඇත්තේ පාලි ත්‍රිපිටක සාහිත්‍යයේ බව පාලි විෂය උගන්වන ගුරුවරයා විසින් මෙන් ම ආධුනිකයා විසින් ද දත යුත්තකි. විශිෂ්ට පර්යේෂණ ක්‍රමයක් හා ගැඹුරු ඥාන සම්භාරයක් අටුවා හා ටීකාවල ඇතුළත් බව ඔවුන් විසින් තේරුම් ගත යුතු ය. ශ්‍රී ලාංකික අපගේ ඉතිහාසය තේරුම් ගත හැක්කේ **මහාවංසය දීපවංසය** ඇතුළු වංසකථා ග්‍රන්ථවලින් හා පාලි අට්ඨකථා ග්‍රන්ථවලිනි. එපමණක් නො ව මෙම සාහිත්‍යයේ **පජ්ජමධු** වැනි කාව්‍ය ග්‍රන්ථ ද, **වුත්තෝදය** වැනි ඡන්දස් ග්‍රන්ථ හා **සුබෝධාලංකාරය** වැනි අලංකාර ග්‍රන්ථ ද, **ජිනවංසදීපමහාකාව්‍ය** වැනි මහාකාව්‍ය ග්‍රන්ථ ද, **මහානෙක්ඛම්මචම්පු** වැනි චම්පු කාව්‍ය ග්‍රන්ථ ද, **බාලාවතාර, රූපසිද්ධි** වැනි ව්‍යාකරණ ග්‍රන්ථ ද, **අභිධානප්පදීපිකාව** හා **එකක්ඛරකොස** වැනි කෝෂ ග්‍රන්ථ ද, **ධම්මනීති, ලොකනීති** වැනි නීති ග්‍රන්ථ ද, **භෙසජ්ජමඤ්ජුසා** වැනි වෛද්‍ය ග්‍රන්ථ ද, **මිලින්දපඤ්හ** වැනි තර්ක ග්‍රන්ථ ද, **වුත්තමාලාසතක සිරිසුමංගලසතක** වැනි ශතක ග්‍රන්ථ ද, **මහානාගකුලසන්දෙසය** වැනි සන්දේශ ග්‍රන්ථ ද, **කල්‍යාණිසිලාලිපි** වැනි ශිලාලේඛන ද, **චක්කවාළදීපනී** වැනි විශ්වය පිළිබඳ ග්‍රන්ථ ද, යනාදි වශයෙන් අනේකවිධ විෂයයන් සම්බන්ධයෙන් පාලි භාෂාවෙන් ලියැවුණු බොහෝ කෘති ඇත. මේ නිසා පාලි භාෂාව හා සාහිත්‍යය පිළිබඳ මනා දැනුමක් ඇති කෙනකු විවිධ ශබ්ද ශාස්ත්‍රයන් පිළිබඳ නිරායාශයෙන් ම අද්විතීය විද්වතකු බවට පත් වේ. එබඳු උගතකු රටක තුන්කාලයට අයත් අගනා වස්තුවක් බව අමුතුවෙන් කිව යුත්තක් නො වේ. තව ද අප විසින් දත යුත්තක් වේ. එනම් කෙනකු තුළ පවතින උගත්කම පමණක් වටිනා අබරණයක් නො වේ. එයට හැදිච්චකම ද එකතු විය යුතු ය. පාලි පොතපත කියවීමෙන් මිනිසකුගේ ආධ්‍යාත්මයෙහි නො සිතිය හැකි තරම් ආලෝකයක් විහිදේ. ඔහු ඉතා උසස් මිනිසකු වේ. තථාගත දේශනාව ඇතුළත් මෙම පොතපත කියවීමෙන් ලැබෙන දැනුම හා හැදියාව විස්මය ජනක වන්නේ එහෙයිනි.

යාවත්කාලීන වීම

මූලික පිරිවෙන් සඳහා නිර්දේශිත ග්‍රන්ථ මාලාව ඉහත කී ප්‍රධාන අරමුණු ඉලක්ක කර ගත් කෘති සමුදායකි. ඒවා මැනැවින් අධ්‍යයනය කිරීමෙන් පසු ආධුනිකයකුට පාලි භාෂාවෙන් ලියැවී ඇති කවර කෘතියක් වුව ද කියවා තේරුම් ගැනීමට අවශ්‍ය මූලික පදනම ලැබෙනු ඇත. එහි සැකසුම හා එය කළ යුතු ආකාරය පිළිබඳ පාලි භාෂාව උගන්වනු ලබන ගුරුවරයාට මනා අවබෝධයක් තිබිය යුතු බව මුලින් ම තේරුම් ගන්න. අධ්‍යාපනය යන්න මුළුමනින් ම පාහේ රැ දී ඇත්තේ ගුරුවරයා මත ය. ඔහුගේ කාර්යය වන්නේ නො දන්නා දෙය දන්නා දෙයක් බවට පත් කිරීමත් නො හැක්කා හැකි අයකු බවට පත් කිරීමත් ය. එබැවින් ගුරුවරයා නො දන්නෙක් හෝ හැකියාව නැත්තෙක් නො විය යුතු ය. ගුරුවරයා මුලින් ම පූර්ව සූදානමකින් ශිෂ්‍යයා පුහුණු කිරීමේ කාර්යයෙහි නිරත විය යුතු ය. කිසි විටෙකත් ගුරුවරයා නො දන්නකු හෝ නො හැකියාව ඇත්තකු හෝ බව ශිෂ්‍යයාගේ මනසට සම්ප්‍රේෂණය නො කිරීමට වග බලා ගත යුතු ය. මේ සඳහා ගුරුවරයකුට ඇති ප්‍රබලතම ශක්තිය වන්නේ ඔහු සතු ඥානය හා එම ඥානයෙහි යාවත්කාලීන බව යි. එබැවින් පාලි ගුරුවරයා දිනපතා පාලි භාෂාව සම්බන්ධයෙන් තම දැනුම පෝෂණය කර ගත යුතු අතර ම ඒ සම්බන්ධ අලුතෙන් ම ලියැවෙන පොතපත කියවීම, අලුත් වචන හා එහි සංවර්ධනීය

ලක්ෂණ, නවතම ඉගැන්වීම ක්‍රම යනාදිය පිළිබඳ අවබෝධයෙන් සිටිය යුතු ය. එය මූලික අවශ්‍යතාවකි.

ඉගැන්වීම් ක්‍රම

ගුරුවරයාගේ ඉගැන්වීමේ කාර්යය සිදු විය යුතු ආකාරය PPP Theory ලෙස වර්තමාන අධ්‍යාපනඥයන් විසින් පෙන්වා දී ඇත. එය 1. Presentation (ප්‍රස්තුතීකරණය), 2. Practice (භාවිතය) 3. Production (නිෂ්පාදනය) යනුවෙන් දක්වා ඇත.

පළමු වන පියවර වන **ප්‍රස්තුතීකරණයේ** දී කෙරෙනුයේ නියමිත පාඩමට අදාළ දත්ත ගෙනහැර දැක්වීම යි. මෙය ගුරුවරයා විසින් කළ යුත්තකි. ඔහු විසින් විවිධ ක්‍රමෝපායන් යොදා ගනිමින් අදාළ පාඩම ශිෂ්‍යයාගේ මනසට කාවදින ලෙස විස්තර කර දිය යුතු ය. ඒ සඳහා අදාළ මාතෘකාව නිර්වචනය කිරීම, විස්තර කිරීම, නිදසුන් දැක්වීම, පුවරුවක පෙන්වීම, උපමා රූපක චිත්‍ර සටහන් ගෙන හැර දැක්වීම, සංයුක්ත තැටි හෝ වීඩියෝ දර්ශන ඉදිරිපත් කිරීම, අතීතකථා ජනකථා වර්තමාන සිද්ධි මගින් තහවුරු කිරීම යනාදි විවිධ ක්‍රියාකාරකම් කළ හැකි ය. මෙකී කවරාකාර විධියකින් හෝ අදාළ ඉදිරිපත් කිරීම චිත්තාකර්ෂණීය ලෙස සිදු කළ යුතු ය. මෙහි දී ගුරුවරයාගේ කාර්යභාරය 90%ක් වන අතර ශිෂ්‍යයාගේ සහභාගිත්වය සිදු වනුයේ 10%කිනි.

දෙවන පියවර වන **භාවිතයේ** දී එකී පාඩමට අදාළ ප්‍රායෝගික භාවිතයන් නැතහොත් පුරුදු පුහුණු කිරීම් ශිෂ්‍යයා ලවා සිදු කරවිය යුතු ය. එහි දී ශිෂ්‍යයාගේ සහභාගිත්වය 60%ක් වන අතර ගුරුවරයා විසින් 40%ක දායකත්වයක් සැපයිය යුතු ය. ප්‍රශ්න කිරීමට හා තම අදහස් ප්‍රකාශ කිරීමට හා ලියා ගැනීමට අවස්ථාව දීම, සජ්ඣායනා කරවීම, අභ්‍යාස කරවීම යනාදි ක්‍රියාකාරකම් කරවීම මෙහි දී සිදු විය යුතු ය. ගුරුවරයා විසින් මඟ පෙන්වීම කළ යුතු ය. අවසානයේ දී ගුරුවරයා විසින් ශිෂ්‍යයන්ගේ පොදු වැරදි හඳුනා ගනිමින් ඒවා නිවැරැදි කරවිය යුතු ය.

තුන් වන පියවර වන **නිෂ්පාදනයේ** දී ශිෂ්‍යයාගේ අවබෝධය ඔහුගේ ක්‍රියාකාරකම්වලින් ප්‍රකාශ කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කළ යුතු ය. මෙහි 90%ක් ම සිදු කරනු ලබනුයේ ශිෂ්‍යයා විසින් වන අතර, ගුරුවරයාගේ කාර්යභාරය 10%කි. එහි දී ඔහු අදාළ පාඩම සම්බන්ධයෙන් කරුණු දක්වයි. උදාහරණ දෙමින් පැහැදිලි කරමින් ලිවීම කථා කිරීම නිර්මාණ ගෙනහැර දැක්වීම සිදුකෙරේ.

බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදයෙහි ඊට වඩා අතිශයින් ම හරවත් අනුක්‍රමයක් දක්වා ඇත. **සුචිපුලිභා මුත්තො කථං පණ්ඩිතො භවෙය්‍ය** යනුවෙන් අර්ථකථාචාරීහු **සු-චි-පු-ලි-භා** යන මෙයින් තොර ව උගතෙකු විය නො හැකි බව කී හ.

සු යන්නෙන් අදහස් වන්නේ **සුණාති** (Listens - අසයි) යන්න යි. ඒ අනුව මුලින් ම ශිෂ්‍යයාට පාඩම අසා ගෙන සිටීමට සැලැස්විය යුතු ය.

චි යන්නෙන් අදහස් වන්නේ **චින්තෙති** (Thinks - සිතයි) යන්න යි. දෙවනු ව ඇසූ පාඩම පිළිබඳ යමක් සිතීමට හා මතකයෙහි රඳවා ගැනීමට ඉඩ සැලසිය යුතු ය.

පු යන්නෙන් අදහස් වන්නේ **පුච්ඡති** (Questions - විමසයි) යන්න යි. ඒ අනුව ශිෂ්‍යයාට යම් යම් දේ තමාගෙන් (ගුරුවරයාගෙන්) ප්‍රශ්න කිරීමට අවස්ථාව සැලසිය යුතු ය.

ලි යන්නෙන් අදහස් වන්නේ **ලිඛති** (Writes - ලියයි) යන්න යි. ලේඛනය යි.

ලිවීම, කියැවීම මෙන්ම අදාළ දත්ත ඒකරාශී කර ගැනීමට ඉඩ සැලසීම මෙයින් අදහස් කෙරේ. එනම් තමා උගත් දේ දීර්ඝකාලීන මතකයක් කරා රැගෙන යාම පිණිස ලියා තබා ගැනීම ඇතුළුව ඉදිරි ප්‍රයෝජනය සඳහා අවශ්‍ය අභ්‍යාස කිරීමට පෙළඹවීම මෙයින් අදහස් කෙරේ.

භා යන්නෙන් අදහස් වන්නේ **භාසති** (speaks/Expresses - ප්‍රකාශ කරයි) යන්න යි. අවසාන වශයෙන් ශිෂ්‍යයාට තමා ඉගෙන ගත්, අවබෝධ කර ගත් දේ වාචික ව හෝ නිර්මාණාත්මක ව හෝ වෙනත් යම් විධියකින් හෝ ප්‍රකාශයට පත් කිරීමට හැකි වෙයි.
මේ අනුව බෞද්ධ සම්ප්‍රදාය සතු ඉගැන්වීම් ක්‍රම කෙතරම් යාවත්කාලීන ද යන්න මැනැවින් තහවුරු වෙයි. ගුරුවරයකු වශයෙන් ඔබට අපට ම අනන්‍ය වූ මෙම ක්‍රමවේදය අභිමනින් යුතු ව අනුගමනය කළ හැකි ය.

තව ද බුදුන් වහන්සේ හඳුන්වනු ලබන විශේෂණවාචී එක් පර්යාය නාමයක් වන්නේ **සත්ථා** (teacher or instructor) යන්න යි. ඒ අනුව උන්වහන්සේ ද ගුරුවරයෙකි, නැතහොත් උපදේශකයෙකි, එසේත් නැත්නම් මාර්ගය පෙන්වන්නෙකි. උන්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රමවලින් එකක් දක්වෙන පාඨයක් බොහෝ සූත්‍රාන්ත දේශනාවල දක්නා ලැබේ. එනම් **අහං ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි** යන්න යි. **මම කියමි** (tell) **දේශනා කරමි** (preach) **පණවමි** (declare/appoint) **පිහිටුවමි** (establish) **විවරණය කරමි** (explain) **බෙදා දක්වමි** (analyse) **ගැටලුවෙන් එතෙර කරමි** (make clear) යනු එහි තේරුම යි.

1. **ආචික්ඛති** - ගුරුවරයා පළමු ව පාඩම සම්බන්ධයෙන් සුහදශීලී යමක් කියයි.
2. **දෙසෙති** - තමාගේ කීමට ගරුත්වයක් ආරෝපණය වන පරිදි තම භාෂාව හසුරුවයි. එය දේශනාවක් මෙන් ගැඹුරු පිළිගැනීමක් සහිත වූවකි.
3. **පඤ්ඤාපෙති** - එම පාඩම සම්බන්ධයෙන් වැදගත් ම මූලික සංකල්පයක් දක්වයි. නිදසුනක් ලෙස **සමාස** ගැන යැයි සිතන්න. 'සමාසවලින් පද රාශියක් එකතු කොට කෙටිපදයක් සාදා අදහස් රාශියක් කෙටියෙන් කිව හැකි ය' යනුවෙන් **පැණවීමක් නැතහොත් ස්ථිර මතයක්** දක්විය හැකි ය. වෙනත් විධියකින් කිවහොත් **සමාසො පද සංඛෙපො** යනුවෙන් පාඩමට ප්‍රවේශයක් ලබාගත හැකි ය.
4. **පට්ඨපෙති** - අදාළ කරුණු දක්වමින් ශිෂ්‍යයා තුළ විශ්වාසය හා රුචිකත්වය ගොඩ නගමින් එකී ඉගැන්වීම තුළ ශිෂ්‍යයා පිහිටුවයි.
5. **විවරති** - විස්තර විවරණ දක්වමින් කරුණු පැහැදිලි කරයි.
6. **විභජති** - විශ්ලේෂණය කරයි. බෙදා දක්වයි. සමාස නම් එහි විග්‍රහ වාක්‍ය **මහන්තො ච සො පුරිසො මහාපුරිසො** (මහත් වූයේත් ඔහු ය පුරුෂයකු වූයේත් ඔහු නුයි මහාපුරුෂ නම් වේ.) යනාදි නයින් විග්‍රහ වාක්‍ය දක්වීම එයින් දිගු අදහසක් කෙටි වී ඇති ආකාරය, එබඳු පද භාෂාවේ යෙදී ඇති ආකාරය, ඒවා නාමපද මෙන් විභක්තිවල වරනැගෙන ආකාරය, එයින් අර්ථය වෙනස් වන අයුරු, භාෂාව අලංකාරවත් හා ඕජෝ ගුණයෙන් යුක්ත වන ආකාරය යනාදිය පැහැදිලි කරයි. අනතුරු ව සමාස බෙදා දක්වමින් 'බෙදා දක්වා හෙවත් විභජනය කොට' ඒ සම්බන්ධයෙන් පරිසමාප්ත දැනුමක් ලබා දෙයි.
7. **උත්තානීකරොති** - ගැටලුවෙන් නිදහස් කෙරේ. ශිෂ්‍යයා සමාස පිළිබඳ තිබූ සියලු ගැටළුවලින් නිදහස් කෙරේ.

බුදුදහම තුළ පවත්නා මෙවන් සුවිශේෂ ක්‍රමවේද ඕනෑ ම කාලයක කවර ම හෝ විෂයකට කෙතරම් උචිත ද යන්න විමසා බැලීම වටී. තමා උගන්වනු ලබන සෑම පාඩමක දී ම මෙබඳු පැහැදිලි රාමුවක් තුළ හිඳිමින් සැලසුම් සහගත ව කරුණු ඉදිරිපත් කිරීම ගුරුවරයා සතු වගකීමකි.

අවධානය රඳවා ගැනීම

ඉගැන්වීම වූ කලී හැම අයුරකින් ම සැලසුම් සහගත, විධිමත් හා යහපත් පරිදි සිදු විය යුතු කාර්යයකි. බුදුරජාණන් වහන්සේගේ කරුණු ගෙනහැර දැක්වීමේ ස්වභාවය විවරණය කෙරෙන පද කිහිපයක් පෙළෙහි දක්වා ඇත. එම පද **සං** (යහපත් ලෙස) යන උපසර්ගය පූර්වක වන පරිදි යොදා තිබීම විශේෂයක් වේ.

සන්දස්සෙති - කරුණු මනා ව දක්වයි.

සමාදපෙති - එම කරුණු කෙරෙහි මනා විශ්වාසයක් ගොඩනගයි.

සම්පහංසෙති - ශිෂ්‍යයා තුළ ඉගැන්වූ කරුණු කෙරෙහි සතුටක් ඇති කරවයි.

සමුත්තෙජෙති - ඉගෙනීම කෙරෙහි උත්තේජනයක් ඇති කරවයි.

ගුරුවරයා විසින් කරනු ලබන කාර්යය විධිමත් වූ ද, මානසික සතුට උපදවන්නා වූ ද, ශිෂ්‍යයාට වැඩිදුර හැදෑරීම සඳහා උත්තේජනයක් ඇති කරවන්නා වූ ද, ක්‍රියාවලියක් විය යුතු ම ය. ශිෂ්‍ය අවධානය දිනා ගැනීම කිසි සේත් ඕලාරික පහත් ග්‍රාම්‍ය කථා ආදිය කීමෙන් සිදු නො කළ යුතු ය. එය බෞද්ධ ක්‍රමවේදය නො වේ. එසේ ම එවැනි දෑ තුළ ස්ථිරසාර දීර්ඝකාලීන වටිනාකමක් ද නැත. ගුරුවරයාගේ ශිෂ්ට සම්පන්න බව හා ප්‍රියශීලී හෘදයාංගම භාෂාව, දයාබරිත බව, පාඩමට අදාළ ව ම කරුණු දැක්වීම, පැහැදිලි හා නිරවුල් උච්චාරණය, සරල ඉගැන්වීම් ක්‍රම, ආකර්ෂණීය ශිෂ්‍ය ක්‍රියාකාරකම් යනාදිය ශිෂ්‍ය අවධානය රඳවා ගැනීමේ හේතු ය. බුදුරජාණන් වහන්සේ එවන් ආදර්ශමත් ඉගැන්වීමක නිරත වූ ශාස්තෘවරයෙකි.

ව්‍යාකරණය හා පරිවර්තනය

මූලික පිරිවෙන් පාලි විෂය ග්‍රන්ථ මාලාවෙහි සෑම පාඩමක් ම සැකසී ඇත්තේ කිසියම් ව්‍යාකරණාංගයක් ඉගැන්වීමට අදාළ වන පාලි පාඨයක් ප්‍රස්තුත කොට ගනිමිනි. එම පාඨ හුදු පරිවර්තනයක් කිරීම පමණක් අරමුණු කොට ගත් ඒවා නො වේ. බොහෝ විට පාලි ඉගෙනීම සඳහා අනුගමනය කරනුයේ ව්‍යාකරණ ඉගෙනීමත් පරිවර්තනය කිරීමත් යන ක්‍රම දෙක යි. මෙම ක්‍රමය 18 වන සියවස දී පමණ ක්‍රියාත්මක වූ දැනට යල් පැනගිය ක්‍රමයකි. ව්‍යාකරණය හා පර්වර්තනය කිරීමේ ක්‍රමවේදයෙන් කිසිදු ජීව භාෂාවක් සාර්ථක ව ඉගෙන ගත නො හැකි ය. එහෙයින් සෑම පාඩමක් ම ආරම්භ කෙරෙන පාලි ඡේදය දෙස ඊට වඩා පුළුල් ඇසකින් බැලිය යුතු ය. පළමු වන ශ්‍රේණියේ සිට පස් වන ශ්‍රේණිය දක්වා සෑම පෙළ පොතක් ම සැකසී ඇත්තේ අනිවාර්යයෙන් ම දත යුතු ව්‍යාකරණාංග කිහිපය කෙරේ දැනුම පුළුල් වන පරිදි ය. නිදසුනක් ලෙස සෑම පන්තියකට ම අදාළ ග්‍රන්ථයේ මුල් ම පාඩම වන්නේ පාලි අක්ෂර මාලාව යි. දෙවැන්න නාමපද යි. සෙසු පාඩම් ද එසේ ම ය. ඒවා කිසියම් රටාවකට සැකසී ඇත. එම පාඩම් අනුක්‍රමයෙන් ශිෂ්‍යයාගේ දැනුම දියුණු කිරීම අරමුණු කොට සකසා ඇති බව පාඩම් සැසඳීමෙන් වටහා ගන්න. එය ඒ ඒ පන්තියේ දී තම අවධානය වැඩි වශයෙන් යොමු කළ යුත්තේ කවර විෂය සීමාවක් කෙරෙහි ද යන්න අවබෝධ කර ගැනීමට ඔබට උපකාරී වනු ඇත. එකී සෑම පාලි ඡේදයක් ම මැනවින් උච්චාරණය කිරීම, ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දීම, එයින් ලැබෙන ජීවිත අවබෝධය සාකච්ඡා කිරීම, කාව්‍යමය හා සාහිත්‍යමය ලක්ෂණ පෙන්වා දෙමින් රසාස්වාදය කිරීම, සමාජ සංස්කෘතික හර පද්ධතීන් විවරණය කිරීම, ආගමික කාර්යයන් සඳහා යොමු කරවීම, නිර්මාණාත්මක වාක්‍ය රටා සෑදීමට යොමු කරවීම යනාදිය ඒ ඒ පන්තියේ ශිෂ්‍යයන්ගේ වයස් මට්ටම් ආදිය කෙරෙහි සැලකිල්ලක් දක්වමින් සිදු කළ හැකි ය. ඒ සඳහා උපකාර වන මග පෙන්වීම් පාඩම

අවසානයේ අභ්‍යාස මගින් පෙන්වා දී ඇත. මෙයින් අපේක්ෂිත කාර්යය වන්නේ අනුක්‍රමික ව ශිෂ්‍යයාගේ දැනුම මෙන් ම හදවත ද පෝෂණය කිරීම යි.

සෑම භාෂාවක ම ව්‍යාකරණය වූ කලී ශිෂ්‍යයන් විසින් ඉතා අපහසු යැයි සලකනු ලබන විෂය පරිපථයක් වේ. එහෙත් එය සත්‍යය නො වේ. භාෂාවේ ඇතැම් රීති අප ඉගෙන ගෙන ඇත්තේ කිසියම් ව්‍යාකරණ කෘතියකින් නො වේ. ඒවා බොහෝ විට ඉගෙන ගන්නේ පොතපතෙහි යෙදී ඇති ආකාරය බහුල වශයෙන් දැකීමෙනි. ඒ අනුව පොතපත වැඩි වශයෙන් කියවීම, නිවැරදි ලෙස උච්චාරණය කිරීම, පරිවර්තනය කිරීම, අරුත් තේරුම් ගැනීම යනාදියෙන් එහි ශෛලිය හා භාෂා රීතිය හඳුනා ගත හැකි ය. ඒ අනුව කෙනකුට ව්‍යාකරණ ඉගෙනීමකින් තොර ව වුව ද භාෂාවක් හැසිරවීමේ ශක්තිය ලැබේ. අනෙක් කිසිදු බුද්ධ දේශනාවක ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දී නැත. එසේ ම ව්‍යාකරණය ඉගෙනීම සඳහා ශ්‍රාවකයන් දිරිමත් කළ අවස්ථාවක් ද නැත. ව්‍යාකරණයෙහි ප්‍රවීණ වූ කිසියම් ශ්‍රාවකයකු අග තනතුරු දීම් ආදියෙන් ඇගයීමක් කළ බවට ද සාධක නැත. එහෙත් ව්‍යාකරණ හැදෑරීමකින් තොර ව බුද්ධවචනය වටහා ගැනීමෙන් මාර්ග ඵල අවබෝධ කොට ගෙන ඇත. එයින් තහවුරු වන්නේ ව්‍යාකරණය පිළිබඳ අනවශ්‍ය වටිනාකමක් දීමට මුල් කාලීන බෞද්ධ සම්ප්‍රදාය තුළ උද්‍යෝගයක් නො පැවති බව යි. එබැවින් භාෂාව ඉගැන්වීමේ දී ශිෂ්‍යයා කෙරෙහි ව්‍යාකරණය සම්බන්ධයෙන් අනවශ්‍ය භීතියක් ඇති නො කරවීමට ගුරුවරයා විසින් වග බලාගත යුතු ය.

ඉහත කී අදහස දැඩි ව ගෙන වරදවා වටහා නො ගත යුතු ය. බුද්ධකාලීන ශ්‍රාවකයන් ව්‍යාකරණය නො දත් බවත් එහෙයින් මෙ කල ද ව්‍යාකරණය දැන ගැනීම අවශ්‍ය නො වන බවත් තහවුරු කිරීමට උත්සුක නො විය යුතු වන්නේ ඔවුන් සංස්කෘත භාෂාව දැන සිටි බැවින් පාලි භාෂාවේ භාවිතය ඔවුන්ට වහා වටහා ගත හැකි වූ හෙයිනි. එනිසා ඔවුන්ට ව්‍යාකරණමය දැනුමක් නො තිබූ බව කීම නිවැරැදි නො වේ. අපට ද සංස්කෘත භාෂා ඥානය මැනවින් ඇත්නම් පාලි ව්‍යාකරණ සිද්ධාන්ත ද ඒ අනුව බොහෝ සෙයින් වටහා ගත හැකි ය. මේ නිසා ව්‍යාකරණය සම්බන්ධයෙන් පහත දැක්වෙන අපගේ සාම්පදායික අදහස ද සම්භාවනීයත්වයෙන් පිළිගත යුත්තකි.

යො නිරුත්තිං න ජානාති - ජානාති පිටකත්තයං

පදෙ පදෙ විකංඛෙය්‍ය - වනෙ අන්ධගජො විය

'යමෙක් ව්‍යාකරණය නො දනී ද, පිටකත්‍රය දනී ද, ඔහු වනයෙහි සැරිසරන අන්ධ ඇතකු මෙන් පියවරක් පාසා සැක කරයි' යනු එහි දළ අදහස යි. මෙයින් අදහස් වන්නේ ව්‍යාකරණය නො දනී නම් බුද්ධවචනය හැදෑරීමේ දී නිතර ම ගැටලුවලට මුහුණ පාන බව යි. එයින් ගම්‍ය වන්නේ ව්‍යාකරණ ඥානයෙන් තොර ව බුද්ධවචනය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම අපහසු බව යි. මේ නිසා ව්‍යාකරණ ඥානය බුද්ධවචනය හැදෑරීමේ අත්‍යවශ්‍ය අංගයක් වේ. ලෞකික විෂයයන් හැදෑරීම සඳහා අප විසින් යොදා ගනු ලබන ඉංග්‍රීසි සිංහල භාෂාවලට වඩා බුද්ධවචනය ප්‍රකාශ වන පාලි භාෂාව වෙනස් ය. එය කිසි සේත් සෙසු භාෂාවලට සම කළ නො හැකි ය. ඊට හේතුව එය **සාත්ථ සබ්‍යඤ්ජන** ගුණයෙන් යුක්ත වීමත් ශබ්ද ධ්වනි ආශ්‍රිත ශක්ති විශේෂයන් පැවතීමත් නිසා ය. එම නිසා තනි අක්ෂරයක් වුව ද වැදගත් ය. වෙනත් භාෂාවල අක්ෂරයක් වැරදුණු පමණකින් අර්ථයට මහත් හානියක් සිදු නො වේ. එහෙත් පාලියේ අක්ෂරයක් වැරදුණ හොත්

එයින් අර්ථයට සිදු වන හානිය විශාල ය. එබැවින් ආගමික භාෂාවක් වන පාලියේ සියලු භාෂාත්මක ප්‍රයෝග සැලකිල්ලෙන් භාවිත කළ යුතු වේ. පාලි භාෂාවේ දී ව්‍යාකරණය වැදගත් වන්නේ එහෙයිනි. මෙම වචනවල තේරුම බලන්න. **අත්ථි ලිඞ්ගං (ලිංගයක් ඇත) අත්ථිලිඞ්ගං (ලිංගත්‍රයක් නැත), මච්චො (මිනිසා) මච්ඡො (මත්ස්‍යයා), අච්චි (ගිනිදැල්) අච්ඡි (ඇස)** යනාදි වශයෙනි. එක් අක්ෂරයක වෙනස නිසා අර්ථමය වශයෙන් සිදුවන වෙනස එයින් පෙනේ. ඇතැම් පද ලියන්නේ එක සමාන ව වුවත් උච්චාරණයෙන් වෙනස පෙන්නුම් කළ යුතු ය. **අජහිතො** යන්නෙහි තේරුම **'අජානං හිතො අජහිතො'** යනුවෙන් තත්පුරිස සමාස පදයක් ලෙස ගෙන **එළුවන්ට හිතවත් වූ තැනැත්තා** යනුවෙන් අර්ථ දැක්විය හැකි ය. එසේම එයට **අජහිතො** යන්නෙහි **අත් නො හළ තැනැත්තා(න ජහිතො)** යනුවෙන් ද අරුත් කිව හැකි ය. මේ නිසා පාලි-සංස්කෘත වැනි භාෂාවල උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතියේ හික්මවීමක් ද සිදු කෙරේ. එබැවින් කළයුතු වන්නේ කුමක් ද යන්න ඉතා පැහැදිලි ය. එනම් ව්‍යාකරණය පිළිබඳ නිරවුල් දැනුමක් තිබීම භාෂාවක් හැදෑරීමේ දී අත්‍යවශ්‍ය අංගයක් බව ශිෂ්‍යයාට අවබෝධ කර දීම හා ඒ සඳහා ඔහු තුළ උත්තේජනයක් ඇති කිරීම යි.

ව්‍යාකරණයේ සරල බව

පාලි භාෂාව මැනවින් හැදෑරීමට අවශ්‍ය වන පාලි ව්‍යාකරණය කෙනකුට වටහා ගත නො හැකි තරමට සංකීර්ණ වූවක් හෝ පුළුල් වූවක් හෝ දුෂ්කර වූවක් හෝ නො වේ. එහි විෂය සීමාව ව්‍යාකරණාංග කිහිපයකට පමණක් සීමා වේ. ඒ අනුව යමකුට අවම වශයෙන් **අක්ෂර මාලාව, නාමපද, සන්ධි, සමාස, තද්ධිත, කාරක, කිතක හා ආඛ්‍යාත** යන ව්‍යාකරණාංග 08 පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇත්නම් ඔහුට පාලි භාෂාව මැනවින් හැසිරවීමේ හැකියාවක් ලැබේ. පාලි විෂය මූලික පිරිවෙන් පොත් පෙළෙහි මෙම ව්‍යාකරණාංග කිහිපය ඉතා විධිමත් ව හා සර්ව සම්පූර්ණ ලෙස ඉගැන්වීමට හැකි වන පරිදි කරුණු පෙළ ගස්වා ඇත. මෙය ගුරුවරයා විසින් මෙන් ම ශිෂ්‍යයා විසින් ද මනා ව තේරුම් ගත යුත්තකි. මේවා ඉගැන්වීමේ දී ගුරුවරයකු වශයෙන් ඔබ තුළ ඉතා පිරිසිදු දැනුමක් තිබීම අතිශය වැදගත් බව තේරුම් ගන්න.

ව්‍යාකරණය ඉගෙනීම යනු භාෂාවක් භාවිත කරන ආකාරය දැන ගැනීම යි. විශේෂයෙන් එහි වාක්‍යයක පද යෙදීමේ රටාව තේරුම් ගැනීම යි. එය ශිෂ්‍යයාට පහසුවෙන් ග්‍රහණය කරගත හැකි වන පරිදි ගොනු කොට දැක්වීමට දක්ෂ ගුරුවරයා සමත් වෙයි. ඔහු ඒ සඳහා විවිධ උපාය මාර්ග අනුගමනය කරයි. පාඩමක මුලින් ම දක්වා ඇති පාඨයක් ශබ්ද නගා කියැවීම, සජ්ඣායනා කිරීම, පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීම ආදි ක්‍රමවලින් ශිෂ්‍යයා වාග් කෝෂය දියුණු කර ගනී. නිවැරදි උච්චාරණ රටාව හා නිවැරදි ලේඛනය හඳුනා ගනී. තිත් කොමා ආදිය නිසි පරිදි තැබිය යුතු ස්ථාන තේරුම් ගනී. පාඨයේ අර්ථය වටහා ගනී. මෙබඳු ප්‍රයෝජන රාශියක් සිදු වේ. මේවා සියල්ල ම ව්‍යාකරණට අයත් කරුණු ය. ඒ අතර ව්‍යාකරණ ග්‍රන්ථවල උගන්වනු ලබන ඉහත කී මාතෘකා ගැන ද ගුරුවරයා සිහිපත් කරයි. තමා ඉගෙන ගත් ව්‍යාකරණ සිද්ධාන්තය එකී පාඨය තුළින් ශිෂ්‍යයා මෙනෙහි කරන අතර එහි අපැහැදිලි බවක් වේ නම් ඔහු විසින් ප්‍රශ්න කරනු ඇත.

ගුරුවරයා වූ කලී සම්පාදකයෙකි (provider). ඔහු සියල්ල සපයන්නෙකි. මෙම කාර්යය වඩා සාර්ථක ව කළ හැකි වන්නේ විෂය පිළිබඳ යාවත්කාලීන දැනුමක් සහිත ව ගුරු භූමිකාවෙහි සිටින කෙනකුට පමණකි. ගුරුවරයා සිතිය යුත්තේ පියෙකු දරුවන් කෙරෙහි සිතන ආකරයට බව

බුදුරජාණන් වහන්සේ වදාළේ එහෙයිනි. එහෙයින් පොතෙහි දී ඇති පාඩමට අදාළ කරුණු පිළිබඳ පමණක් නො ව තත් විෂය සම්බන්ධ අනෙකුත් කරුණු පිළිබඳ ද විශේෂඥ දැනීමක් තිබීම ගුරුවරයකුට ඉගැන්වීමේ දී අතිශය ප්‍රයෝජනවත් වේ. නිදසුනක් ලෙස ආධුනිකයකු අක්ෂර මාලාව පිළිබඳ දත යුත්තේ එහි මූලික කරුණු කිහිපයකි. ඒ අනුව ඔහු භාෂාව මැනවින් භාවිත කරයි. එහෙත් ගුරුවරයා අක්ෂර මූලික කොට ගෙන භාෂාවක ශබ්ද විද්‍යාත්මක ලක්ෂණ ද හැදෑරීමට හැකි බව දැන සිටිය යුතු ය. නිදසුනක් ලෙස **චතුහි වාතෙහි අසම්පකම්පියො** යනුවෙන් යෙදිය හැකි පාඨය **චතුබ්භි වාතෙහි අසම්පකම්පියො** යනුවෙන් යොදා ඇත්තේ ශබ්ද විද්‍යාත්මක අවශ්‍යතාවක් නිසා ය. එකී යෙදුමෙහි ශබ්ද ධ්වනියක් ඇත. එහෙයින් ම එයින් කාව්‍යමය ගුණයක් ද ප්‍රකාශ වේ. අනෙක් අතින් මෙහි සංස්කෘතයෙහි බලපෑමක් ද විද්‍යමාන වේ. එහෙයින් ම එම ප්‍රයෝගය ඓතිහාසික ව්‍යාකරණය අනුව ද විශ්ලේෂණය කළ හැකි ය. මෙබඳු භාවිතයන් පාලියෙහි සුලබ වන හෙයින් ඒවා අධ්‍යයනය කිරීම ද භාෂාවක් පිළිබඳ ගැඹුරු විඤ්ඤාණයක් ඇති වීමට ඉවහල් වේ. අනෙක් අතින් පාලියේ එක ම තනි අක්ෂරයක වුව ද අරුත් කිහිපයක් ඇත. 'ඛ' යන අක්ෂරය **අහස, හිස්** යන අර්ථ ද්වයක් දෙයි. ඒ අනුව **ඛෙ (අහසෙහි), ඛග (කුරුල්ලා), ඛයං (ක්ෂය වීම හෝ නිවන)** යනාදි විවිධ වචන නිර්මාණය වේ. මේ නිසා ආධුනිකයකුට ඉගැන්වීමෙහි නිරත වන ගුරුවරයාට ශිෂ්‍යයා ඉදිරියෙහි තම දැනුම ප්‍රකාශ කිරීමට එයින් මහත් පිටිවහලක් ලැබේ.

ගුරුවරයා විෂය ප්‍රවීණයකු වේ නම් ඔහුට අදාළ පාඩමට ඇතුළත් විය යුතු කරුණු මනා ව පෙළගස්වා ශිෂ්‍යයාට වැඩිදුර ඉගෙනීමට මංපෙත් විවර කර දිය හැකි ය. නිදසුනක් ලෙස පාලියෙහි **කාරක විභක්ති** ප්‍රයෝග භාවිතය දෙස බලන්න. එහි දක්වා ඇත්තේ විභක්තියට අදාළ රීති කිහිපයක් පමණකි. **සමග** යන අර්ථය දීමට යොදන **සහ, සද්ධිං** යන නිපාත පද තතියා විභක්ති නාම පද සමඟ යෙදිය යුතු ය යන්න රීතියකි. එසේ ම **අතුරෙන්/අතරින්/අතර** යන අදහස පැවසීමට නාම පදය ඡට්ඨී හෝ සත්තමී බහුවචනයෙන් යෙදිය යුතු බව කාරක ප්‍රයෝගයකි. ඒ අනුව **ප්‍රඥාවන්තයන් අතුරෙන්** යැයි පැවසිය යුතු විට **පඤ්ඤාවන්තානං** හෝ **පඤ්ඤාවන්තෙසු** යැයි යෙදිය යුතු ය. මෙම දැනුම තරමක් වැඩුණු දැනුමක් සහිත ශිෂ්‍යයකු විසින් දැන ගෙන තිබීම ප්‍රමාණවත් ය. එහෙත් ගුරුවරයකු විසින් තම දැනුම මීට ද වඩා පුළුල් කොට ගෙන තිබිය යුතු ය. **සබ්බං රසං ධම්මරසො ජිනාති** යන්නෙහි තේරුම **'සියලු රස අතුරෙන් ධර්ම රසය ජය ගනියි'** යන්න යි. එම වාක්‍යයෙහි ඡට්ඨී හෝ සත්තමී රීතිය ක්‍රියාත්මක වී ඇද්ද? නැත. එයින් පෙනෙනුයේ එහි **අතුරෙන්** යන අදහස ප්‍රකාශ කිරීමට **දුතියා** විභක්තිය ද යෙදී ඇති බව යි. ගුරුවරයා මෙය දනී නම් ඔහුට ඉගැන්වීමේ කාර්යයයේ දී වඩාත් ආත්ම විශ්වාසයෙන් යුතු ව අදාළ ව්‍යාකරණ සිද්ධාන්තය ඉගැන්විය හැකි ය. ශිෂ්‍යයකු යම් අවස්ථාවක එබඳු ගැටලු ගැන ප්‍රශ්න කළ හොත් නිවැරදි පිළිතුරක් සැපයීමට හැකි වීම, ගුරුවරයාගේ සුවිශේෂ දැනුම තුළින් ශිෂ්‍යයා වැඩිදුර සෙවීමට පෙළඹවීම, අතිරේක පොතපත කියවීමට පෙළඹවීම, විශ්ලේෂණ විමර්ශන හා චින්තන ශක්තිය දියුණු කිරීම, අදාළ පාඩම සිහි කල්පනාවෙන් නැවත නැවතත් අධ්‍යයනය කිරීමට උත්තේජනයක් ඇති වීම ආදි ප්‍රයෝජන රාශියක් එයින් ලැබේ.

මෙපමණක් නො ව ගුරුවරයා තම පුළුල් දැනුමෙන් ශිෂ්‍යයාගේ අවබෝධය පුළුල් කිරීමේ උපාය මාර්ගය ද යොදයි. නිදසුනක් ලෙස ඔබ ශිෂ්‍යයකුගෙන් **එදා** යන්න පාලියෙන් කිව හැක්කේ කෙසේ දැයි ප්‍රශ්න කළහොත් ඔහු වහා **තදා** යැයි පිළිතුරු දෙනු ඇත. එහෙත් දක්ෂ ගුරුවරයා එම අදහස පැවසිය හැකි වෙනත් ආකාර ද පෙන්වා දීමෙන් භාෂාව වඩාත් පහසු ලෙස හා විධිමත් ලෙස භාවිත කිරීමට ශිෂ්‍යයාට මඟ පෙන්වයි. පහත දැක්වෙන නිදසුන් බලන්න.

එදා/එදවස	- තදා	(තදා අරඤ්ඤෙ එකො තාපසො අහොසි.)
	තස්මිං දිවසෙ	(තස්මිං දිවසෙ මනුස්සා දීඝායුකා අහෙසුං)
	තස්මිං සමයෙ	(තස්මිං සමයෙ ත්වං කුහිං විහාසි?)
	තෙන ඛො පන සමයෙන	(තෙන ඛො පන සමයෙන භගවා එවං දෙසෙසි.)
එක් දවසක	- එකදා	(එකදා අහං ජම්බුදීපෙ වසිං)
	එකස්මිං දිවසෙ	(එකස්මිං අහං දිවසෙ ජම්බුදීපෙ අචරිං)
	එකස්මිං කාලෙ	(එකස්මිං කාලෙ අහං ජම්බුදීපෙ උග්ගණ්හිං)
	එකං සමයං	(එකස්මිං සමයෙ අහං ජම්බුදීපෙ විහාසිං)
හොඳයි/මැනවි	- සාධු	(සාධු සාධු මහාකච්චාන)
	භද්දං	(භද්දං තෙ දස්සනං)
	කල්‍යාණං	(කල්‍යාණං තවාගමනං)
	අභික්කන්තං	(අභික්කන්තං භො ගොතම)
	යන්නූන	(යන්නූන ත්වං මෙත්තං චිත්තං භාවෙය්‍යාසි)
නම් වූ	- නාම	(සන්තින්ද්‍රියො නමා සාමණෙරො)
	නාමො	(සුමනපාලො නාමො මහාසයො)
	සමඤ්ඤො	(සුමනො සමඤ්ඤො සමණො අහොසි.)
	අභිධානො	(හික්කඩුවේ සිරි සුමංගලාභිධානො නායකත්ථෙරො.)
	ආඛ්‍යො	(හත්ථිසෙලපුරාඛ්‍ය නගරෙ)
	අව්හයො	(ධම්මප්පියව්හයා භික්ඛුනී සීලවතී හොති.)

මෙයින් පැහැදිලි වන්නේ එක ම අදහස විවිධ අයුරින් පැවසිය හැකි බව යි. මෙසේ එක ම අදහස පැවසිය හැකි ක්‍රම හඳුනා ගැනීමෙන් ශිෂ්‍යයා තම අදහස ඉතා ව්‍යක්ත ආකාරයෙන් පාලියෙන් පැවසීමේ කුශලතාව වර්ධනය කර ගනී. මෙබඳු ක්‍රම ශිෂ්‍යයාගේ මනසට මැනවින් තහවුරු වූ කල්හි පන්තියේ කරනු ලබන පරිවර්තනවල දී පාඨ ග්‍රන්ථ කියවීමේ දී හා සූත්‍ර සජ්ඣායනයේ දී ඔහු ඒ බව ස්මරණය කොට ලේඛනයේ දී පෙන්නුම් කරයි.

එපමණක් නො ව ඇතැම් යෙදුම් මතකයේ තබා ගත හැකි නම් අපට වඩාත් ව්‍යක්ත ලෙස වාක්‍ය ලිවීමටත් භාෂාව කථා කිරීමටත් හැකි වේ. නිදසුනක් ලෙස **කච්චි තෙ කස්සප ඛමනීයං? (කාශ්‍යපය, ඔබට ඉවසන්ට පුළුවන් ද?)** යන මෙම ප්‍රකාශය බලන්න. මෙම පාඨය මතකයේ ඇති ශිෂ්‍යයකුට **කච්චි තෙ ආවුසො ගමනීයං? (අවැත්නි ඔබට යන්ට පුළුවන් ද?)**
කච්චි තෙ උපාසිකෙ පචනීයං? (උපාසිකාවෙනි, ඔබට උයන්ට පුළුවන් ද?)
කච්චි තෙ මහාසය, අජ්ජ කරණීයමිදං කම්මං? (මහත්තයෝ අද මේ වැඩේ කරන්ට පුළුවන් ද?)
යනාදි වශයෙන් බොහෝ විවිධ වාක්‍ය නිර්මාණය කළ හැකි ය. මෙබඳු වාක්‍ය මෙම පොත් පෙළෙහි විවිධ තැන්වල යෙදී තිබෙනු දැකිය හැකි ය.

නිදසුන් -

මා රොදසීති මාතා ඔවදි. (හඬන්න එපා කියලා අම්මා අවවාද කළා. - 2 ශ්‍රේණිය, 5 පාඩම)

උත්තරදිසායං දමිළා, දක්ඛිණපස්සෙ ගොථසමුද්දො, කථං සුඛෙනාහං සයාමි?
(උතුරු පැත්තේ දෙමළු, දකුණු පැත්තේ ගොළු මුහුද, මං කොහොම සැප සේ නිදන්න ද?
2 ශ්‍රේණිය, 6 පාඩම)

තං කිං මඤ්ඤසි මහාරාජ? (මහරජතුමෙනි, ඔබ ඒ ගැන මොකද හිතන්නෙ? - 3 ශ්‍රේණිය, 11 පාඩම)

අත්ථංගතෙ සුරියෙ සායමාසං භුඤ්ජිත්වා (හිරු බැස ගිය කල්හි රාත්‍රී ආහාරය අනුභව කොට - 4 ශ්‍රේණිය, 8 පාඩම)

බුද්ධපුත්තාම්හි සමණ පොස මං (ශ්‍රමණය, මම කුඩා දරුවකු ඇත්තියක් වෙමි. මා පෝෂණය කරන්න. - 5 ශ්‍රේණිය, 16 පාඩම)

ඉහත වාක්‍යවල කිසියම් භාෂා රීතියක් දක්නට ඇත. එම වාක්‍ය ශිෂ්‍යයාට මතකයේ දරා ගත හැකි නම් ඔහුට එම ශෛලියෙන් ම එබඳු සිය දහස් ගණනක් වාක්‍ය නිර්මාණය කළ හැකි ය. එබැවින් ඉගැන්වීමේ දී එබඳු වාක්‍ය ශිෂ්‍යයාගේ මතකයෙහි රඳවාලීමට ගුරුවරයා සමත්විය යුතු ය.

පාඨ විවරණය

සෑම පාඩමක් ම කිසියම් පාඨයකින් ආරම්භ වීම මෙම ග්‍රන්ථවල මූලික ලක්ෂණයක් බව මුලින් කියන ලදී. එම පාඨ පරිවර්තනය කිරීම, ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දීම, අලුත් වචන හඳුනා ගැනීම පමණක් නො ව එම පාඨයෙන් කියැවෙන ආගමික සාමාජික සාහිත්‍යාත්මක හා ඓතිහාසික ආදි කරුණු විවරණය කොට දීම ද ඒවායින් අපේක්ෂිත කාර්යය වේ. මෙය පැහැදිලි කිරීම සඳහා මූලික පිරිවෙණ 3 ශ්‍රේණිය පොතෙහි 08 වන පාඩම ගනිමු.

> 'මන්දාර පර්වතයෙහි දුර්දාන්ත නමින් එක් සිංහයෙක් විසී ය. ඌ විසින් දිනපතා බොහෝ සිවුපාවුන් මරන ලද බැවින් කැලෑවේ සිවුපාවෝ රැස් වී 'අප අතරින් එකකු දිනපතා ඔබගේ සමීපයට එවන්නෙමු' යි කී හ. ඔහු 'ඉතා මැනවැ' යි එය පිළිගති. දිනක් මහලු හාවකුගේ වාරය පැමිණියේ ය. ඔහු 'කෙසේ නම් මරණයෙන් මිදෙන්නෙම් දැ'යි සිතමින් උපායක් සිතමින් තැන තැන කල් යවමින් සිංහයා වෙතට පැමිණියේ ය. බඩගින්නෙන් පෙළුණු සිංහයා කෝපාවිෂ්ට ව 'තෝ කුමක් නිසා පරක්කු වී ආවේ දැ'යි ඇසී ය. 'ස්වාමීනි, මගේ වරදක් නැත. අතරමග දී වෙනත් සිංහයකු විසින් මම නවත්වන ලද්දෙමි. මම ඔබතුමාගේ ළඟට අවුත් නැවත එමි යි කියන තුරු මට එන්නට නො දුන්නේ යැ'යි හාවා කී ය. එයින් අතිශය කෝපයට පත් සිංහයා 'මට වහා ඒ උඩඟු සිංහයා පෙන්වව'යි කියමින් ඔහු සමීපයට යන්නට නික්මිණි. ඉක්බිති සාවා ඔහු ඉතා ගැඹුරු ළිඳක් ළඟට පමුණුවා 'බලන්න ස්වාමීනි, ඒ දුෂ්ටයා මේ ළිඳ ඇතුළේ වෙසේ යැ'යි කියමින් ළිං ජලයෙහි පෙනෙන ඔහුගේ ම ඡායාව පෙන්වී ය. උඩඟු වූ සිංහයා මහත් හඬින් ගොරවමින් ළිඳට පැන එහි ම මළේ ය.'

ඉහත දැක්වෙන ඉතා කුඩා කථා වස්තුව රසවත් කිරීම සඳහා සාහිත්‍යකරුවා උපක්‍රම කිහිපයක් යොදයි. සිංහයා සහ හාවා අතර සංවාදය ඉන් එකකි. අවස්ථා නිරූපණය තවත් උපක්‍රමයකි. භාෂා ශෛලිය තවෙකකි. ඊට අමතර ව කථාවෙන් නො කියැවෙන බොහෝ දේ ඉස්මතු කිරීමට සංකේතාත්මක භාෂාව ද භාවිත කරයි. නිදසුනක් ලෙස මෙහි කථා නායකයාට සිංහයා යොදා

ගැනීමෙන් සමාජයේ කවරාකාර උසස් යැයි සම්මත කෙනකුට වුව ද මෙහි දැක්වෙන සිද්ධි දාමය අදාළ වන බව සංකේතවත් කෙරේ. එසේ ම මෙහි සිංහයා නො හික්මුණු දඩබ්බර කෙනකු බව වචනයකිනුදු නො කියැවේ. එහෙත් ඔහු හිතුවක්කාරයෙක් බව හැඟවේ. එය සංකේතවත් කෙරෙනුයේ ඔහු හඳුන්වනු ලබන නාමයෙනි. එනම් **දුර්දාන්ත** (දුද්දන්ත) යන්නෙනි. එයින් අදහස් කෙරෙනුයේ කිසි දමනයක් නැති අසංවර චණ්ඩ කෙනකු බව යි. **වුද්ධසසක** (මහලු සාවා) යන්නෙන් අදහස් කෙරෙනුයේ මුහුකුරා ගිය චින්තන ශක්තිය යි. ළිං ජලයෙහි ඡායාවෙන් අදහස් වන්නේ මායාව යි. මෙබඳු සංකේතාත්මක අදහස් පැවසීමක් මෙම කථා වස්තුවෙහි භාවිත පදවල දක්නා ලැබේ. අනෙක් අතින් මෙයින් ලැබෙන සමාජ විඥානය ද පුළුල් ය. තරුණකම, ශක්තිය හා බලවත්කම යනාදිය සැම විට ම ජීවිතයක් ගෙවීමේ දී ප්‍රබලතම සාධක නො වේ. ඇතැම් විට සමාජ මට්ටමෙන් කුඩා කෙනකුට වුවත් ඔහුට වයසින් මුහුකුරා ගිය බුද්ධියක් ඇත්නම් උපායශීලී ව ඇතැම් ගැටලු විසඳා ගත හැකි ය. අනෙක් අතින් අවිඥානික ජන සමාජයක දුබලයා හැමවිට ම ප්‍රබලයාගේ ගොදුරක් බවට පත් වන බව ද උපන්‍යාසයකි. මහලු සාවාගේ උපායශීලිත්වයෙන් අපට උගන්වනු ලබන පාඩම එය යි. එබැවින් මහල්ලන්ට ගැරහීම තරුණ ප්‍රජාව විසින් කිසි විටෙකත් නො කළ යුත්තක් ය යන උපදේශය ලැබේ. මෙසේ මෙම කථා වස්තු පිළිබඳ විග්‍රහයක් කිරීමෙන් ද ශිෂ්‍යයාගේ ජීවිත විඥානය හා රසාස්වාද ශක්තිය පුළුල් කළ හැකි ය.

ඉහත දැක්වූ කරුණු අනුව ඉගැන්වීමේ කාර්යයේ දී ගුරුවරයකුට වගකීම් හා කාර්යභාරයන් රාශියක් ඇත. ශිෂ්‍යයා තම ගුරුවරයාගේ ඥාන ශක්තියේ ගැඹුර හා පිරිසිදුභාවය දැකීමෙන් බොහෝ දෑ ඉගෙන ගනී. ඉගැන්වීම යනු ගුරුවරයාගේ ඇඳුම, පැළඳුම, ගමනබිමන, ගතිගුණ, කතාබහ, හැසිරීම, භාෂා පරිහරණය, කරුණු දැක්වීම, රිද්මයානුකූල අවයව චලනය ආදී ශරීරයේ සියලු ඉරියව් මගින් කරනු ලබන මග පෙන්වීමකි. එක් අතකින් ගුරුවරයා ශිෂ්‍යයාගේ දකුණ අත වැනි ය. කෙනකුගේ ජවය, ශක්තිය, හැකියාව සඳහා දකුණු අත බලපාන ආකාරය ඔබ දනී. ශිෂ්‍යයා ද පසුකාලීන ව සමාජයට බොහෝ දෑ කරනු ලබන්නේ ගුරුවරයාගෙන් ලද පන්නරය නිසා ය. බුදුන් වහන්සේ විසිනුදු **ආචරියා දක්ඛිණා දිසා** යනුවෙන් ප්‍රකාශ කිරීම ද සලකා බලන්න. පාලි භාෂාව ත්‍රිපිටක භාෂාව බව අපි දනිමු. මෙම භාෂාව ඉගෙනීමෙන් ශිෂ්‍යයාට දැනුම ලබා දීම නූතන අධ්‍යාපනයේ මූලික අරමුණ වුවත් බෞද්ධ සම්ප්‍රදාය තුළ ඊට සමගාමී ලෙස ශිෂ්‍යයාගේ හදවත පෝෂණය කිරීම ද අපේක්ෂා කෙරෙන බව තේරුම් ගන්න. සමාජයට බුද්ධිමත් මෙන් ම ගුණගරුක මිනිසකු ප්‍රදානය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. විශේෂයෙන් පාලි භාෂාව බහුල වශයෙන් හදාරනු ලබනුයේ සාමණේර භික්ෂූන් වහන්සේලා විසින් හෙයින් උන්වහන්සේලාගේ ශ්‍රමණ සාරූප්‍ය ගුණය වර්ධනය වන මානසික ඒකාග්‍රතාවට තුඩු දෙන දැනුම් සම්භාරයක් ද, නිර්වාණගාමී මාර්ගය කෙරෙහි ප්‍රවණතාවක් හා උත්තේජනයක් ද, ඇති වන පරිදි ඉගැන්වීමේ කාර්යය සිදු විය යුතු බව ගුරුවරයා අවබෝධ කර ගත යුතු ය.

මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.

පටුන

පිටු අංකය

ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය iii

අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය iv

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය v

අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය vi

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය vii

පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්‍ෂගේ පණිවිඩය viii

විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය ix

ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් xii

පටුන xxii

ජාතික අරමුණු xxiii

මූලික නිපුණතා xxiv

විෂය අධ්‍යයනයේ අරමුණු xxvi

විෂය නිර්දේශය වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම xxvii

විෂය නිර්දේශය xxviii

පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය xxxii

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය 1

- පාඩම 1 - පාලි අක්‍ෂරමාලාව I 4
- පාඩම 2 - පාලි අක්‍ෂරමාලාව II 7
- පාඩම 3 - නාම වරනැගීම I 10
- පාඩම 4 - නාම වරනැගීම II 13
- පාඩම 5 - නාම වරනැගීම III 15
- පාඩම 6 - නාම වරනැගීම IV 17
- පාඩම 7 - ආඛ්‍යාත වරනැගීම I 20
- පාඩම 8 - ආඛ්‍යාත වරනැගීම II 23
- පාඩම 9 - වාක්‍ය රචනය I 28
- පාඩම 10 - වාක්‍ය රචනය II 31
- පාඩම 11 - වාක්‍ය පරිවර්තනය I 35
- පාඩම 12 - වාක්‍ය පරිවර්තනය II 37
- පාඩම 13 - පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කිරීම I 41
- පාඩම 14 - පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කිරීම II 44
- පාඩම 15 - සන්‍ධි 46
- පාඩම 16 - සමාස 50
- පාඩම 17 - තද්ධිත 54
- පාඩම 18 - කිතක 63
- පාඩම 19 - නිර්දිෂ්ඨ ගද්‍ය පාඨ පරිවර්තනය 67

තක්සේරුව සහ ඇගයීම 69

ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා පෙර සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම. ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වාර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්, චිත්තවේගී බුද්ධිය

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය- ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **"ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ නිපුණතා**
ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් මගින් වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබාදීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

විෂය අධ්‍යයනයේ අරමුණු

01. පාලි භාෂාව නිවැරැදිව උච්චාරණය කිරීමේ හා ලිවීමේ හැකියාව ඇති කිරීම

02. පාලි භාෂාවේ අක්ෂර වින්‍යාසය, විවිධ පද, විවිධ වාක්‍ය රටා හා රචනය හුරු කිරීම

03. පාලි ගද්‍ය පද්‍ය පාඨ මාතෘභාෂාවටත්, මාතෘ භාෂාවෙන් පාලි භාෂාවටත් පරිවර්තනය කිරීමේ හැකියාව ඇති කිරීම

04. පාලි සාහිත්‍යය පිළිබඳ අවබෝධයක් ලබා දීම හා එහි එන ජීවන දර්ශනය උපයෝගී කර ගනිමින් පෞරුෂේය චරිතයක් බිහිකිරීම

05. ත්‍රිපිටකාගත හරධර්ම චරිතායනය කෙරෙන ආදර්ශවත් හා මනා පෞරුෂයක් සහිත භික්ෂු පිරිසක් රටට දායාද කිරීම

06. පාලි භාෂාව පිළිබඳ දැනුම සිංහල භාෂාඥානයේ ප්‍රවීණත්වය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් බව තහවුරු කිරීම

07. පාලි භාෂාව තමාගේ මෙන්ම ජාතියේ ද සියරටේ ද උරුමයක් බව තහවුරු කිරීම

08. ත්‍රිපිටකය හැදෑරීම සඳහා පාලි භාෂාව මූලික අවශ්‍යතාවක් බව අවධාරණය කිරීම

09. ත්‍රිපිටකය හා අටුවා පරිශීලනය කරමින් ධර්මය නිවැරැදිව අර්ථකථනය කරන භික්ෂු පිරිසක් ශාසනයට දායක කිරීම

10. ත්‍රිපිටක බුද්ධවචනය නිවැරදිව ග්‍රහණය කිරීම පිණිස ඇති ඒකායන මාර්ගය පාලි භාෂාව ඉගෙනීම බව පසක් කිරීම

11. ත්‍රිපිටක බුද්ධවචනය ඉදිරියට පවත්වාගෙන යෑමට ප්‍රතිබල සම්පන්න පිරිසක් බිහිකිරීම

12. මහාවිහාරීය භික්ෂු සම්ප්‍රදාය විසින් සුරක්ෂිත විශිෂ්ට ඥාණ සම්භාරය නොනසා ආරක්ෂා කිරීම

13. ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් පාලි භාෂාව භාවිත කිරීම සඳහා සිසුන් යොමු කිරීම

14. පාලි භාෂාව ඉගෙනීමෙන් තමන්ටත් සිව්පසය සපයන දායක පිරිසටත් මෙලොව පරලොව සුභසිද්ධිය ළඟා කරවා ගත හැකි බව තහවුරු කිරීම

පාලි භාෂාව
විෂය නිර්දේශය පිරිවෙන් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

ශ්‍රේණිය	වාරය	නිපුණතා මට්ටම්	කාලච්ඡේද සංඛ්‍යාව
03	**I**	1.1, 1.2, 2.1, 2.2, 2.3, 2.4, 3.1, 3.2, 3.3, 4.1, 4.2	50
	II	5.1, 5.2, 5.3, 5.4, 6.1, 6.2, 6.3, 7.1, 7.2, 7.3	52
	III	8.1, 8.2, 8.3, 8.4, 9.1, 9.2, 9.3, 9.4, 10.1, 10.2, 10.3, 11.1, 11.2, 11.3	48
		එකතුව	**150**

පාලි භාෂාව - විෂය නිර්දේශය

3 ශ්‍රේණිය

3 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
1.0 පාලි අක්ෂරමාලාව ප්‍රභේද ගතකර භාවිත කරයි.	1.0 1.1 පාලි අක්ෂරමාලාව පිළිවෙළින් ලියා ප්‍රභේද දක්වයි. 1.2 පාලි පද අකාරාදි පිළිවෙළට සකස් කරයි.	1.0 • අක්ෂර 41 • ස්වර හා ව්‍යඤ්ජන • ඝෝෂ • අඝෝෂ • අල්පප්‍රාණ • මහප්‍රාණ • අන්තඃස්ථ • අකාරාදි පිළිවෙළ	1.0 • පාලි අක්ෂර මාලාව නිවැරදි ව පිළිවෙළින් ලියා දක්වයි. • අල්පප්‍රාණ හා මහාප්‍රාණ නො බිඳ පාලි අක්ෂර මාලාව නිවැරදි ව කියවයි. • ව්‍යඤ්ජන ප්‍රභේද ලියා දක්වයි. • ඒ ඒ ව්‍යඤ්ජන ප්‍රභේදය හඳුන්වා ඊට අයත් අක්ෂර ලියයි. • පාලි වචන අකාරාදි පිළිවෙළට ලියයි.	10
2.0. පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි.	2.0 2.1 සත්ථු, පිතු හා මාතු ශබ්ද වරනගා සමවිෂමතා පෙන්වා දෙයි. 2.2 මන ශබ්දය නපුංසක ලිංගයේ වරනගා අර්ථ ගන්වයි. 2.3 අම්හ, තුම්හ ශබ්ද වරනගා අර්ථ ගන්වයි. 2.4 ත, එත, ඉම ශබ්ද ලිංගත්‍රයේ වරනගයි.	2.0 • පුල්ලිංග - සත්ථු, පිතු ශබ්ද • ඉත්ථිලිංග - මාතු ශබ්දය • නපුංසකලිංග - මන ශබ්දය • අම්හ තුම්හ ශබ්ද • ත ශබ්දය • එත ශබ්දය • ඉම ශබ්දය	2.0 • නිර්දිෂ්ට ශබ්ද වරනගා ලියයි. • ඒ ඒ පදවල විභක්තිය හා වචනය ලියා අර්ථ ගන්වයි. • සර්වනාම ශබ්ද විශේෂණ ලෙස යෙදෙන අයුරු පෙන්වා දෙයි. • සර්වනාම ශබ්ද ලිංගත්‍රයේ වරනගයි. • සර්වනාමවල ලිංගය හා විභක්තිය ලියා අර්ථ ගන්වයි.	10
3.0 විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි.	3.0 3.1 ත්‍රෛකාලික ආඛ්‍යාත උභයපදයේ වරනගයි. 3.2 ආඛ්‍යාත ප්‍රත්‍යයමාලාව වගුගත කර ලියයි.	3.0 • වත්තමාන ආඛ්‍යාතය • භවිස්සන්ති ආඛ්‍යාතය • අජ්ජතනී ආඛ්‍යාතය • පඤ්චමී ආඛ්‍යාතය	3.0 • නිර්දිෂ්ට ආඛ්‍යාතවල ප්‍රත්‍යය මාලා මතකයෙන් ලියයි. • නිර්දිෂ්ට ආඛ්‍යාත වගුගත කර ලියයි. • දෙනු ලබන ආඛ්‍යාත පදයක් කිනම් ආඛ්‍යාතයකට අයත් දැයි ලියා දක්වයි.	15

3 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
	3.3 පඤ්චමී, සත්තමී, පරොක්ඛා, හීයත්තනී ආඛ්‍යාත වරනගා අර්ථ ගන්වයි.	• සත්තමී ආඛ්‍යාතය • පරොක්ඛා ආඛ්‍යාතය • හීයත්තනී ආඛ්‍යාතය	• ධාතු කිහිපයක් ඒ ඒ ආඛ්‍යාතවල වරනගන අන්දම වගුගත කර දක්වයි.	
4.0 පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි.	4.0 4.1 කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත වාක්‍ය කාලත්‍රයෙන් ලියයි. 4.2 උපසර්ග හා නිපාත පද යොදා දිගු වාක්‍ය රචනා කරයි.	4.0 • කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය • ත්‍රෛකාලික ක්‍රියා • නිපාත • උපසර්ග	4.0 • කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත සරල පාලි වාක්‍ය නිර්මාණය කර ලියයි. • වර්තමාන කාල වාක්‍ය කාලත්‍රයෙන් ලියයි. • ඒකවචන වාක්‍ය බහුවචනයට හරවා ලියයි. • සිංහල භාෂාවේ දී අප්‍රාණවාචී බහුවචන උක්ත පදයට ඒකවචන ආඛ්‍යාතය යෙදුණ ද පාලියේ දී අප්‍රාණවාචී බහු වචන උක්ත පදයට බහුවචනයෙන් ම ආඛ්‍යාත පදය යෙදෙන බව පෙන්වා දෙයි.	15
5.0 නිවැරදි ව්‍යාකරණ විධි සහිතව පරිවර්තන කාර්යයේ යෙදෙයි.	5.0 5.1 කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි. 5.2 මාධ්‍ය භාෂාගත කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය පාලි භාෂාවට නගයි. 5.3 උපසර්ග හා නිපාත පද යොදා වාක්‍ය දිගු කොට අලංකාර ව ලියා මාධ්‍ය භාෂාවට නගයි. 5.4 සරල පාලි වාක්‍ය කාලත්‍රයට හරවා මාධ්‍ය භාෂාවට නගයි.	5.0 • ත්‍රෛකාලික කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය • සවිභක්තික නිපාත පද	5.0 • කාලත්‍රයට අයත් සරල පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි. • කාලත්‍රයට අයත් මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවට නගයි. • කාලත්‍රයට හා ඒකවචන, බහුවචන බවට හරවමින් වාක්‍ය පරිවර්තනය කරයි. • නියමිත නිපාතවලට අදාළ විභක්ති භාවිත කරමින් වාක්‍ය පරිවර්තනය කරයි.	15

3 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද

6.0 නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි.	6.0
	6.1 නිර්දිෂ්ට පාලි පාඨ, ගාථා, සූත්‍ර හා වරනැගීම් මතකයෙන් ප්‍රකාශ කරයි.
	6.2 නිර්දිෂ්ට පාලි පාඨ, ගාථා, සූත්‍ර හා වරනැගීම් මතකයෙන් ලියයි.
	6.3 නිර්දිෂ්ට ගාථා, සූත්‍ර හා පිරිත් ගණසජ්ඣායනය කරයි.
		6.0
		• වරනැගීම හා වාචෝද්ගත කිරීම
		  • නාම වරනැගීම - සත්‍ථු, පිතු ශබ්ද මාතු ශබ්දය හා මන ශබ්දය අම්හ, තුම්හ, ත, එත, ඉම ශබ්ද
		  • ආඛ්‍යාත වරනැගීම - වත්තමානා, භවිස්සන්ති, අජ්ජතනී, පඤ්චමී, සත්තමී, පරොක්ඛා, හීයත්තනී
		  • බාලාවතාරය - සන්ධි කාණ්ඩය
		• වාචෝද්ගත කිරීම හා ගණසජ්ඣායනය
		  • සතර කමටහන්
		  • අට්ඨසංවෙගවත්‍ථු
		• ගණසජ්ඣායනය
		  • ගිරිමානන්ද සූත්‍රය
		  • ඉසිගිලි සූත්‍රය
		  • පරාභව සූත්‍රය
		  • වසල සූත්‍රය
		  • ආලවක සූත්‍රය
			6.0
			• නිර්දිෂ්ට පාලි පාඨ, සූත්‍ර, පිරිත්, ගාථා හා වරනැගීම් නිවැරදි ව මතකයෙන් කියයි.
			• නිර්දිෂ්ට පාලි පාඨ, සූත්‍ර, පිරිත්, ගාථා හා වරනැගීම් නිවැරදි ව මතකයෙන් ලියයි.
			• නිර්දිෂ්ට ගාථා පාඨ නිවැරදි ව සජ්ඣායනය කරයි.
			• නිර්දිෂ්ට සූත්‍ර හා පිරිත් ගණ සජ්ඣායනය කරයි.
				25

7.0 පාලි භාෂාවේ සන්ධි හඳුනාගෙන භාවිත කරයි.	7.0 7.1 පාලි භාෂාවේ සන්ධි හඳුන්වා සන්ධි ප්‍රයෝජන දක්වයි.	7.0 • සන්ධි හැඳින්වීම • සන්ධි ප්‍රයෝජන • සන්ධි කාර්‍ය්‍ය • සන්ධි ප්‍රභේද • නිදර්ශන	7.0 • සන්ධි යනු මොනවා දැයි හඳුන්වයි. • සන්ධි ප්‍රයෝජන ලියයි. • සන්ධි කාර්යය ලියයි. • ඒ ඒ සන්ධි කාර්යයට නිදසුන් සපයයි. • සන්ධි ප්‍රභේද නම් කරයි.	

3 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
	7.2 සන්ධි කාර්යය හඳුන්වා නිදසුන් සපයයි. 7.3 සන්ධි ප්‍රභේද නම් කොට, කෙටියෙන් පැහැදිලි කරමින් නිදසුන් සපයයි.		• නිර්දිෂ්ට කෘතිවලින් සන්ධි පද උපුටා ලියයි. • ඒ ඒ සන්ධි ප්‍රභේදය හඳුන්වා නිදසුන් සපයයි.	
8.0 පාලි භාෂාවේ සමාස හඳුනාගෙන භාවිත කරයි.	8.0 8.1 සමාස කෙටියෙන් හඳුන්වයි. 8.2 සමාස ප්‍රයෝජන පෙන්වා දෙයි. 8.3 සමාස ප්‍රභේද නම් කරයි. 8.4 නිදසුන බැගින් සපයමින් ඒ ඒ සමාස ප්‍රභේදය කෙටියෙන් පැහැදිලි කරයි.	8.0 • සමාස හැඳින්වීම • සමාස ප්‍රයෝජන • සමාස ප්‍රභේද	8.0 • සමාස යනු මොනවා දැයි පැහැදිලි කරයි. • සමාස ප්‍රයෝජන ලියා දක්වයි. • සමාස ප්‍රභේද කර ලියයි. • ඒ ඒ ප්‍රභේදයට නිදසුන බැගින් සපයයි. • එක් එක් සමාස ප්‍රභේදය කෙටියෙන් හඳුන්වයි.	06
9.0 පාලි භාෂාවේ තද්ධිත හඳුනාගෙන භාවිත කරයි.	9.0 9.1 තද්ධිත කෙටියෙන් හඳුන්වයි. 9.4 තද්ධිත ප්‍රයෝජන ලියා දක්වයි. 9.2 තද්ධිත ප්‍රභේද නම් කරයි. 9.3 ඒ ඒ තද්ධිත ප්‍රභේදයට නිදසුන බැගින් සපයයි.	9.0 • තද්ධිත හැඳින්වීම • තද්ධිත ප්‍රභේද • තද්ධිත සඳහා නිදර්ශන සැපයීම • තද්ධිත ප්‍රයෝජන	9.0 • තද්ධිත හඳුන්වයි. • තද්ධිතවල ප්‍රයෝජන මොනවා දැයි පෙන්වා දෙයි. • තද්ධිත ප්‍රභේද ලියයි. • ඒ ඒ තද්ධිත ප්‍රභේදයට නිදසුන බැගින් සපයයි.	06

3 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
10.0 පාලි භාෂාවේ කිතක හඳුනාගෙන භාවිත කරයි.	10.0 10.1 කිතක කෙටියෙන් හඳුන්වයි. 10.2 කිතක ප්‍රභේද නම් කරයි. 10.3කිතක ප්‍රභේදවලට නිදසුන් සපයයි.	10.0 • කිතක හැඳින්වීම • කිතක ප්‍රභේද නම් කිරීම • ඒ ඒ ප්‍රභේදයට නිදර්ශන සැපයීම	10.0 • කිතක හඳුන්වා දෙයි. • තද්ධිත හා කිතක අතර වෙනස පෙන්වා දෙයි. • ඒ ඒ කිතක ප්‍රභේදයට නිදසුන් සපයයි.	06

11.0 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය සඳහා කියවයි.	11.0
	11.1අනිත්ථිගන්ධකුමාරවත්‍ථු මාධ්‍ය භාෂාවට නගයි.
	11.2අඤ්ඤතරබ්‍රාහ්මණවත්‍ථු මාධ්‍ය භාෂාවට නගයි.
	11.3පඤ්චසතදාරකවත්‍ථු මාධ්‍ය භාෂාවට නගයි.
		11.0
		• ධම්මපදට්ඨකථා පියවග්ග
		  • අනිත්ථිගන්ධකුමාරවත්‍ථු
		  • අඤ්ඤතරබ්‍රාහ්මණ වත්‍ථු
		  • පඤ්චසතදාරකවත්‍ථු
			11.0
			• නිර්දිෂ්ට කථාවලට පදානුපදික අර්ථ ලියයි.
			• නිර්දිෂ්ට කථා මාධ්‍ය භාෂාවෙන් ලියයි.
			• නිර්දිෂ්ට කථා සාරය මතකයෙන් කියයි.
			• නිර්දිෂ්ට කථාවල ජීවනාදර්ශ පෙන්වා දෙයි.
				30

නිර්දිෂ්ට ග්‍රන්ථ හා පරිශීලනීය ග්‍රන්ථ

- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- චතුභාණවාර පාළි
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි ව්‍යාකරණය හා රචනා
- පාලි රචනා 1 - බද්දේගම විමලවංස හිමි
- පාලි භාෂාවතරණය 1 සහ 11
- පාලි පාඨ මඤ්ජරී 1 සහ 11
- පාලි කථාමඤ්ජුසා
- ධම්මපදය
- කච්චායන ධාතු මඤ්ජුසාව
- අභිදානප්පදීපිකාව
- පාලි රචනා 1 සහ 11
- බාලාවතාරදීපනී
- පාලි සාහිත්‍යය
- උදාන පාළි
- ධම්මපදට්ඨ කතා
- අපදාන පාළි
- මහා වංසය
- පාලි පාඨාවලී
- පාලි භාෂාව පිරිවෙන් පෙළපොත්
- පාලි පාඨ මඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය

පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් මෙන් ම ආගමික භාෂාවක් ද වශයෙන් පාලි භාෂාව ශ්‍රී ලංකාවේත්, ලොව විවිධ රටවලත්, පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම සහ භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාව ගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් පාලි භාෂාවෙන් ලබා ගත හැකි ය.

දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පිරිවෙන් තුළත්, ඉන් බැහැර වත්, විවිධ වැඩසටහන් සංවිධාන කළ යුතු යි. පිරිවෙන් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පිරිවෙනෙහි පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය විය යුතු ව ඇත. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

01. පාලි භාෂා දින සුවිශේෂ වැඩ සටහන් සංවිධානය කිරීම
02. කණ්ඩායම් සංවාද හා කෙටි නාට්‍ය නිර්මාණය
03. ගාථා හා සූත්‍ර ගායනා තරග සංවිධානය කිරීම
04. පාලි කථික තරග සංවිධානය කිරීම
05. බිත්ති පුවත්පතක් ක්‍රියාත්මක කිරීම
06. රාජ්‍ය ආයතන, පාසල් ආදියේ භාවිත උපදෙස් පාඨ රැස් කිරීම
07. පාලි භාෂා සාහිත්‍යය පිළිබඳ ගවේෂණාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම
08. පාලි සමිතියක් ක්‍රියාත්මක කිරීම

ඇගැයීම් හා තක්සේරු කාර්යය

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ පිරිවෙන්වලට ද අදාළ ය. ඒ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයේ දී ශිෂ්‍යයා අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලවල ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනා ගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කර ගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැයි පරීක්ෂා කළ යුතු ය. ඒ අනුව ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතු ය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩපිළිවෙළ යනු ශිෂ්‍යයා ගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කර ගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන් ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

පාලි භාෂාව පිළිබඳ මූලික පිරිවෙන් අවසාන නව විෂය නිර්දේශය සකස් කොට ඇත්තේ නිපුණතා පාදක කර ගෙනය. නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රමුඛ ස්ථානයක් ගනී. අද වන විට විශේෂයෙන් පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් වී ඇත්තේ දේශන ක්‍රමය කේන්ද්‍ර කර ගත් සම්ප්‍රේෂණ භූමිකාවක ගුරුවරයා සිටින ආකාරයෙනි. එහෙත් නව නිපුණතා පාදක අධ්‍යාපනයේ දී පැරණි සම්ප්‍රේෂණ භූමිකාව හැරදමා ගුරුවරයා සිසුන් ගවේෂණයට යොමු කරන මාර්ගෝපදේශකයෙකු විය යුතු ය. මෙහි දී පාලි භාෂාවේ සුවිශේෂ අධ්‍යාපන ක්‍රම හා නවීන ක්‍රම ශිල්ප කිහිපයක් යොදාගත හැකි ආකාරය පිළිබඳ කෙටියෙන් සඳහන් කරමු.

බුදුරජාණන් වහන්සේ මාර්ග දර්ශකයාණෝ ය. ගුරුවරයා විසින් පාලි භාෂාව ඉගැන්වීමේ දී බුදුරදුන් අනුගමනය කළ ක්‍රමවේදය උපයෝග කර ගැනීම වඩාත් සුදුසු ය. එබැවින් නූතන ගුරුවරයා මනෝ මූලික හා විෂය මූලික සාධක ඔස්සේ පූර්ව විනිශ්චවලට නොඑළඹ ශිෂ්‍යයා ගවේෂකයෙකු හා නවෝත්පාදකයෙකු කිරීමට මාර්ගෝපදේශ සැපයීම මැනවි.

1 ක්‍රමය

'සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්‍ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං' (මහාවග්ගපාළි)

ආදිකල්‍යාණං	-	පාඩමක ආරම්භය ශිෂ්‍යයා පොළඹවන, සිත්ගන්නාසුලු චමත්කාරජනක අත්දැකීම් ඇසුරින් ඉදිරිපත් විය යුතු ය.
මජ්ඣෙ කල්‍යාණං	-	පාඩමෙහි මැද සාරවත් කරුණු අන්තර්ගත විය යුතුවා සේම පැහැදිලි හා නිරවුල් ද විය යුතු ය. තව දුරටත් ශිෂ්‍යයා මාතෘකාවට පොළඹවන, ගවේෂකයෙකු කරවන ක්‍රියාවලියක් විය යුතු ය.
පරියොසානකල්‍යාණං	-	පාඩමේ අවසානය ශිෂ්‍යයා ප්‍රාප්ති මට්ටමකට පමුණුවා ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් ඇති කිරීමට සමත් විය යුතු ය.
සාත්ථං	-	පාඩම සරල සුගම හා අර්ථවත් කරුණුවලින් සමන්විත විය යුතු ය.
සබ්‍යඤ්ජනං	-	යොදා ගන්නා වාග්මාලාව අරුත් ප්‍රකට කරවන අදහස් නිවැරදිව සන්නිවේදනය කරවන්නක් විය යුතු ය.
පරිසුද්ධං	-	පාඩම අසභ්‍ය හා ග්‍රාම්‍ය ව්‍යවහාරයෙන් තොර විය යුතුය.
කේවලපරිපුණ්ණං	-	පාඩම ඌණතාවලින් තොරව භාෂණය, ලේඛනය, චින්තනය, චරිතායනය කර ගැනීමට හැකිවන අංගයන්ගෙන් සමුපලක්ෂිත විය යුතු ය.

මෙම ලක්ෂණවලින් යුතුව පාඩමක් මෙහෙයවීමෙන් ශිෂ්‍යයා නිපුණතාවට ළංවන අතර ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් ද ඇති කළ හැකි ය.

2 ක්‍රමය

ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානිකම්මං (සච්චවිභංග සුත්ත - මජ්ඣිමනිකාය)

ආචික්ඛනා	-	පාඩමට අදාළව අපේක්ෂිත කරුණු කෙටියෙන් කීම
දෙසනා	-	උචිත භාෂාව යොදා ගනිමින් කෙටියෙන් කී කරුණු ගුරුවරයා කෙරෙහි ප්‍රාමාණික විශ්වාසයක් ඇති වන පරිදි ධර්මානුකූලව විස්තර කිරීම
පඤ්ඤපනා	-	ශිෂ්‍යයාගේ බුද්ධියට හා ප්‍රඥාවට යෝග්‍ය ලෙස කරුණු පෙළ ගැස්වීම
පට්ඨපනා	-	අපේක්ෂිත අරමුණෙහි ශිෂ්‍යයා පිහිටුවීම
විවරණා	-	වසා තිබූවක් විවෘත කරන්නාක් සේ හේතුඵලවාදී ව කරුණු විවරණය කිරීම
විභජනා	-	කරුණු විශ්ලේෂණය කොට කුඩා අනුකුඩා කොටස්වලට බෙදා විග්‍රහ කිරීම
උත්තානිකම්මං	-	සංයුක්ත සංකල්ප නිදසුන් වශයෙන් ගෙනහැර දක්වමින් ශ්‍රාවක බුද්ධියට ගෝචරවන ලෙස මතුකර දැක්වීම හා ශිෂ්‍යයා ගැටලුවෙන් නිදහස් කිරීම

3 ක්‍රමය

ශිෂ්‍යයාගේ අවබෝධය දියුණු කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමය අනුපූර්ව ප්‍රතිපදාවයි.

ශිෂ්‍යයාට අලුත් අත්දැකීම් ලබා දෙන විට එය ඔහුගේ අතීත අත්දැකීම්වලට සම්බන්ධ දෙයක්වීම වැදගත් වේ. ශිෂ්‍යයා ආස්වාදිත දෙයෙහි සිට නොදන්නා සත්‍යය කරා යොමු කරවීම මෙම අධ්‍යාපන ක්‍රමයේ පිළිවෙළයි.

සද්ධාජාතො උපසංකමති -	ශ්‍රද්ධාව ඇතිකර ගැනීමයි. එසේ ගුරුවරයා කෙරේ ශිෂ්‍යයාගේ විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරුවරයා වෙත එළඹෙයි.
පයිරුපාසති -	විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරු ඇසුර ලැබීමට ප්‍රිය කරයි.
සොතං ඔදහති -	පාඩමට සාවධාන ව හා අවික්ෂිප්ත ව ඇහුම්කන් දෙයි.
සුත්වා ධාරෙති -	ඇසූ පාඩම සිතේ දරා ගනියි.
අත්ථං උපපරික්ඛති -	දරාගත් කරුණුවල අර්ථය නුවණින් පරීක්ෂා කර බලයි.
ධම්මා නිජ්ඣානං ඛමන්ති -	කරුණු නුවණින් සලකා බලා වටහා ගනියි.
ඡන්දො ජායති -	කරුණු වටහා ගැනීම නිසා ගුරුවරයාගේ පාඩමට රුචියක් ඇති වෙයි.
උස්සහති -	පාඩමේ කරුණුවල ප්‍රාප්ති මට්ටමට ළඟාවීමට උත්සාහ කරයි.
තුලෙති -	වෙනත් කරුණු හා තුලනය කර බලයි.
පදහති -	සංසන්දනය කොට නිපුණතා මට්ටමට යාමට වීර්ය කරයි.
සච්චං සච්ඡිකරොති -	සත්‍ය වූ තත්ත්වය අවබෝධ සාක්ෂාත් කර ගනියි.
පඤ්ඤාය ච නං පටිවිජ්ඣ පස්සති -	නුවණින් ද එය විනිවිද දකී. (කීටාගිරි සුත්ත - මජ්ඣිමනිකාය)

සරල අවස්ථාවේ සිට අනුක්‍රමයෙන් ගැඹුරට යන ආකාරයේ පිළිවෙළක් මෙහි දක්නට ඇත. පාලි භාෂාව විෂයෙහි ශිෂ්‍ය නිපුණතාව ඇති කිරීමේ දී මෙම ඉගැන්වීම් ක්‍රම උපයෝග කර ගත හැකි ය. මෙබඳු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම රාශියක් පාලි සාහිත්‍යයේ අඩංගු ය.

පාලි භාෂාවේ නව විෂය නිර්දේශය ඉගැන්වීමට සරල සුගම ක්‍රමවේදයක් මෙහිලා දක්වමු. (ආශ්‍රය - පාලි භාෂාව 9 - 10 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1984)

i. පියවර - නිර්දිෂ්ට පාලි පාඨ හා ඡේද උස් හඬින් ගුරුවරයා විසින් කියවීම, පාලි විෂයේ ආරම්භක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එම භාෂාව කනට හුරු කරවීම මෙයින් අපේක්ෂා කෙරේ. පාලි භාෂා ව්‍යවහාරය දරුවන්ගේ ඇසට, කනට හුරු කරවීමට මෙම ක්‍රමය යෝග්‍ය වේ.

ii. පියවර - අනතුරුව ගුරුවරයා විසින් කළ යුත්තේ එකී කොටස අර්ථවත් ලෙස භාවාර්ථ පැහැදිලි වන පරිදි ඉදිරිපත් කිරීමයි. එමඟින් පාලි භාෂා ව්‍යවහාරය හා රීතිය ශිෂ්‍යයාගේ ඉන්ද්‍රියයන්ට හුරුවනු ඇත.

iii. පියවර - කාලවේලාව අනුව පාලි උද්ධෘතය ශිෂ්‍යයන් ලවා සාමූහික ව හෝ වෙන් වෙන් වශයෙන් හෝ නිවැරදි උච්චාරණය සහිත ව කියවීම ප්‍රයොජනවත් ය.

iv. පියවර - පාලි උද්ධෘතයන්හි අර්ථය අවබෝධ කර ගැනීමට ගුරුවරයා සිසුන්ට උදව් කළ යුතු ය.

v. පියවර - උද්ධෘත ඡේදවල වාක්‍ය හා වාක්‍යාංශ හුණුපුවරුවේ ලියා එම යෙදුම් රටාව ශිෂ්‍යයාට පැහැදිලි කළ යුතු ය.

vi. පියවර - උද්ධෘත ඡේදවල ඇතුළත් පද හා වාක්‍යවල ව්‍යාකරණ ලක්ෂණ පැහැදිලි කළ යුතු ය. මෙය සරල ක්‍රමවේදවලින් පටන් ගෙන සංකීර්ණ ක්‍රම දක්වා වැඩි කිරීම සුදුසු ය.

vii. පියවර - වැදගත් ගාථා හා ඡේද වනපොත් කිරීමේ අවශ්‍යතාව ශිෂ්‍යයන්ට ඒත්තු ගැන්වීම අවශ්‍ය වෙයි.

මෙම ක්‍රමවේදය අනුගමනය කිරීම මගින් ශිෂ්‍යයන් අපේක්ෂිත නිපුණතා මට්ටමට ළඟාවනු ඇත. සිසුන් කරුණු හා තොරතුරු ගවේෂණයට යොමු කළ යුතු ය. ගවේෂිත කරුණු අධීක්ෂණය ගුරුවරයා විසින් කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පන්ති කාමරයට පමණක් සීමා නොකොට බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ද යොමු කිරීම ගුරුවරයාගේ යුතුකමකි. සිසු දරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ නිරතුරු අවධානයෙන් සිටීමෙන් ඇගයීම හා තක්සේරුව ද විනිවිදභාවයකින් යුතුව කිරීමට ගුරුවරයාට ඉඩකඩ සැලසේ. මෙම නව විෂයමාලා සංශෝධනයේ අපේක්ෂාව ගුරුවරයාත් ශිෂ්‍යයාත් අතර වූ සම්ප්‍රේෂණ අධ්‍යාපන ක්‍රමය සංවර්ධනය කර ක්‍රියාකාරී ගවේෂණාත්මක අධ්‍යාපන ක්‍රමවේදයකට යොමු කිරීම හා එමගින් සිසුන්ගේ නිපුණතාව ඉහළ නංවා සමාජයට රටට යෝග්‍ය පුරවැසියන් බිහි කිරීමයි.

පාඩම 1 - අක්‍ෂරමාලාව - 1

නිපුණතාව : 1.0 පාලි අක්‍ෂර මාලාව ප්‍රභේදගත කර භාවිත කරයි.

නිපුණතා මට්ටම : 1.1 පාලි අක්‍ෂර මාලාව පිළිවෙළින් ලියා ප්‍රභේද දක්වයි.

කාලච්ඡේද : 06 යි.

ඉගෙනුම් පල :

- පාලි අක්‍ෂර මාලාව නිවැරදි ව පිළිවෙළින් ලියා දක්වයි.
- අල්පප්‍රාණ හා මහාප්‍රාණ නො බිඳ පාලි අක්‍ෂර මාලාව නිවැරදි ව කියවයි.
- ව්‍යඤ්ජන ප්‍රභේද ලියා දක්වයි.
- ඒ ඒ ව්‍යඤ්ජන ප්‍රභේදය හඳුන්වා ඊට අයත් අක්‍ෂර ලියයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :

- ඇමුණුම අංක 01 හි පාලි අක්‍ෂර මාලාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- පාලි අක්‍ෂර මාලාව මතකයෙන් කීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පාලි අක්‍ෂර මාලාව ශබ්ද ධ්වනි සහිත ව නිවැරදි ව සිසුන් සමග උච්චාරණය කරන්න.
- පෙර දැනුම භාවිත කරමින් පුවරුව දෙස නො බලා මතකයෙන් අක්ෂර මාලාව කීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පාලි භාෂාව ඉගෙනීමේ දී අක්ෂර මාලාව නිවැරදි ව දැන සිටීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1

- පාලි අක්ෂර මාලාව පිළිබඳ පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පාලි භාෂාවෙහි අක්‍ෂර 41ක් ඇති බව
  - එහි ස්වර අටක් හා ව්‍යඤ්ජන 33ක් ඇති බව
  - අක්‍ෂර ශබ්ද කිරීමේ දී අල්පප්‍රාණ හා මහාප්‍රාණ ශබ්ද ධ්වනි රටාවල වෙනසක් ඇති බව
  - අල්පප්‍රාණාක්‍ෂර සිථිලාක්‍ෂර ලෙසත්, මහාප්‍රාණාක්‍ෂර ධනිතාක්‍ෂර ලෙසත් හඳුන්වන බව
  - අඩු ආයාසයකින් උච්චාරණය කළ යුතු අකුරු අල්පප්‍රාණ වන බව
  - වැඩි ආයාසයකින් උච්චාරණය කළ යුතු අකුරු මහාප්‍රාණ වන බව
  - අල්පප්‍රාණාක්‍ෂර 10ක් හා මහාප්‍රාණාක්‍ෂර 10ක් ඇති බව
  - වර්ගයන්ගේ පළමු වන හා තෙවන අකුරු අල්පප්‍රාණ වන බව
  - වර්ගයන්ගේ දෙවන හා සිවුවන අකුරු මහාප්‍රාණ වන බව

පියවර 2

- ඇමුණුම අංක 01 හි දැක්වෙන ව්‍යඤ්ජන ප්‍රභේද හුණු පුවරුවේ ලියන්න.
- වර්ගාක්ෂර, වර්ගාන්තාක්ෂර, ඝෝෂාක්ෂර, අඝෝෂාක්ෂර හා අන්තඃස්ථාක්ෂර යනුවෙන් ව්‍යඤ්ජන ප්‍රභේද වර්ග කෙරෙන ආකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පෙළ පොතේ අදාළ පාඩම වෙත අවධානය යොමු කරමින් ස්වර අක්ෂර ව්‍යඤ්ජන ප්‍රභේද යටතේ එන අක්ෂර ලැයිස්තුගත කරවන්න.
- ගුරුවරයා යම් අක්ෂරයක් ප්‍රකාශ කළ විට එම අක්ෂරය ස්වරයක් ද ව්‍යඤ්ජනයක් ද යන බව හා එය අයත් ප්‍රභේදය දැක්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 2 හි අභ්‍යාස කරවන්න.

මූලික වදන් සංකල්ප

- අක්ෂර :- භාෂාවක් ලිවීම සඳහා යොදා ගන්නා සංකේත සමූහයට අක්ෂර යැයි කියනු ලැබේ.
- වර්ගාක්ෂර :- **ක** සිට **ම** තෙක් ඇති අක්ෂර 25 වර්ගාක්ෂර වේ. මෙම අක්ෂර උත්පත්ති ස්ථාන මනාව ස්පර්ශ කරමින් උපදී.
- වර්ගාන්තාක්ෂර :- **ක, ච, ට, ත, ප** යන වර්ගයන්ගේ අවසාන අක්ෂර පහ වර්ගාන්තාක්ෂර වේ.
- ඝෝෂාක්ෂර :- වර්ගයන්ගේ **තෙවන, සිවුවන** හා **පස්වන** අකුරුත් **ය, ර, ල, ව** යන අන්තඃස්ථාක්ෂරත් **හ, ළ** යන අක්ෂරත් ඝෝෂාක්ෂර යි. වැඩි ශබ්දයක් සහිත ව මෙම අක්ෂර උච්චාරණය වේ.
- අඝෝෂාක්ෂර :- වර්ගයන්ගේ **දෙවන, තෙවන** අකුරුත් **ස** කාරයත් යන අක්ෂර 11 අඝෝෂාක්ෂර යි. මෙම අක්ෂර අඩු ශබ්දයක් සහිත ව උච්චාරණය වේ.

ඇගයීම හා තක්සේරුකරණය :

- පාලි අක්ෂර මාලාව මතකයෙන් ප්‍රකාශ කිරීම සහ ලිවීම
- පාලි අක්ෂර මාලාවේ ස්වර හා ව්‍යඤ්ජන වෙන් කර පෙන්වීම
- අල්පප්‍රාණ හා මහාප්‍රාණ නිවැරදි ව උච්චාරණය කිරීම
- ව්‍යඤ්ජන ප්‍රභේදවලට අයත් අක්ෂර ප්‍රකාශ කිරීම හා ලිවීම

ගුණාත්මක යෙදැවුම් :

- ඇමුණුම අංක 01 සහ 02
- පෙළපොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය පළමු වන පොත
- පාලි රචනා 01, 02
- පාලි කථාමඤ්ජූසා
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

පාලි අක්ෂර මාලාව

ස්වර 08

අ ආ ඉ ඊ උ ඌ එ ඔ

ව්‍යඤ්ජන 33

වර්ගාක්ෂර

ක	ඛ	ග	ඝ
ච	ඡ	ජ	ඣ
ට	ඨ	ඩ	ඪ
ත	ථ	ද	ධ
ප	ඵ	බ	භ

වර්ගාන්තාක්ෂර

ඞ ඤ ණ න ම

අවර්ගාක්ෂර

ය	ර	ල	ව
	ස	හ	ළ

නිග්ගහීතය

අං

ඇමුණුම 02

1. පහත සඳහන් වචනවල ඝෝෂාක්ෂර වෙන් කරන්න.
   ඨානං, භජසි, දාපෙසි, ඛාදනීය, භොජනීය
2. පහත සඳහන් වචනවල අඝෝෂාක්ෂර වෙන් කරන්න.
   ලතා, ඉසි, කලෙබර, තාපසානං, ආගතකාලෙ
3. පහත සඳහන් වචනවල අන්තඃස්ථාක්ෂර වෙන් කරන්න.
   මිලාතා, රාජමහා විහාරෙ, භොජනීයං, අනාගතකාලෙ, අනුරාධපුරෙ
4. පහත සඳහන් වචනවල අල්පප්‍රාණාක්ෂර වෙන් කරන්න.
   පානීයං, සහායකා, සන්තිකෙ, මහානිදාඝො, පිපාසිතා
5. පහත සඳහන් වචනවල මහාප්‍රාණාක්ෂර වෙන් කරන්න.
   ගච්ඡාමි, පුප්ඵං, පාඨාලයං, භූමිං, අධොමුඛො

පාඩම 2 - අක්‍ෂරමාලාව - 11

නිපුණතාව : 1.0 පාලි අක්‍ෂර මාලාව ප්‍රභේදගත කර භාවිත කරයි.

නිපුණතා මට්ටම : 1.2 පාලි පද අකාරාදි පිළිවෙළට සකස් කරයි.

කාලච්ඡේද : 04 යි.

ඉගෙනුම් පල :

- පාලි වචන අකාරාදි පිළිවෙළට ලියයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :

- සිසුන්ට පාලි අකාරාදියක් සපයන්න.
- එහි වචන පෙළ ගස්වා ඇති පිළිවෙළ පිළිබඳ කරුණු විමසන්න.
- එම පිළිවෙළ තුළ විද්‍යාත්මක පදනමක් ඇති බව පෙන්වන්න.
- පාලි වචනය බැගින් ලියූ කඩදාසි කැබලි සිසුන්ට ලබා දෙන්න.
- එම වචන අනුපිළිවෙළට පුවරුවක/බ්‍රිස්ටල් බෝඩ් එකක අලවා සකස් කරවන්න.
- අකාරාදි පිළිවෙළ යන්න හඳුන්වන්න.

පාඩම සංවර්ධනය :

පියවර 01

- වචන අක්‍ෂර මාලාවේ අනුපිළිවෙළට ගොනු කිරීම අකාරාදි පිළිවෙළ වන බව පාලි අකාරාදියේ අනුපිළිවෙළ පෙන්වමින් තහවුරු කරන්න.
- වචන අනුපිළිවෙළට සකස් කරන විට පහත කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතු බව සාකච්ඡා කරන්න.
  - අක්ෂර මාලාවේ අනුපිළිවෙළට වචන ලිවිය යුතු බව
  - එක ම ස්වරයකින් පටන් ගන්නා වචන ඇති විට දෙවන අකුර පිළිබඳ සැලකිලිමත් විය යුතු බව
  - එක ම ව්‍යඤ්ජනයකින් පටන් ගන්නා වචන ඇති කල්හි ව්‍යඤ්ජනාරූඪ ස්වරය ගැන සැලකිලිමත් විය යුතු බව
  - පළමුවන අක්ෂරයේ ව්‍යඤ්ජනය හා ස්වරය සමාන වන විට අනතුරුව දෙවන අක්ෂරයේ ව්‍යඤ්ජනය ගැන සැලකිලිමත් විය යුතු බව
  - පළමුවන හා දෙවන අක්ෂරයෙහි ව්‍යඤ්ජනය හා ස්වරය සමාන වන විට පිළිවෙළින් තෙවන, සිවුවන අකුරු සලකා අකාරාදි පිළිවෙළ සැකසිය යුතු බව
  - සංයුත්තාක්‍ෂරයක් ඇත්නම් පළමු ව හල් අකුර ද දෙවනුව ඊට පසුව ඇති ව්‍යඤ්ජනය හා ස්වරය ගැන සැලකිලිමත් විය යුතු බව

පියවර 02

- පහත වචන අකාරාදි පිළිවෙළට හුණු පුවරුවේ ලිවීමට සිසුන් මෙහෙයවන්න.
  අගත, අජ, මාලා, මාතා, වානරො, වරාහො, දෙවො, තාපසො, කුක්කුටො, කක්කටකො, ඡත්තං, එලං, පිතා, තොයං
- ඒවා අකාරාදි පිළිවෙළ සම්බන්ධ නිර්ණායකවලට අනුගත වන ආකාරය පෙළ පොත ද යොදා ගනිමින් පෙන්වා දෙන්න.
- සිසුන් දන්නා වචන සමූහයක් ප්‍රකාශ කර ඒවා ද අකාරාදි පිළිවෙළට සකස් කරවන්න.

- ගුරුවරයා විසින් ප්‍රකාශ කරනු ලබන වචන අකාරාදියෙන් උපුටා දැක්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදා අකාරාදි ග්‍රන්ථ දෙකක් ලබා දී එක් කණ්ඩායමකින් ඉදිරිපත් කරන වචනය අනෙක් කණ්ඩායම විසින් කිසියම් කාලයක් තුළ සොයා පෙන්වීමේ තරගයක් පවත්වන්න.
- ඇමුණුම 01 හි අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

මූලික වදන් සංකල්ප :

- අකාරාදි පිළිවෙළ :- අක්‍ෂර මාලාවේ, අකාරයේ පටන් ඇති අක්‍ෂරවල අනුපිළිවෙළකට වචන ලියා දැක්වීම අකාරාදි පිළිවෙළ නම් වේ.

තක්සේරුව හා ඇගයීම :

- අකාරාදි පිළිවෙළ යන්න පැහැදිලි කිරීම
- දෙනු ලබන වචන අකාරාදි පිළිවෙළට පෙළ ගැස්වීම
- දෙනු ලබන වචන අකාරාදියෙන් උපුටා දැක්වීම

ගුණාත්මක යෙදැවුම් :

- ඇඅමුණුම 01
- පාලි අකාරාදිය (පාලි සිංහල ශබ්දකෝශය) පිටපත් 02
- පාලි වචන ලියූ කඩදාසි කැබලි
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය පළමු වන පොත
- පාලි රචනා 01, 02
- පාලි කථාමඤ්ජූසා
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 1

01. පහත සඳහන් පද යොදා අකාරාදියක් පිළියෙල කරන්න.

එවං	මෙ	සුතං
එකං	සමයං	භගවා
සාවත්ථියං	විහරති	ජෙතවනෙ
අනාථපිණ්ඩිකස්ස	ආරාමෙ	තෙන
සමයෙන	ආයස්මා	ගිරිමානන්දො
ආබාධිකො	හොති	දුක්ඛිතො
ආනන්දො	තෙනුපසඞ්කමි	භගවන්තං
අභිවාදෙත්වා	එකමන්තං	උපසඞ්කමිත්වා
නිසීදි	නිසින්නො	එතදවොච

සාධු	භන්තෙ	අනුකම්පං
උපාදායාති	සචෙ	භික්ඛුනො
දසසඤ්ඤා	භාසෙය්‍යාසි	ඨානං
විජ්ජති	සුත්වා	ඨානසො
පටිප්පස්සම්භෙය්‍ය	කතමා	අනිච්චසඤ්ඤා
අනත්තසඤ්ඤා	අසුභසඤ්ඤා	පහානසඤ්ඤා
ආදීනවසඤ්ඤා	විරාගසඤ්ඤා	නිරොධසඤ්ඤා
සබ්බලොකෙ	අනභිරතසඤ්ඤා	ආනාපානසති
සබ්බසඞ්ඛාරෙසු	අරඤ්ඤගතො	රුක්ඛමූලගතො
පටිසඤ්චික්ඛති	සුඤ්ඤාගාරගතො	රූපං
අනිච්චං	වෙදනා	සඤ්ඤා
සඞ්ඛාරා	විඤ්ඤාණං	ඉමෙසු
අනිච්චානුපස්සී	අනත්තා	සොතං
සද්දා	අනත්ත	ඝානං
ගන්ධා	ජිව්හා	රසා
කායො	ඵොට්ඨබ්බා	මනො
ධම්මා	කෙසා	ලොමා
නඛා	දන්තා	තචො
මංසං	නහාරු	අට්ඨී
අට්ඨීමිඤ්ජා	වක්කං	හදයං
යකනං	කිලොමකං	පිහකං
පප්ඵාසං	අන්තං	අන්තගුණං
උදරියං	කරීසං	පිත්තං
සෙම්හං	පුබ්බො	ලොහිතං
සෙදො	මෙදො	අස්සු
වසා	ඛෙළො	සිඞ්ඝානිකා
ලසිකා	මුත්තං	මත්ථලුඞ්ගං

පාඩම 3 - නාම වරනැඟීම - 1

නිපුණතාව : 2.0 පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි.

නිපුණතා මට්ටම : 2.1 සත්ථු, පිතු හා මාතු ශබ්ද වරනගා සමවිෂමතා පෙන්වා දෙයි.

කාලච්ඡේද : 03 යි.

ඉගෙනුම් පල :
- නිර්දිෂ්ට ශබ්ද වරනගා ලියයි.
- ඒ ඒ පදවල විභක්තිය හා වචනය ලියා අර්ථ ගන්වයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :
- මීට පෙර උගත් ශබ්දයක පුල්ලිංග, ස්ත්‍රීලිංග, නපුංසකලිංග භේදය පිළිබඳ සාකච්ඡා කරන්න.
- උකාරාන්ත ශබ්ද කිහිපයක් හුණු පුවරුවේ ලියා ශබ්දාන්තය ප්‍රකට වන සේ සිසුන් සමග එක්ව උස් හඬින් උච්චාරණය කරන්න.
- එම ශබ්දවල පුල්ලිංග, ස්ත්‍රීලිංග, නපුංසකලිංග භේදය පෙන්වා දෙන්න.
- එවැනි වෙනත් නිදසුන් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- භාෂාවක ශබ්ද වරනැඟීම් නිවැරදි ව දැන සිටීමේ වැදගත්කම පෙන්වා දෙමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1
- උකාරාන්ත නපුංසකලිංග, පුල්ලිංග සහ ස්ත්‍රීලිංග ශබ්දවලට නිදසුන් වශයෙන් පිළිවෙළින් සත්‍ථු, පිතු සහ මාතු යන පද හඳුන්වා දෙන්න.
- සිසු පෙර දැනුම විමසමින් පාලි විභක්ති නවය පුවරුවේ ලියා ඒ ඒ විභක්තියේ අර්ථ සාකච්ඡා කරන්න.
- උකාරාන්ත නපුංසකලිංග සත්‍ථු ශබ්දය ඒ ඒ අර්ථ ඉදිරියෙන් ඒකවචන බහුවචන දෙකෙහි වරනගා සිසුන් සමග කියවන්න.
- පෙළ පොතේ ඇති වරනැඟීම කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- සත්‍ථු ශබ්දයට අර්ථ ගන්වන්න.
- සත්‍ථු ශබ්දය වරනැගූ ස්ථානයේ ම පුල්ලිංග පිතු ශබ්දය වරනගා අර්ථ ගන්වන්න.
- අනතුරු ව පිතු ශබ්දය ලියූ තැන මාතු ශබ්දය ලියා අර්ථ ගන්වා සිසුන් සමග කියවන්න.
- සත්‍ථු, පිතු, මාතු ශබ්ද ඒ ඒ විභක්තියෙහි වරනගා අර්ථ ගන්වන්න.
- සත්‍ථු, පිතු, මාතු යන ශබ්ද උකාරාන්ත සාමාන්‍ය ශබ්දයකින් වෙනස් වූ විශේෂ උකාරාන්ත ශබ්ද ලෙස වරනැගෙන බව පෙළ පොත ඇසුරෙන් පැහැදිලි කරන්න.
- ගුරුවරයා විසින් ඉදිරිපත් කරනු ලබන කිසියම් පදයක විභක්තිය, වචනය ප්‍රකාශ කිරීමට හැකි දැයි විමසා බලන්න.
- සත්‍ථු, පිතු, මාතු ශබ්ද වාචෝද්ගත කරවා වගුගත කොට මතකයෙන් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- නියමිත ශබ්දවලට වඩා වෙනස් ව වරනැගෙන උකාරාන්ත ශබ්ද පෙළ පොතෙන් සොයා ලැයිස්තුවක් සැකසීමට සිසුන් යොමු කරන්න.
- නියමිත ශබ්දවලට සමාන එවැනි ශබ්ද විභක්තියක වරනගා අර්ථ ගැන්වීමට සිසුන් යොමු කරන්න.
- ඇමුණුම 01 අභ්‍යාසයේ සිසුන් නිරත කරවන්න.

ඇගයීම හා තක්සේරුකරණය :

- පාලි විභක්ති 9 හා එම විභක්ත්‍යර්ථ මතකයෙන් ලිවීම
- උකාරාන්ත ශබ්ද මතකයෙන් වගුගත කොට ලිවීම හා අර්ථ ගැන්වීම
- ඒකවචනය පැවසූ විට බහුවචනයත්, බහුවචනය පැවසූ විට ඒකවචනයත් ලියා අර්ථ ගැන්වීම
- ඒ ඒ උකාරාන්ත ශබ්දවල සමවිෂමතා ලියා දැක්වීම
- විශේෂ උකාරාන්ත ශබ්ද උකාරාන්ත ගුරු ශබ්දය හා සසඳමින් වරනගා දැක්වීම
- උකාරාන්ත ශබ්දයන්ගේ පදවල විභක්තියත් වචනයත් අර්ථයත් නිවැරදි ව ප්‍රකාශ කිරීම
- අදාළ පාඩමේ අභ්‍යාස කිරීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- පාලි භාෂාව තරණය පළමුවන පොත
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

1. පහත සඳහන් පදවල විභක්තිය හා වචනය දක්වන්න.

පදය	විභක්තිය	වචනය
භික්ඛවෙ		
ජන්තුනං		
සත්‍ථාරෙ		
නත්තාරා		
පිතු		
ජෙතාරා		
හත්තුනො		
සොතාරෙහි		
කත්තරි		

පදය	විභක්තිය	වචනය
මාතු		
පිතානං		
භාතරං		
භික්ඛුනා		
ජන්තවො		
සත්‍ථාරො		
නත්තු		
භික්ඛුනො		
මාතරෙ		
ජන්තුයො		
සත්‍ථු		
නත්තාරො		
භිකඛූනං		
මාතරො		
ජන්තුනො		
සත්‍ථුස්ස		
නත්තරි		
භාත		
පිතානං		
මාතුහි		
කත්තුනො		

2. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.
   i. සත්‍ථා මනුස්සානං ධම්මං දෙසෙති.
   ii. අම්හාකං භාතරො නත්තාරා සද්ධිං නගරං ගච්ඡති.
   iii. ජෙතා දාතාරං බාහුනා පහරති.
   iv. සුසවො ගරුනා සහ භික්ඛුං වන්‍දති.
   v. භික්ඛවො සොතාරානං ච දාතුනං ච ධම්මං දෙසෙස්සන්ති.

පාඩම 4 - නාම වරනැගීම - 11

නිපුණතාව : 2.0 පාලි නාම පද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි.

නිපුණතා මට්ටම : 2.2 මන ශබ්දය නපුංසක ලිංගයේ වරනගා අර්ථ ගන්වයි.

කාලච්ඡේද : 02 යි.

ඉගෙනුම් පල :
- නිර්දිෂ්ට ශබ්ද වරනගා ලියා දක්වයි.
- ඒ ඒ පදවල විභක්තිය හා වචනය ලියා අර්ථ ගන්වයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :
- පහත සඳහන් මනොගණික ශබ්ද ඇතුළත් ගාථාව හුණු පුවරුවේ ලියා සිසුන් සමග සජ්ඣායනය කරන්න.

  'මනං සිරං උරං තෙජං
  රජං ඔජං වයං පයං
  යසං තපං වචං චෙතං
  එවමාදි මනොගණො'
- එහි ඇති **මන, සිර, උර, තෙජ, රජ, ඔජ,** වය, පය, **යස, තප, වච, චෙත** යන ශබ්ද ඉස්මතු කර පෙන්වන්න.
- මේවා **මනොගණික** ශබ්ද යන නමින් හැඳින්වෙන බව පැහැදිලි කර දෙන්න.
- එම නපුංසක ලිංග වචන පිළිබඳ සාකච්ඡා කරමින් පෙළ පොතේ ඇති 'මන' ශබ්දයේ වරනැගීම කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1
- **මන** ශබ්දය පුවරුවේ වගුගත කොට ලියා සිසුන් සමග කියවන්න.
- අකාරාන්ත ශබ්දයක් වුවත් චිත්ත ශබ්දයට වෙනස් ව වරනැගෙන බව පෙන්වා දෙන්න.
- මන ශබ්දය වාචෝද්ගත කරවා වගුගත කොට මතකයෙන් ලිවීමට සිසුන් යොමු කරන්න.
- ඒ ඒ පදවලට මාධ්‍ය භාෂාවෙන් අර්ථ සපයන්න.
- ඒ ඒ පදවලට අර්ථ ලියා දැක්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 01 හි ඇති මනොගණික ශබ්ද භාවිතයේ යෙදී ඇති තැන් පෙන්වා දෙමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඇමුණුම 02 අභ්‍යාසය කිරීමට සිසුන් යොමු කරන්න.

මූලික වදන් සංකල්ප :

පද - විභක්ති ප්‍රත්‍යයකින් අවසන් වන්නේ පද යි.
මනොගණික - මන, සිර, උර, තෙජ, රජ, ඔජ, වය, පය, යස, තප, වච, චෙත යනාදිය යි.

ඇගයීම හා තක්සේරුකරණය :
- මනොගණික ශබ්ද නම් කිරීම
- මන ශබ්දය සියලු විභක්තිවල මතකයෙන් වරනගා වගුගත කොට දැක්වීම
- එම ඒකවචන පදවලට බහුවචනත්, බහුවචන පදවලට ඒකවචනත් ලියා අර්ථ ගැන්වීම

- මන ශබ්දය චිත්ත ශබ්දය හා සමග සංසන්දනය කර වරනගා සමවිෂමතා පෙන්වා දීම
- මන ශබ්දය භාවිතයේ යෙදී ඇති අයුරු දැක්වීමට වැකි සොයා ලිවීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01 සහ 02
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

මනොගණික ශබ්ද භාවිතයේ යෙදී ඇති තැන්

- **මනො** පුබ්බඞ්ගමා ධම්මා
- **මනො** සෙට්ඨා **මනොමයා**
- **මනසා** චෙ පදුට්ඨෙන
- කායෙන වාචාය **මනසා**
- වාචානුරක්ඛී **මනසා**
- භාවනාය රතො **මනො**
- යෙනස්ස පලිතං **සිරො**
- පරිපක්කො **වයො** තස්ස
- **යසො** භොගසමප්පිතො
- **මනසා** සංවරො සාධු
- රක්ඛන්තා සීල**තෙජෙන**
- ධනවන්තො **යසස්සිනො**
- එවං **තෙජානුභාවෙන**
- සදා රක්ඛන්තු සීවලී
- උග්ග**තෙජො** මහාවීරො
- **තෙජසා** ජිනසාසනං
- සීවලීගුණ**තෙජෙන** පරිත්තං තං භණාමහෙ
- **සිරස්මිං** තෙ බුද්ධසෙට්ඨො
- අරහන්තානං ච **තෙජෙන**
- අනෙකා අන්තරායාපි විනස්සන්තු ච **තෙජසා**
- භොගං වුද්ධි ච **යසවා**

ඇමුණුම 02

1. **පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.**

   i. අසප්පුරිසො පදුට්ඨෙන මනසා භාසති කරොති ච.
   ii. භික්ඛු පසන්නෙන මනසා ධම්මං දෙසෙති.
   iii. බුද්ධතෙජෙන අන්තරායා විනස්සන්තු.
   iv. තස්ස වයො පරිපක්කො(මුහුකුරා ගියේ) හොති.
   v. සීලෙන සම්පන්නො යසො-භොගසමප්පිතො(භෝග සම්පත් ඇති) සබ්බත්ථ පූජිතො හොති.

පාඩම 5 - නාම වරනැඟීම - 111

නිපුණතාව : 2.0 පාලි නාම පද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි.

නිපුණතා මට්ටම : 2.3 අම්හ, තුම්හ ශබ්ද වරනගා අර්ථ ගන්වයි.

කාලච්ඡේද : 02 යි.

ඉගෙනුම් පල :

- නිර්දිෂ්ට ශබ්ද වරනගා ලියා දක්වයි.
- ඒ ඒ පදවල විභක්තිය හා වචනය ලියා අර්ථ ගන්වයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :

- අම්හ තුම්හ ශබ්දවල පද ඇතුළත් පහත වාක්‍ය කිහිපය හුණු පුවරුවේ ලියා දක්වා අදාළ වචන උපුටා අර්ථ ගන්වන්න.

  අහං මය්හං පුත්තස්ස පොත්‍ථකං දදාමි / ත්‍වං අම්හාකං ගෙහං ආගච්ඡසි / ඉදං මෙ රථිකං / ඉදං තෙ රථිකං
- එම වචනවල තේරුම සාකච්ඡා කරන්න.
- අම්හ හා තුම්හ යන ශබ්ද සර්වනාම බව පෙන්වා දෙන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1

- පෙළ පොත ද යොදා ගනිමින් අම්හ ශබ්දය හා තුම්හ ශබ්දය හුණු පුවරුවේ ලියා හඬනගා සිසුන් සමග කියවන්න.
- එම ශබ්දවලට අදාළ ඒ ඒ විභක්තියට අයත් ඒකවචන බහුවචන සියලු පද ලියා අර්ථ ගන්වන්න.
- ඇමුණුම 01 හි අඩංගු අම්හ සහ තුම්හ ශබ්ද පද යෙදුණු වාක්‍ය සිසුන්ට සපයා එම පදවල විභක්තිය සහ වචනය විමසන්න.
- අම්හ ශබ්දය වගුගත කොට ලියා දක්වා අර්ථ ගන්වන්න.
- තුම්හ ශබ්දය වගුගත කොට ලියා දක්වා අර්ථ ගන්වන්න.
- ඒකවචනය ලියන විට බහුවචනයත්, බහුවචනය ලියන විට ඒකවචනයත් අර්ථ සහිත ව කීමට අවස්ථාව දෙන්න.
- අම්හ, තුම්හ ශබ්ද වාචෝද්ගත කරවා වගුගත කොට අභ්‍යාස පොතේ ලියවන්න.
- මෙ, තෙ ආදි අමතර පද භාවිත වී ඇති අන්දම පෙන්වා දෙන්න.
- අම්හ ශබ්දයේ ඕනෑ ම පදයක ශබ්ද ප්‍රකෘතිය 'අම්හ' බවත් තුම්හ ශබ්දයේ ඕනෑ ම පදයක ප්‍රකෘතිය 'තුම්හ' බවත් ඉස්මතු කර පෙන්වා දෙන්න.

ඇගයීම හා තක්සේරුකරණය :

- අම්හ, තුම්හ ශබ්ද පද අත්නොහැර නිවැරදි ව කියවීම
- වාක්‍යවල ඇති අම්හ, තුම්හ ශබ්දවලට අයත් පද උපුටා දක්වා විභක්තිය හා වචනය සමග අර්ථය ලිවීම
- අම්හ තුම්හ ශබ්ද මතකයෙන් වරනගා වගුගත කොට දැක්වීම
- කිසියම් විභක්තියක ඒකවචනය දැක්වූ විට බහුවචනයත්, බහුවචනය දැක්වූ විට ඒකවචනයත් ප්‍රකාශ කරමින් අර්ථ ගැන්වීම
- මෙ, තෙ ආදි අමතර පද උපුටා දක්වා අර්ථ ගැන්වීම
- පදයක් ප්‍රකාශ කළ විට එහි ශබ්ද ප්‍රකෘතිය ලිවීම සහ ප්‍රකාශ කිරීම

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 01
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :
- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- පාලි භාෂාව තරණය පළමු පොත
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

- වන්‍දෙහං බොධිපාදපං
- සොත්‍ථි **තෙ** හොතු සබ්බදා
- කිං **තුය්හ**මිනා පාපකෙන දුජ්ජීවිතෙන
- එතෙන සච්චෙන සුවත්‍ථි **මය්හං**
- මා **මෙ** බාලසමාගමො
- තස්ස **මය්හං** එතදහොසි
- **මයි** ගෙහං ගතෙ මාතා භත්තං පචි
- හොතු **මෙ/තෙ** ජයමඞ්ගලං
- නත්‍ථි **මය්හං/තුය්හං** භයං සදා
- ලාභීනං සීවලී අග්ගො - **මම** සිස්සෙසු භික්ඛවො
- ස්වාගතං වත **මෙ** ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ
- සබ්බලාභා උපෙන්තු **තෙ/මෙ**
- තෙපි **ත්‍වං/මං** අනුරක්ඛන්තු
- සදා සොත්‍ථි භවන්තු **තෙ/මෙ**
- නමො **තෙ** මතිසාගර
- පාදෙ වන්‍දාමි **තෙ** නාථ - සද්ධාය **තව** මුද්ධනා
- රංසිමාල නමො **තුය්හං/මය්හං**
- එසා **මෙ** සච්චපාරමී
- එස හි **තුය්හ**පිතා නරසීහො
- රක්ඛන්තු **මං** සකනුභාවබලෙන නිච්චං
- ඛමතු **මෙ** භන්තෙ
- මා **මෙ** බාලසමාගමො
- පමාදෙන **මයා** කතං
- සදා සොත්‍ථි භවන්තු **තෙ/මෙ**
- එත්තාවතා ච **අම්හෙහි** සම්භතං පුඤ්ඤසම්පදං
- මා **තෙ/මෙ** භවත්වන්තරායො
- යං **අම්හෙහි** කතං පුඤ්ඤං
- එවං **තුය්හං/මය්හං** ජයො හොතු
- දුක්ඛා වූපසමෙන්තු **තෙ/මෙ**
- නත්‍ථි **මෙ** සරණං අඤ්ඤං
- ජීවසිද්ධි භවන්තු **තෙ/මෙ**
- සබ්බසඞ්කප්පා **තුය්හං/මය්හං** සම්ජ්ඣන්තු
- සදා **අම්හෙ** අනුරක්ඛන්තු
- සබ්බෙ **තෙ/මෙ** අවමඞ්ගලා විනස්සන්තු

පාඩම 6 - නාම වරනැගීම - 1V

නිපුණතාව : 2.0 පාලි නාම පද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි.

නිපුණතා මට්ටම : 2.4 ත, එත, ඉම ශබ්ද ලිංගත්‍රයේ වරනගයි.

කාලච්ඡේද : 03 යි.

ඉගෙනුම් පල :
- නිර්දිෂ්ට ශබ්ද වරනගා ලියයි.
- ඒ ඒ පදවල විභක්තිය හා වචනය ලියා අර්ථ ගන්වයි.
- සර්වනාම ශබ්ද විශේෂණ ලෙස යෙදෙන අයුරු පෙන්වා දෙයි.
- සර්වනාම ශබ්ද ලිංගත්‍රයේ වරනගයි.
- සර්වනාමවල ලිංගය හා විභක්තිය ලියා අර්ථ ගන්වයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :
- සිසුන් එළිමහනට කැඳවාගෙන යන්න.
- සිසු පෙර දැනුම ද විමසමින් පිරිවෙන් පරිශ්‍රයේ ඇති පුල්ලිංග, ස්ත්‍රීලිංග සහ නපුංසකලිංග ශබ්ද තුනක් වන **බාලක, ලතා, ඵල** යන ශබ්ද ගෙන ඒවායේ ලිංගභේදය පැහැදිලි කරන්න.
- සිසුන් දන්නා සර්වනාම විමසන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1
- පහත දැක්වෙන පුල්ලිංග, ස්ත්‍රීලිංග, නපුංසකලිංග ශබ්ද තුන පුවරුවේ ලියා එම ශබ්ද වෙනුවට සර්වනාම ශබ්ද යොදන්න.

  බාලක, ලතා, ඵල
- ත්‍රිලිංගයේ ම සර්වනාම ශබ්ද භාවිත වන බව පෙන්වා දෙන්න.
- පෙළ පොත ද යොදා ගනිමින් ත, එත, ඉම ශබ්ද පැහැදිලි කර දී පුල්ලිංග, ස්ත්‍රීලිංග හා නපුංසකලිංග යන ලිංගත්‍රයේ වරනගන්න.
- ත, එත, ඉම ශබ්ද ත්‍රිලිංගයේ වෙන වෙන ම වාචෝද්ගත කරවන්න.
- නියමිත ශබ්ද මතකයෙන් වගුගත කර ලියවා අර්ථ ගන්වන්න.
- කිසියම් සර්වනාම පදයක් ප්‍රකාශ කළ විට එහි ලිංගය, ශබ්ද ප්‍රකෘතිය, විභක්තිය, වචනය හා අර්ථය කීමට සිසුන් යොමු කරන්න.
- ඇමුණුම 01හි පරිදි අදාළ ශබ්ද ප්‍රකෘතියේ විවිධ විභක්තිවල වරනැගෙන සර්වනාම පද කිහිපයක් ලබා දී පැවරුමක් ලෙස එහි ලිංගය ශබ්ද ප්‍රකෘතිය, විභක්තිය, වචනය හා අර්ථය ලිවීමට සිසුන් යොමු කරන්න.
- ඒකවචනය පවසා බහුවචනය කීමට හා ලිවීමටත්, බහුවචනය පවසා ඒකවචනය කීමට හා ලිවීමටත් සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 02හි පරිදි සර්වනාම ශබ්ද විශේෂණ ලෙස යෙදෙන අයුරු පෙන්වා දෙන්න.
- ඇමුණුම 03 අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.

මූලික වදන් සංකල්ප :

සර්වනාම - සාමාන්‍ය නාමයක් වෙනුවට යෙදිය හැකි නාම

ඇගයීම හා තක්සේරුකරණය :

- දෙනු ලබන විවිධ නාම පදවලට සුදුසු පරිදි විභක්ත්‍යර්ථවත් සර්වනාම පද ලිවීම
- ත, එත, ඉම ශබ්ද ලිංගත්‍රයේ වගුගත කොට වරනගා අර්ථ ගැන්වීම
- සර්වනාම පදයක ලිංගය, විභක්ති වචනය හා අර්ථය ලිවීම
- ඒකවචනය කී විට බහුවචනයත්, බහුවචනය කී විට ඒකවචනයත් ප්‍රකාශ කිරීම, ලිවීම හා අර්ථ ගැන්වීම
- නියමිත සර්වනාම ශබ්ද නාම පදවලට විශේෂණ ලෙස යෙදීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01, 02 හා 03
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- පාලි භාෂාව තරණය පළමු වන පොත
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

සර්වනාම පදය	ලිංගය	විභක්තිය	වචනය	තේරුම
සො	පුල්ලිංග	පඨමා	ඒකවචන	හෙතෙම
සා	ස්ත්‍රීලිංග	පඨමා	ඒකවචන	ඕතොමෝ
තානි	නපුංසකලිංග	පඨමා	බහුවචන	ඒවා

ඇමුණුම 02

1. පුරිසො ගාමං ගච්ඡති.
   සො පුරිසො **තං** ගාමං ගච්ඡති.
2. උපාසිකා භික්ඛූනං දානං දෙති.
   එතා උපාසිකා **ඉමෙසං** භික්ඛූනං දානං දෙති.
3. මාතා දාරිකානං පොත්ථකානි අදාසි.
   සා මාතා **තාසං** දාරිකානං **තානි** පොත්ථකානි අදාසි.

පුරිසො - සො පුරිසො
ගාමං - තං ගාමං
උපාසිකා - එතා උපාසිකා
භික්ඛූනං - ඉමෙසං භික්ඛූනං
මාතා - සා මාතා
දාරිකානං - තාසං දාරිකානං
පොත්ථකානි - තානි පොත්ථකානි

- නිබ්බුතා නූන සා මාතා
  නිබ්බුතා නූන සො පිතා
  නිබ්බුතා නූන සා නාරී
  යස්සායං ඊදිසො පති

ඇමුණුම 03

පහත සඳහන් පදවල ලිංගය, විභක්තිය හා වචනය දක්වන්න.

පදය	ලිංගය	විභක්තිය	වචනය
තෙ			
තාය			
අස්මිං			
එතස්මිං			
ඉමාය			
එතෙහි			
එතිස්සං			
අස්ස			
ඉමෙසං			
තෙසං			
නස්ස			
තායං			
තං			
තා			
තෙසං			
ඉමං			
ඉමානි			
එසං			
අස්සා			
එතෙසං			
ඉමා			
අනෙන			
ඉදං			
එතෙ			
එතානි			

පාඩම 7 - ආඛ්‍යාත වරනැගීම - 1

නිපුණතාව : 3.0 විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි.

නිපුණතා මට්ටම : 3.1 ත්‍රෛකාලික ආඛ්‍යාත උභයපදයේ වරනගයි.
3.2 ආඛ්‍යාත ප්‍රත්‍යය මාලාව වගුගත කර ලියයි.

කාලච්ඡේද : 08 යි.

ඉගෙනුම් පල :
- නිර්දිෂ්ට ආඛ්‍යාතවල ප්‍රත්‍යය මාලා මතකයෙන් ලියයි.
- නිර්දිෂ්ට ආඛ්‍යාත වගුගත කර ලියයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :
- ඇමුණුම 01 හි ගාථාව හුණු පුවරුවේ ලියා සිසුන් සමග සජ්ඣායනය කරන්න.
- එහි ඇති ආඛ්‍යාත පද උපුටා දක්වන්න.
- **නමාමි, හොන්තු, ගච්ඡන්ති** යන ආඛ්‍යාත පදවල අර්ථය සාකච්ඡා කරන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1
- ආඛ්‍යාත පිළිබඳ පෙර දැනුම ඇසුරෙන් ත්‍රෛකාලික ආඛ්‍යාත යන්න හඳුන්වා දෙන්න.
- ආඛ්‍යාත විභක්තියක ඇති ලක්ෂණ පැහැදිලි කරන්න.
- ආඛ්‍යාත යනු ක්‍රියා බව පහදන්න.
- ත්‍රෛකාලික ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා වගුගත කර දක්වන්න.
- ත්‍රෛකාලික ආඛ්‍යාත උභයපදයේ වගුගත කර වරනගා දක්වන්න.
- ත්‍රෛකාලික ආඛ්‍යාත වරනැගීම් වාචෝද්ගත කරවන්න.
- පෙළ පොතේ සඳහන් ධාතු කීපයක් ලබා දී කාලත්‍රයේ වගුගත කොට වරනගා ලියා දැක්වීමට උපදෙස් දෙන්න.
- ඒකවචන පද කීපයක් ලියා ඒවායේ බහුවචන රූප දැක්වීමටත් බහුවචන පද කීපයක් ලියා ඒවායේ ඒකවචන රූප දැක්වීමටත් සිසුන් යොමු කරන්න.
- ඇමුණුම 02 අඩංගු ත්‍රෛකාලික ආඛ්‍යාත යෙදුණු වාක්‍ය සිසුන්ට ඉදිරිපත් කරන්න.
- ඒවායේ ආඛ්‍යාත පද උපුටා දක්වන්නටත් අදාළ ආඛ්‍යාත විභක්තිය නම් කිරීමටත් සිසුන් යොමු කරන්න.
- ඇමුණුම 03 හි සුදුසු පරිදි හිස්තැන් **ඇති කොට** ඒවා සම්පූර්ණ කිරීමට සිසුන් යොදවන්න.
- ඇමුණුම 04 අභ්‍යාස සිසුන් ලවා කරවන්න.

මූලික වදන් සංකල්ප :
- **ත්‍රෛකාලික ආඛ්‍යාත** - වත්තමානා, භවිස්සන්ති, අජ්ජතනී
- **උභයපද** - පරස්සපද (ක්‍රියා ඵලය අනුන් වෙත පැමිණීම - මෙය සාම්ප්‍රදායික පිළිගැනීම යි)
  - අත්තනොපද (ක්‍රියා ඵලය තමන් වෙත පැමිණීම - මෙය සාම්ප්‍රදායික පිළිගැනීම යි)
- **පුරුෂ** - පඨමපුරිස, මජ්ඣිමපුරිස, උත්තමපුරිස
- වචන - ඒකවචන, බහුවචන

ඇගයීම හා තක්සේරුකරණය :
- ආඛ්‍යාතයක් යනු කුමක් දැයි පැහැදිලි කිරීම
- ත්‍රෛකාලික ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා මතකයෙන් වගුගත කොට ලියා දක්වීම
- ත්‍රෛකාලික ආඛ්‍යාත මතකයෙන් වගුගත කර ලියා දැක්වීම
- වාක්‍යවල ඇති ක්‍රියාපද කවර ආඛ්‍යාත විභක්තියකට අයත් දැයි ප්‍රකාශ කිරීම
- ත්‍රෛකාලික ආඛ්‍යාත වරනැගීම් මතකයෙන් ප්‍රකාශ කිරීම
- කිසියම් ආඛ්‍යාත පදයක ආඛ්‍යාත විභක්තිය, පදය, වචනය හා පුරුෂය ප්‍රකාශ කිරීම
- ඒකවචනවලට බහුවචන රූපත් බහුවචනවලට ඒකවචන රූපත් ඉදිරිපත් කිරීම

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 01, 02, 03 සහ 04
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :
- පාලි පාඨමඤ්ජුසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- පාලි භාෂාව තරණය පළමු වන පොත
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

- **නමාමි** බුද්ධං ගුණසාගරං තං - සත්තා සදා **හොන්තු** සුඛී අවෙරා,
  කායො ජිගුච්ඡො සකලො දුගන්ධො - **ගච්ඡන්ති** සබ්බෙ මරණං අහං ච.

ඇමුණුම 02

i. දීපයො ගිරිම්හි චරිංසු.
ii. බලි දායීනො කායං ජිනිස්සති.
iii. අහං බුද්ධං පූජෙමි.
iv. පුත්තො ධම්මං උග්ගණ්හාති.
v. අහං දීපම්හි අචරිං.

ඇමුණුම 03

ආඛ්‍යාත පදය	ආඛ්‍යාත විභක්තිය	පදය	පුරුෂය	වචන
ජිනිංසු	අජ්ජතනී	පරස්සපද	පඨමපුරිස	බහුවචන
පචාම	වත්තමානා	පරස්සපද	උත්තමපුරිස	බහුවචන
ධාවතෙ	වත්තමානා	අත්තනොපද	පඨමපුරිස	ඒකවචන
භායිස්සති	භවිස්සන්ති	පරස්සපද	පඨමපුරිස	ඒකවචන
චරිස්සාමි	භවිස්සන්ති	පරස්සපද	උත්තමපුරිස	ඒකවචන
සයසි	වත්තමානා	පරස්සපද	මජ්ඣිමපුරිස	ඒකවචන
වන්දෙ	වත්තමානා	අත්තනොපද	උත්තමපුරිස	ඒකවචන

ඇමුණුම 04

පහත වාක්‍ය කාලත්‍රයට සකස් කරන්න.

- **වත්තමානා**

i. දාසා මිත්තානං සුනඛෙ හරන්ති. ii. අහං බුද්ධං පූජේමි.
iii. මයං ධම්මං ජානාම. iv. සීහො මිගෙ මාරෙති.
v. තුම්හෙ ධම්මං සුණාථ. vi. වනිතා ඔදනං පචති.

- **හවිස්සන්ති**

i. දාසා මිත්තානං සුනඛෙ හරිස්සන්ති. ii. අහං බුද්ධං පූජෙස්සාමි.
iii.මයං ධම්මං ජානෙස්සාම. iv. සීහො මිගෙ මාරෙස්සති.
v. තුම්හෙ ධම්මං සුණිස්සථ. vi. වනිතා ඔදනං පචිස්සති.

- **අජ්ජතනී**

i. දාසා මිත්තානං සුනඛෙ හරිංසු. ii. අහං බුද්ධං අපූජිං.
iii. මයං ධම්මං ජානිම්හා. iv. සීහො මිගෙ අමරි.
v. තුම්හෙ ධම්මං සුණිත්ථ. vi. වනිතා ඔදනං පචි.

පහත වගුවේ **අත්තනොපද** රූප ඉවත් කර එම හිස්තැන් සම්පූර්ණ කිරීමටත් සුදුසු පරිදි හිස්තැන් සහිත ව ලබා දී ඒවා පිරවීමටත් සිසුන් මෙහෙයවන්න.

විභක්තිය	පුරුෂය	වචනය	පරස්සපද	අත්තනොපද
වත්තමානා	පඨමපුරිස	ඒකවචන	චරති	චරතෙ
හවිස්සන්ති	මජ්ඣිමපුරිස	බහුවචන	යාචිස්සථ	යාචිස්සව්හෙ
අජ්ජතනී	උත්තමපුරිස	ඒකවචන	අහවිං	අහව
අජ්ජතනී	පඨමපුරිස	ඒකවචන	දදි	දදා
හවිස්සන්ති	මජ්ඣිමපුරිස	ඒකවචන	ලිඛිස්සසි	ලිඛිස්සසෙ
වත්තමානා	උත්තමපුරිස	බහුවචන	සයාම	සයාම්හෙ
වත්තමානා	මජ්ඣිමපුරිස	බහුවචන	ඛාදථ	ඛාදව්හෙ
අජ්ජතනී	උත්තමපුරිස	බහුවචන	හවිම්හා	හවිම්හෙ
අජ්ජතනී	පඨමපුරිස	බහුවචන	කිණිංසු	කිණු
හවිස්සන්ති	උත්තමපුරිස	ඒකවචන	යාචිස්සාමි	යාචිස්සං

පාඩම 8 - ආඛ්‍යාත වරනැඟීම - 11

නිපුණතාව : 3.0 විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි.

නිපුණතා මට්ටම : 3.3 පඤ්චමී, සත්තමී, පරොක්ඛා, හීයත්තනී ආඛ්‍යාත වරනගා අර්ථ ගන්වයි.

කාලච්ඡේද : 07 යි.

ඉගෙනුම් පල :
- දෙනු ලබන ආඛ්‍යාත පදයක් කිනම් ආඛ්‍යාතයකට අයත් දැයි ලියා දක්වයි.
- ධාතු කිහිපයක් ඒ ඒ ආඛ්‍යාතවල වරනගන අන්දම වගුගත කර දක්වයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :
- ඇමුණුම 01හි ගාථාව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එහි ඇති ආඛ්‍යාත උපුටා දක්වන්න.
- එම සියලු ආඛ්‍යාත පඤ්චමී ආඛ්‍යාත විභක්ති ආශීර්වාද අර්ථවත් බව පෙන්වා දෙන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1
- පෙළ පොත ඇසුරෙන් ඒ ඒ ආඛ්‍යාත විභක්තිය කවර අර්ථවල යෙදේ දැයි පෙන්වා දෙන්න.
- නියමිත ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා වගුගත කර ලියා දක්වන්න.
- පෙළ පොතේ ඇතුළත් ධාතුවක් පඤ්චමී, සත්තමී, පරොක්ඛා, හීයත්තනී යන ආඛ්‍යාත විභක්තිවල වරනගා සිසුන් සමග කියවන්න.
- විවිධාර්ථවත් ධාතු ලබා දී ඒවා පඤ්චමී, සත්තමී, පරොක්ඛා, හීයත්තනී යන ආඛ්‍යාත විභක්තිවල වරනැඟීමට සිසුන් යොමු කරන්න.
- ඒ ඒ ආඛ්‍යාතපදවලට අර්ථ ගන්වන්න.
- ඒකවචන ආඛ්‍යාත පද බහුවචනයටත් බහුවචන ආඛ්‍යාත පද ඒකවචනයටත් හරවා අර්ථය ද සමග ලියවන්න.
- ධාතු කීපයක් ඒ ඒ ආඛ්‍යාත විභක්තිවල මතකයෙන් වගුගත කර වරනගා දැක්වීමට උපදෙස් දෙන්න.
- ඇමුණුම 02හි පරිදි වාක්‍යයක ඇති ආඛ්‍යාත පදයක් කිනම් ආඛ්‍යාත විභක්තියකට අයත් දැයි පැහැදිලි කරවීමට වාක්‍ය කීපයක් හෝ පාඨ කීපයක් හෝ ලබා දෙන්න.
- ඒ ඒ ආඛ්‍යාත රූප යෙදී ඇති පාලි පාඨ එකතු කරවන්න.
- ඇමුණුම 03 අභ්‍යාස සඳහා සිසුන් යොමු කරන්න.

මූලික වදන් සංකල්ප :
- පඤ්චමී - ආණත්ත්‍යාසිට්ඨෙනුත්තකාලෙ පඤ්චමී
- සත්තමී - අනුමතිපරිකප්පත්‍ථෙසු සත්තමී
- පරොක්ඛා - අප්පච්චක්ඛෙ පරොක්ඛාතීතෙ
- හීයත්තනී - හීයොප්පභුති පච්චක්ඛෙ හීයත්තනී

ඇගයීම හා තක්සේරුකරණය :
- නියමිත ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යයමාලා වගුගත කොට දැක්වීම
- ධාතුවක් නියමිත ආඛ්‍යාත විභක්තිවල වරනගා වගුගත කිරීම

- ඒකවචන ආඛ්‍යාත පද බහුවචනයට හරවා අර්ථ ගැන්වීම
- බහුවචන ආඛ්‍යාත පද ඒකවචනයට හරවා අර්ථ ගැන්වීම
- වාක්‍යයක හෝ පාඨයක හෝ ඇති ආඛ්‍යාතය කිනම් ආඛ්‍යාත විභක්තියකට අයත් දැයි ප්‍රකාශ කිරීම හා ලිවීම
- විවිධ ආඛ්‍යාත රූප සහිත පාලි පාඨ අර්ථ ගැන්වීම

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 01, 02 හා 03
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :
- පාලි පාඨමඤ්ජුසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- පාලි භාෂාව තරණය පළමු වන පොත
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

භවතු සබ්බමඞ්ගලං
රක්ඛන්තු සබ්බදෙවතා
සබ්බබුද්ධානුභාවෙන
සදා සොත්ථි **භවන්තු** තෙ
තද කළු අකුරෙන් දක්වා ඇති ආඛ්‍යාත පද පඤ්චමී ආඛ්‍යාත විභක්තියේ යෙදේ.

ඇමුණුම 02

1. **දෙසෙතු** භන්තෙ භගවා ධම්මං.
2. කිමහං **කරෙය්‍යාමි.**
3. මමෙව තස්මිං සමයෙ **අනුස්සරෙය්‍යාථ.**

1. **දෙසෙතු** - පඤ්චමී ආඛ්‍යාත විභත්ති, කත්තුකාරක, පරස්සපද, පඨමපුරිස, ඒකවචන
2. **කරෙය්‍යාමි** - සත්තමී ආඛ්‍යාත විභත්ති, කත්තුකාරක, පරස්සපද, උත්තමපුරිස, ඒකවචන
3. **අනුස්සරෙය්‍යාථ** - සත්තමී ආඛ්‍යාත විභත්ති, කත්තුකාරක, පරස්සපද, මජ්ඣිමපුරිස, බහුවචන

ඇමුණුම 03

1. පහත දැක්වෙන වත්තමානා වාක්‍ය පඤ්චමී හා සත්තමී ආඛ්‍යාත විභක්ති පද යොදා සකස් කිරීමට උපදෙස් දෙන්න. (පිළිතුරු ඊට පහළින් සපයා ඇත.)

වත්තමානා

i. වාණිජො ගාමෙ චරති.
ii. අහං දීපං ආහරාමි.
iii. ත්වං සීහං පස්සසි.
iv. දෙවා ආකාසෙන ගච්ඡන්ති.
v. මයං ලොකෙ වසාම.
vi. තුම්හෙ ගාමං ගච්ඡථ.

පිළිතුරු -

පඤ්චමී

i. වාණිජො ගාමෙ චරතු.

පිළිතුරු -

පඤ්චමී		**සත්තමී**	
i.	වාණිජො ගාමෙ චරතු.	i.	වාණිජො ගාමෙ චරෙය්‍ය.
ii.	අහං දීපං ආහරාමි.	ii.	අහං දීපං ආහරෙය්‍යාමි.
iii.	ත්වං සීහං පස්සාහි.	iii.	ත්වං සීහං පස්සෙය්‍යාසි.
iv.	දෙවා ආකාසෙන ගච්ඡන්තු.	iv.	දෙවා ආකාසෙන ගච්ඡෙය්‍යුං.
v.	මයං ලොකෙ වසාම.	v.	මයං ලොකෙ වසෙය්‍යාම.
vi.	තුම්හෙ ගාමං ගච්ඡථ.	vi.	තුම්හෙ ගාමං ගච්ඡෙය්‍යාථ.

2. **පහත වෘත්තයෙහි ඇති ක්‍රියාපද අදාළ ආඛ්‍යාත විභක්තියට අනුව වගුගත කිරීමට උපදෙස් දෙන්න.**

අදද භවාමසෙ වසෙය්‍යාම

සයව්හෙ චරසෙ පපච

ඨපෙසි සුණාතං පචෙරං

සයසි යාචිස්සං ලිඛිස්සථ අභවූ

රුරොද චරෙය්‍යාමි දදිසෙ

ධාවිස්සන්ති රක්ඛ පපචිරෙ අයචා

අයචත්ථුං

පිළිතුරු -

වත්තමානා	භවිස්සන්ති	අජ්ජතනී	පඤ්චමී	සත්තමී	හීයත්තනී	පරොක්ඛා
සයසි	යාචිස්සං	ඨපෙසි	සුණාතං	වසෙය්‍යාම	අයචත්ථුං	පපච
චරසෙ	ලිඛිස්සථ	අභවූ	රක්ඛ	පචෙරං	අයචා	රුරොද
සයව්හෙ	ධාවිස්සන්ති	දදිසෙ	භවාමසෙ	චරෙය්‍යාමි	අදද	පපචිරෙ

3. පහත සඳහන් ආඛ්‍යාත පදවල ආඛ්‍යාත විභත්තිය, පුරුෂය හා වචනය දක්වන්න.

ආඛ්‍යාතය	ආඛ්‍යාත විභත්තිය	පුරුෂය	වචනය
උපසඞ්කමි			
අවොච			
නික්ඛමිස්සාමි			
පස්සාමි			
ඛිපෙය්‍ය			
නික්ඛම			
නික්ඛමිස්සාමි			
බ්‍යාකරිස්සසි			
කරොහි			
ඵාලෙය්‍ය			
පුච්ඡිස්සාමි			
ආවහති			
තරති			
ඵාලෙස්සාමි			
පජානාමි			
උක්කුජ්ජෙය්‍ය			
ධාරෙතු			
විහරති			
විචරිස්සාමි			
සොචති			
ධාරෙය්‍ය			
භාසිස්සාමි			
සුණාහි			
ආචික්ඛෙය්‍ය			

ආඛ්‍යාතය	ආඛ්‍යාත විභත්තිය	පුරුෂය	වචනය
පලායති			
රොසෙති			
දිස්සති			
පටිජානාති			
පූජෙති			
ජානෙය්‍ය			
හොන්ති			
හොති			
මන්තෙති			
විජානාම			
දෙසිස්සාමි			
වන්‍දථ			
නිසීදි			
භජතෙ			
උදපාදි			
ආහංසු			
දිස්සන්ති			
ආමන්තෙසි			
සුණාථ			
විනාසෙති			
පච්චස්සොසුං			
කරොථ			
අහෙසුං			
පත්‍ථයති			
පදිස්සති			
භුඤ්ජති			

පාඩම 9 - වාක්‍ය රචනය - 1

නිපුණතාව : 4.0 පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කර ලියයි.

නිපුණතා මට්ටම : 4.1 කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත වාක්‍ය කාලත්‍රයෙන් ලියයි.

කාලච්ඡේද : 06 යි.

ඉගෙනුම් පල :

- කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත සරල පාලි වාක්‍ය නිර්මාණය කරයි.
- වර්තමාන කාල වාක්‍ය කාලත්‍රයෙන් ලියයි.
- ඒකවචන වාක්‍ය බහුවචනයට හරවා ලියයි.
- සිංහල භාෂාවේ දී අප්‍රාණවාචී බහුවචන උක්ත පදයට ඒකවචන ආඛ්‍යාතය යෙදුණ ද පාලියේ දී අප්‍රාණවාචී බහු වචන උක්ත පදයට බහුවචනයෙන් ම ආඛ්‍යාත පදය යෙදෙන බව පෙන්වා දෙයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :

- මාධ්‍යයෙන් නිතර ඇසෙන පහත සඳහන් ළමා ගීතය සිසුන්ට මතක් කර දෙන්න.

  මල් පිපෙයි - දෙනෙත් ඇරෙයි
  කතා කියයි හෙමින්
  හිරු එබෙයි - එළිය දෙයි
  කුරුලු ගී ඇසෙයි

- එම ගීතයේ ඇති සරල වාක්‍ය හය වෙන් වශයෙන් උපුටා දැක්වීමට සිසුන් මෙහෙයවන්න.
- එම වාක්‍ය යොදා ගනිමින් කාලත්‍රයට අදාළ වචන සහ කර්තෘ කර්ම හා ක්‍රියා පිළිබඳ පෙර දැනුම මතුවන සේ සාකච්ඡාවක නියැලෙන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1

- ඇමුණුම 01 සිසුන්ට සපයමින් වාක්‍ය ගොඩනැගීමේ දී සිංහල භාෂාවේ සහ පාලි භාෂාවේ ඇති විවිධත්වය ඉස්මතු වන සේ කෙටි සාකච්ඡාවක් කරන්න.
- එම ආකෘති දෙක යොදා ගනිමින් එහි ඇති කර්තෘ, කර්ම සහ ක්‍රියා සහිත වාක්‍ය වෙනුවට වෙනත් සුදුසු වාක්‍ය ආදේශ කිරීමට සිසු කණ්ඩායම්වලට/සිසුන්ට අවස්ථාව දෙන්න.
- සියලු ම කණ්ඩායම්වල සිසුන් නිර්මාණය කරන ලද වාක්‍ය ඉවහල් කර ගනිමින් පහත සඳහන් කරුණු මතුවන සේ සමාලෝචනයක නිරත වන්න.
  - සිංහල භාෂාවේ සහ පාලි භාෂාවේ වාක්‍ය නිර්මාණය බොහෝ දුරට සමාන රටාවක් ඇති බව
  - සිංහල භාෂාවේ අප්‍රාණවාචී උක්තය කවර වචනයකින් යෙදුණත් එහි ආඛ්‍යාතය ඒකවචනය ගන්නා බව
  - පාලි භාෂාවේ දී අප්‍රාණවාචී උක්තය ඒකවචන වූ විට ආඛ්‍යාතය ඒකවචනයෙන් ද, අප්‍රාණවාචී උක්තය බහුවචන වූ විට ආඛ්‍යාතය බහුවචනයෙන් ද යෙදෙන බව
- පෙළ පොතේ සහ ඇමුණුම 02හි අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

මූලික වදන් සංකල්ප :

- **පාලි රීතිය -** සිංහල භාෂාවේ වාක්‍ය රීතියට අනුව අප්‍රාණවාචී බහුවචන උක්ත පද හා යෙදෙන ආඛ්‍යාතය ඒකවචන වුව ද පාලි රීතියට අනුව අප්‍රාණවාචී බහු වචන උක්ත පදය හා යෙදෙන ආඛ්‍යාත පදය බහුවචන වේ.

ඇගයීම හා තක්සේරුකරණය :

- කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත නිවැරදි වාක්‍ය නිර්මාණය කිරීම
- වර්තමාන කාල වාක්‍ය අතීත හා අනාගත කාලයට හරවා ලිවීම
- පාලි රීතියට හා සිංහල රීතියට අනුකූල ව වාක්‍ය ලිවීම
- ඒකවචන සහිත වාක්‍ය බහුවචනයටත් බහුවචන සහිත වාක්‍ය ඒකවචනයටත් හරවා ලිවීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01 සහ 02
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය 01, 02
- පාලි රචනා 01, 02
- පාලි කථාමඤ්ජූසා
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

(අ) **උක්තය, කර්මය සහ ආඛ්‍යාතය සහිත සරල සිංහල වාක්‍ය කීපයක්**

වචනය	වර්තමාන කාලය	අතීත කාලය	අනාගත කාලය
එකවචන	මිනිසා ගස කපයි.	මිනිසා ගස කැපුවේය.	මිනිසා ගස කපන්නේය.
බහුවචන	මිනිස්සු ගස කපති.	මිනිස්සු ගස කැපූහ.	මිනිස්සු ගස කපන්නෝය.
ඒකවචන	ළමයා ගෙඩිය කයි.	ළමයා ගෙඩිය කෑවේය.	ළමයා ගෙඩිය කන්නේය.
බහුවචන	ළමයි ගෙඩි කති.	ළමයි ගෙඩි කෑහ.	ළමයි ගෙඩි කන්නෝය.

(ආ) **උක්තය, කර්මය සහ ආඛ්‍යාතය සහිත ඉහත වාක්‍ය පාලියට නගා ඇති අයුරු**

වචනය	වර්තමාන කාලය	අතීත කාලය	අනාගත කාලය
එකවචන	මනුස්සො රුක්ඛං ඡින්දති.	මනුස්සො රුක්ඛං ඡින්දි.	මනුස්සො රුක්ඛං ඡින්දිස්සති.
බහුවචන	මනුස්සා රුක්ඛං ඡින්දන්ති.	මනුස්සා රුක්ඛං ඡින්දිංසු.	මනුස්සා රුක්ඛං ඡින්දිස්සන්ති.
එකවචන	දාරකො ඵලං ඛාදති.	දාරකො ඵලං ඛාදි.	දාරකො ඵලං ඛාදිස්සති.
බහුවචන	දාරකා ඵලානි ඛාදන්ති.	දාරකා ඵලානි ඛාදිංසු.	දාරකා ඵලානි ඛාදිස්සන්ති.

ඇමුණුම 02

01. පහත දැක්වෙන වාක්‍ය අතීත හා අනාගත කාලයට හරවන්න.

i. බුද්ධො ධම්මං දෙසෙතුං බාරාණසියං ගච්ඡති.
ii. සක්කො දෙවානමින්දො තාවතිංසං පාලෙති.
iii. අහං මාතුයා සද්ධිං නගරං ගච්ඡාමි.
iv. මයං අනුදිනං විහාරං ගන්ත්වා බුද්ධං වන්දාම.
v. චමූපති යුද්ධසෙනාහි සහ යුද්ධභූමිං ගච්ඡති.
vi. සමුද්දස්ස තරංගා වෙළං පත්වා භිජ්ජන්ති.
vii. තළාකෙසු පදුමානි ච උප්පලානි ච සන්ති.
viii. සුරාසොණ්ඩා සායණ්හෙ පානමන්දිරෙසු සන්නිපතන්ති.
ix. දාරකො ආමානි අම්බඵලානි කිණිත්වා ඛාදති.
x. සප්පා කුක්කුටීනං අණ්ඩානි ඛාදන්ති.

02. පහත දැක්වෙන වාක්‍ය බහුවචනයට හරවන්න.

i. අහං සද්ධාය බුද්ධං සරණං ගච්ඡාමි.
ii. දීපි ගාවො මාරෙත්වා ඛාදි.
iii. ත්වං මය්හං ගබ්භෙ ද්වාරං විවරසි.
iv. මය්හං ධීතා ව්‍යඤ්ජනානි පචති.
v. චොරො සත්ථෙන මම බාහුං ඡින්දි.
vi. සෙට්ඨී දළිද්දානං ධනං දදිස්සති.
vii. සො භාතරෙන සද්ධිං වනෙ ආහිණ්ඩති.
viii. තුම්හාකං නත්තා උදකං පිවි.
ix. මනුස්සො වත්ථානි පරිදහති, ආභරණානි පිළන්ධති.
x. වානරො රුක්ඛං ආරුහිත්වා ඵලානි ඛාදිස්සති.

03. පහත වාක්‍ය සිංහලට (සිංහල රීතියට අනුව) පරිවර්තනය කරන්න.

i. සුරියාලොකෙන පදුමානි විකසන්ති.
ii. වාතෙන රුක්ඛා කම්පන්ති.
iii. ආකාසෙ නක්ඛත්තානි විලසන්ති.
iv. පබ්බතෙහි නදියො සන්දන්ති.
v. ලතායො කුසුමෙහි විලසන්ති.
vi. නෙත්තෙහි අස්සූනි පග්ඝරන්ති.
vii. ආපණෙ තුලායො ලම්බන්ති.
viii. රුක්ඛම්හා ඵලානි පතන්ති.
ix. දෙවාලයෙ මාලායො මිලායන්ති.
x. රුක්ඛම්හා පණ්ණානි පතන්ති.

පාඩම 10 - වාක්‍ය රචනය - 11

නිපුණතාව : 4.0 පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි.

නිපුණතා මට්ටම : 4.2 උපසර්ග හා නිපාත පද යොදා දිගු වාක්‍ය රචනා කරයි.

කාලච්ඡේද : 09 යි.

ඉගෙනුම් පල :

- කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත සරල පාලි වාක්‍ය නිර්මාණය කර ලියයි.
- වර්තමාන කාල වාක්‍ය කාලත්‍රයෙන් ලියා දක්වයි.
- ඒකවචන වාක්‍ය බහුවචනයට හරවා ලියයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :

- පන්තියේ නිතර දක්නට ලැබෙන ශිෂ්‍ය ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් පහත ආකාරයේ පාලි වාක්‍ය කිහිපයක් ප්‍රකාශ කිරීමට සිසුන් මෙහෙයවන්න.

  එකො සිස්සො අක්ඛරානි ලිඛති.

  එකො සිස්සො පාඨං පඨති.
- සිසුන් ප්‍රකාශ කරන වාක්‍ය හුණු පුවරුවේ ලියවන්න.
- එම වාක්‍යවලට සුදුසු උපසර්ග සහ නිපාත පද එකතු කරමින් ඒවා දිගු කොට ලියන්න.
- උපසර්ග සහ නිපාත පද යටින් ඉරි ඇඳ පෙන්වන්න.
- භාෂා පරිහරණයේ දී අර්ථ විග්‍රහයට සහ අලංකරණයට උපසර්ගවල සහ නිපාතවල ඇති දායකත්වය සාකච්ඡා කරන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1

- ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වන ශිෂ්‍යයකු ලවා සරල වාක්‍යයක් හුණු පුවරුවේ ලියවන්න.
- පෙළ පොත සහ ඇමුණුම 01 ආකාරයේ නිතර භාවිත වන නිපාත පද යොදා ගනිමින් එම වාක්‍ය වඩාත් සංවර්ධනය වන සේ දිගු කොට ලියවන්න.
- ඇමුණුම 01 හි ඇති වාක්‍ය පෙන්වමින් නිපාත එක්වූ විට වාක්‍යයේ සිදුවන සියුම් වෙනස්කම් පිළිබඳ සාකච්ඡා කරන්න.
- ඇමුණුම 02 සිසුන්ට ලබා දෙමින් එම වාක්‍යයේ ම හෝ වෙනත් සුදුසු වාක්‍යයක හෝ වචනවලට ගැළපෙන උපසර්ග යොදා පෙන්වන්න.
- උපසර්ග යෙදූ විට වචනවල සිදුවන අර්ථමය වෙනස්කම් සිසුන්ට පහදා දෙන්න.
- පෙළ පොතේ අදාළ පාඩමට සිසු අවධානය යොමු කරන්න.
- උපසර්ග 20 සිසුන් ලවා වාචෝද්ගත කරවන්න.
- උසර්ගවල කාර්යය උදාහරණ මගින් සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- ගුරුවරයා ප්‍රකාශ කරන නිපාත සහ උපසර්ග පද භාවිත කොට වාක්‍ය නිර්මාණය කිරීමේ තරගයක් පවත්වන්න.
- ඇමුණුම 03 අභ්‍යාස කිරීමට සිසුන් යොදවන්න.

මූලික වදන් සංකල්පය :

- **නිපාත** - වාක්‍යයක මුල, මැද හා අග යෙදෙන නො වරනැගෙන පද විශේෂයකි.
- **උපසර්ග** - ධාතුවකට හෝ නාමයකට හෝ මුලින් පමණක් යෙදේ. සංඛ්‍යාත්මක ව පද 20 කි.

ඇගයීම හා තක්සේරුකරණය :

- නිපාත භාවිත කරමින් වැකි දිගු කොට ලිවීම
- උපසර්ග 20 මතකයෙන් ප්‍රකාශ කිරීම
- පාලි භාෂාවේ උපසර්ග යෙදෙන ආකාරය පැහැදිලි කිරීම
- උපසර්ග සහිත දිගු වැකි නිර්මාණය කිරීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01, 02 සහ 03
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය 01, 02
- පාලි රචනා 01, 02
- පාලි කථාමඤ්ජූසා
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

නිපාත පදවලට නිදසුන්

ච - ද	උච්චං - උස්
වා - නොහොත්	උද්ධං - උඩ
සද්ධිං - සමග	ඉතො - මෙයින්
අපි - ද	අරෙ - බොල
සුවෙ - හෙට	අලං - සුදුසු
හීයො - ඊයේ	අද්ධා - ඒකාන්තයෙන්
කථං - කෙසේ	අත්‍ර - මෙහි
කදා - කවදා	එත්ථ - මෙහි
කුහිං - කොහි	සීඝං - වහා
එව - ම	හෙට්ඨා - යට

නිපාත පද සහිත වාක්‍ය

සාමණෙරො මිත්තෙන **සද්ධිං** බුද්ධං වන්දති.
සාමණෙරො මිත්තෙන **ච** ආචරියෙන **ච සද්ධිං** බුද්ධං වන්දති.
සාමණෙරො ආචරියෙන **සද්ධිං එව** බුද්ධං වන්දති.
ආචරියො **අපි** සාමණෙරො **අපි** මිත්තෙන **සද්ධිං** බුද්ධං වන්දන්ති.
හීයො සාමණෙරො ආචරියෙන **සද්ධිං** බුද්ධං වන්දි.

ඇමුණුම 02

උපසර්ග පද

ප / පරා / නි / නී / උ / දු / සං / වි / අව / අනු

පරි / අධි / අභි / පති / සු / ආ / අති / අපි / අප / උප

වාක්‍යවල උපසර්ගපද යෙදී ඇති අයුරු :

පුරිසො ගාමං ගච්ඡති.	සප්පුරිසො ධම්මං අධිගච්ඡති.
ජිතො සුඛං සෙති.	පරාජිතො දුක්ඛං සෙති.
ජනො බබ්බුං හරති.	දුජ්ජනො බබ්බුං පහරති.

ඇමුණුම 03

01. **පහත ඡේදයෙහි ඇතුළත් නිපාත පද උපුටා දක්වන්න.**

තෙ පුරතො ච පච්ඡතො ච ගච්ඡන්තා සබ්බෙපි එකතො හුත්වා දසබලස්ස සන්තිකං අගමංසු. සත්ථා මහාභික්ඛුසඞ්ඝපරිවාරො අඤ්ඤතරස්මිං පදෙසෙ අට්ඨාසි. දාවග්ගි අභිභවන්තො විය විරවන්තො ආගච්ඡති. ආගන්ත්‍වා තථාගතස්ස ඨිතට්ඨානං පත්වා තස්ස පදෙසස්ස සමන්තා සොළසකරීසමත්තං ඨානං පත්තො, උදකෙ ඔපිලාපිතතිණුක්කා විය නිබ්බායි. විනිබ්බෙධතො ද්වත්තිංසකරීසමත්තට්ඨානං අවත්ථරිතුං නාසක්ඛි. භික්ඛූ සත්ථුගුණකථං ආරභිංසු. ''අහො! බුද්ධානං ගුණා නාම, අයං හි නාම අචෙතනො අග්ගි බුද්ධානං ඨිතට්ඨානං අවත්ථරිතුං න සක්කොති, උදකෙ තිණුක්කා විය නිබ්බායති. අහො! බුද්ධානං ආනුභාවො නාමා''ති. සත්ථා තෙසං කථං සුත්වා ''න භික්ඛවෙ එතං එතරහි මය්හං බලං, යං ඉමං භූමිප්පදෙසං පත්වා එස අග්ගි නිබ්බායති. ඉදං පන මය්හං පොරාණකසච්චබලං. ඉමස්මිං හි පදෙසෙ සකලම්පි ඉමං කප්පං අග්ගි න ජලිස්සති. කප්පට්ඨියපාටිහාරියං නාමෙතන්ති'' ආහ. අථායස්මා ආනන්දො සත්ථු නිසීදනත්ථාය චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤාපෙසි. නිසීදි සත්ථා පල්ලඞ්කං ආභුජිත්වා. භික්ඛුසඞ්ඝොපි තථාගතං වන්දිත්‍වා පරිවාරෙත්‍වා නිසීදි. අථ සත්ථා, ''ඉදං තාව භන්තෙ අම්හාකං පාකටං, අතීතං පටිච්ඡන්නං, තං නො පාකටං කරොථාති'' භික්ඛූහි ආයාචිතො අතීතං ආහරි.

02. පහත වාක්‍යවල ඇතුළත් උපසර්ග සහිත ආඛ්‍යාත පද උපුටා දක්වන්න.

i. අථ ඛො අම්බපාලී ගණිකා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

ii. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය. එවමෙතං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො.

iii. සචෙ භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සති. භොතො සොණදණ්ඩස්ස යසො පරිහායිස්සති, සමණස්ස ගොතමස්ස යසො අභිවඩ්ඪති.

iv. යක්ඛො ගජ්ජන්තො භුජෙ අප්පොථෙන්තො අභිධාවි. යොධොපි තත්ථ ඨිතො වෙගෙන ආකාසමබ්භුග්ගන්ත්වා වාමපාදඞ්ගුලීහි තස්ස හනුකට්ඨිං පහරි.

v. අත්තනො වාමපාදෙ ද්වීහි අඞ්ගුලීහි තස්ස පාදෙ ගහෙත්වා විහාරඞ්ගණෙ පොථෙන්තො තතො තතො ආකඩ්ඪී. සො පරිවත්තන්තො ථාමසා විස්සජ්ජෙතුං උස්සහන්තොපි විස්සජ්ජෙතුං නා'සක්ඛි.

03. පහත දැක්වෙන නිපාත පද යොදා දිගු වාක්‍ය නිර්මාණය කරන්න.

එවං, සචෙ, ඉධ, අථ, තතො, පන, තත්‍ථ, වා, ච, කථං

පාඩම 11 - වාක්‍ය පරිවර්තනය - 1

නිපුණතාව : 5.0 නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 5.1 කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.
5.2 මාධ්‍ය භාෂාගත කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය පාලි භාෂාවට නගයි.
5.4 සරල පාලි වාක්‍ය කාලත්‍රයට හරවා මාධ්‍ය භාෂාවට නගයි.

කාලච්ඡේද : 09 යි.

ඉගෙනුම් පල :
- කාලත්‍රයට අයත් සරල පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.
- කාලත්‍රයට අයත් මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවට නගයි.
- කාලත්‍රයට හා ඒකවචන, බහුවචන බවට හරවමින් වාක්‍ය පරිවර්තනය කරයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :
- සිසුන් එළිමහනට කැඳවාගෙන යන්න.
- පරිසරයේ සිදුවන දේ සරල පාලි වාක්‍යවලින් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.

  නිදසුන් : ඵලානි පතන්ති. (ගෙඩි වැටෙයි.)
  පුප්ඵානි විකසන්ති. (මල් පිපෙයි.)
  පණ්ණානි සුස්සන්ති. (කොළ වියැළෙයි.)
  පුප්ඵානි මිලායන්ති. (මල් මැලවෙයි.)
  ලතායො කම්පන්ති. (වැල් සෙලවෙයි.)
- අනතුරු ව එම වාක්‍ය සිංහල භාෂාවට නගන්නට උපදෙස් දෙන්න.
- පාලි හා සිංහල භාෂා දෙක ම ප්‍රගුණ කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1
- ඇමුණුම 01 යොදා ගනිමින් කර්තෘ, කර්ම, ක්‍රියා සහිත කාලත්‍රයට අයත් පාලි වාක්‍යවල විභක්ති අර්ථ සැලැකිල්ලට ගෙන ඒවා විවිධ අයුරින් සිංහල භාෂාවට පරිවර්තනය වන ආකාරය පැහැදිලි කරන්න.
- එම පාලි වාක්‍යවල ආඛ්‍යාතය වෙනස් කිරීමෙන් කාලත්‍රයට හරවා මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීමේ දී පිළිපැදිය යුතු රීති සාකච්ඡා කරන්න.
- ඇමුණුම 02හි වගුව ඇසුරු කර ගනිමින් කාලත්‍රයට අයත් පාලි වාක්‍ය සිංහලයට පරිවර්තනය කිරීමේ දී ආඛ්‍යාතයෙහි සිදුවන වෙනස්කම් පෙන්වා දෙන්න.
- පෙළ පොතේ අදාළ පාඩම කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- පෙළ පොතේ ඇති වාක්‍යවලට සමාන වෙනත් වාක්‍ය පාලි භාෂාවෙන් හා සිංහල භාෂාවෙන් ලියන්නටත් ඒවා පරිවර්තනයටත් අවස්ථාව දෙන්න.

මූලික වදන් සංකල්පඃ
- **විභක්ති හා විභක්ති අර්ථඃ**

  නාමයක් විවිධාර්ථවලට බෙදා දක්වනුයේ විභක්ති මගිනි. ඒ ඒ විභක්තිවලට සමාන මෙන් ම විවිධ වූ අර්ථ ද පවතී. ඒවා විභක්ති අර්ථ නම් වේ.

ඇගයීම හා තක්සේරුකරණය :

- කාලත්‍රයට අයත් සරල පාලි වාක්‍ය නියමිත රීතිවලට අනුව සිංහලයට නැගීම
- කාලත්‍රයට අයත් මාධ්‍ය භාෂාගත වාක්‍ය නිවැරදි රීති අනුගමනය කරමින් පාලියට නැගීම
- පාලි වාක්‍යවල යෙදී ඇති විභක්ති අර්ථ සූචක නාම අර්ථ අනුව භාවිත කිරීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01, 02, 03
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජුසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය 01, 02
- පාලි රචනා 01, 02
- පාලි කථාමඤ්ජුසා
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

- භික්ඛු ධම්මං දෙසෙති. (භික්ෂුව දහම් දෙසයි).
- සො **ධම්මං** පරිහාසි. (ඔහු **දහමට** අපහාස කළේය).
- වානරා **රුක්ඛං** ආරුහිස්සන්ති. (වඳුරෝ **ගසට** නගින්නාහ).
- මනුස්සා **රුක්ඛං** ඡින්දිංසු. (මිනිස්සු **ගස** කැපූහ).
- අහං **වනං** ගච්ඡිස්සාමි. (මම **වනයට** යන්නෙමි).
- මනුස්සා **වනං** විනාසෙන්ති. (මිනිස්සු **වනය** විනාශ කරති).
- සො **මං** අක්කොච්ඡි. (ඔහු **මට** බැන්නේය).
- මාතා **මං** අතොසයී. (මව **මා** සතුටු කළාය).
- කස්සකා **ඛෙත්තං** ගච්ඡන්ති. (ගොවියෝ **කුඹුරට** යති).
- කස්සකා **ඛෙත්තං** වපන්ති. (ගොවියෝ **කුඹුර** වපුරති).

ඇමුණුම 02

වර්තමාන කාල වාක්‍ය	අනාගත කාල වාක්‍ය	අතීත කාල වාක්‍ය
මාතා භත්තං දදාති. (මව බත් දෙයි.)	මාතා භත්තං දදිස්සති. (මව බත් දෙන්නීය.)	මාතා භත්තං දදි. (මව බත් දුන්නාය.)
දාරිකා පුප්ඵානි ඔචිනාති. (දැරිය මල් කඩා රැස්කරයි.)	දාරිකා පුප්ඵානි ඔචිනිස්සති. (දැරිය මල් කඩා රැස්කරන්නීය.)	දාරිකා පුප්ඵානි ඔචිනි. (දැරිය මල් කඩා රැස්කළාය.)
කුමාරිකා පාඨසාලං ගච්ඡති. (කුමරිය පාසලට යයි.)	කුමාරිකා පාඨසාලං ගච්ඡිස්සති. (කුමරිය පාසලට යන්නීය.)	කුමාරිකා පාඨසාලං ගච්ඡි. (කුමරිය පාසලට ගියාය.)
සස්සු ධීතරානං ඔවදති. (නැන්දා දූවරුන්ට අවවාද කරයි.)	සස්සු ධීතරානං ඔවදිස්සති. (නැන්දා දූවරුන්ට අවවාද කරන්නීය.)	සස්සු ධීතරානං ඔවදි. (නැන්දා දූවරුන්ට අවවාද කළාය.)
මාතාමහී භික්ඛුං වන්දති. (මිත්තණිය භික්ෂුවට වඳියි.)	මාතාමහී භික්ඛුං වන්දිස්සති. (මිත්තණිය භික්ෂුවට වඳින්නීය.)	මාතාමහී භික්ඛුං වන්දි. (මිත්තණිය භික්ෂුවට වැන්දාය.)

පාඩම 12 - වාක්‍ය පරිවර්තනය - 11

නිපුණතාව : 5.0 නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 5.3 උපසර්ග හා නිපාත පද යොදා වාක්‍ය දිගු කොට අලංකාර ව ලියා මාධ්‍ය භාෂාවට නගයි.

කාලච්ඡේද : 06 යි.

ඉගෙනුම් පල :

- නියමිත නිපාතවලට අදාළ විභක්ති භාවිත කරමින් වාක්‍ය පරිවර්තනය කරයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :

- පෙර දැනුම ඇසුරෙන් නිපාත සහ උපසර්ග සහිත වචන ඇතුළත් පාලි වාක්‍ය කීපයක් හුණු පුවරුවේ ලිවීමට සිසුන් කිහිප දෙනකුට අවස්ථාව දෙන්න.
- එම වාක්‍ය සිංහලට පරිවර්තනය කරවන්න.
- අලංකරණවලට සහ අර්ථයට හානියක් නො වන සේ පරිවර්තනයේ යෙදීමට වගබලා ගැනීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

පාඩම සංවර්ධනය :

- ඇමුණුම 01 සිසුන්ට සපයන්න.
- පාලියෙහි නිතර යෙදෙන නිපාත පද කිහිපයක් නිවැරදි සිංහල අර්ථය ද සමග ගෙන ඒවා වාක්‍යවල යෙදී ඇති අයුරු පෙන්වා දෙන්න.
- උපසර්ග සහිත ක්‍රියා පද යෙදී ඇති පාලි වාක්‍ය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමේ දී උපසර්ග පදවලින් සූචනය වන විවිධාර්ථ මතු කරන ආකාරය පහත සඳහන් නිදසුන ප්‍රකාර ව පෙන්වා දෙන්න.

  නිදසුන - භික්ඛු ගාමං **ගච්ඡති.** (භික්ෂුව ගමට යයි.)
  සො පුන විහාරං **ආගච්ඡති.** (හෙතෙම නැවත විහාරයට පැමිණෙයි.)
  පුත්තො පිතරං **අනුගච්ඡති.** (පුතා පියා අනුව යයි.)
  උපාසකො ධම්මං **අධිගච්ඡති.** (උපාසකයා ධර්මය අවබෝධ කරයි.)
  සකුණො නිඩ්ඩාය **නිග්ගච්ඡති.** (කුරුල්ලා කුඩුවෙන් නික්මෙයි.)
  දායකො භික්ඛුං **උපගච්ඡති.** (දායකයා භික්ෂුව සමීපයට යයි.)

- පෙළ පොතේ අදාළ පාඩම යොදා ගනිමින් විවිධ නිපාත සහ උපසර්ග පරිවර්තනය වී ඇති අයුරු පැහැදිලි කරන්න.
- නිපාත නාම විභක්තිවලට අනුව වරනැගීම සිදු නො වුව ද පාලියෙහි යෙදී ඇති ඇතැම් නිපාත පද මගින් විභක්ති අර්ථ වාච්‍ය වන ආකාරය සාකච්ඡා කරන්න.
- පරිවර්තන කාර්යයේ දී එම අර්ථ නිවැරදි ව මාධ්‍ය භාෂාවට හරවා ගැනීමේ වැදගත්කම පෙන්වා දෙන්න.
- ඇමුණුම 01 පරිදි සරල පාලි වාක්‍ය නිවැරදි ව මාධ්‍ය භාෂාවට පරිවර්තනය කළ යුතු ආකාරය පැහැදිලි කරමින් සිසුන්ට වාක්‍ය පරිවර්තනය කිරීමට අවස්ථාව දෙන්න.
- '**කිං?** (කුමක් ද?) **කථං?** (කෙසේ?) **කුහිං?** (කොහි ද?) **කච්චි?** (කෙසේ?) **කදා?** (කවදා ද?) **කත්ථ?** (කොහි ද?)' යනාදි ප්‍රශ්නවාචක නිපාත පද යෙදී ගොඩනැගී ඇති පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීමේ දී එම නිපාතයන්ගේ කේවල අර්ථ අවබෝධ කර ගැනීම නිවැරදි පරිවර්තනය සඳහා උපයෝගී වන අයුරු පෙළ පොත ඇසුරෙන් පහදන්න.

- **කිං?කථං? කුහිං? කච්චි? කදා? කත්ථ?** ආදි නිපාත පද ඇතුළත් පාලි වාක්‍ය සිංහලට නැගීමට අවස්ථාව දෙන්න.
- ඇතැම් නිපාත පද හේතුවෙන් පාලියෙහි සුවිශේෂ වාක්‍ය රටා නිර්මාණය වන බව '**මා නිපාත යෝගය**' ඇසුරෙන් පෙන්වා දෙන්න.
- 'මා නිපාත යෝගය' තහවුරු කිරීම සඳහා සුදුසු පාලි වාක්‍ය සපයා ඒවා සිංහල භාෂාවට පරිවර්තනය කරවන්න.
- ඇමුණුම 02 අභ්‍යාසය කෙරෙහි සිසුන් යොමු කරන්න.

මූලික වදන් සංකල්ප :

- **උපසර්ග**

  පදයක මුලින් පමණක් යෙදී එහි අර්ථය විෂයයෙහි විවිධාකාරයෙන් බලපෑම් කරන ගණනින් 20ක් වන පද විශේෂය මෙනමින් හැඳින්වේ.

- **නිපාත**

  නාමයක් මෙන් විභක්තිවල වර නො නැගී වාක්‍යයක මුල, මැද, අග යෙදී විවිධ අර්ථ ප්‍රකාශ කරන පද විශේෂය නිපාත නම් වේ. නිපාත පද නිර්මාණය වන බැවින් උපසර්ග පද මෙන් සීමාවක් දැක්විය නො හැකි ය.

ඇගයීම හා තක්සේරුකරණය :

- පාලි භාෂාවේ යෙදී ඇති උපසර්ග හා නිපාත පදවල අර්ථයන්ට හානි නො වන සේ පාලි වාක්‍ය සිංහලට පරිවර්තන කිරීම
- නිපාත හා උපසර්ග යෙදීමෙන් ගොඩනැගෙන පාලි විශේෂ වාක්‍ය රටා පැහැදිලි කිරීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01 සහ 02
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය 01, 02
- පාලි රචනා 01, 02
- පාලි කථාමඤ්ජූසා
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

නිපාතපද	සිංහල අර්ථය	නිපාතපද	සිංහල අර්ථය
වා	හෝ	එවං	මෙසේ
සද්ධිං	සමග	අද්ධා	ඒකාන්තයෙන්
සහ	සමග	පුන	නැවත
සචෙ	ඉදින්	යාව	යම්තාක්
සකිං	වරක්	තාව	ඒතාක්
සායං	හවස	යදා	යම් කලෙක
ආම	එසේය	තදා	එකල
ඉධ	මෙහි	කදා	කවදා
එත්ථ	මෙහි	කුහිං	කොහි
තත්ථ	එහි	සුවෙ	හෙට
තත්‍ර	එහි	සදා	හැමදා
පාතො	උදෑසන	පච්ඡා	පසුව
දිවා	දවල්	අන්තො	ඇතුළේ
අජ්ජ	අද	උපරි	මත්තෙහි
හීයො	ඊයේ	අථ	ඉක්බිති
අථවා	නැතහොත්	සණිකං	හෙමින්
යථා	යම්සේ	තථා	එසේ
යහිං	යම් තැනක	අන්තරා	අතරෙහි
ඉතො	මෙයින්	තිරියං	සරස
සමන්තා	හාත්පස	එකදා	එක්කලෙක
තතො	එයින්	කුතො	කොයින්

ඇමුණුම 02

01. පහත ඡේදයෙහි එන නිපාත පද පහක් (05) උපුටා ගෙන අලුත් වාක්‍ය නිර්මාණය කරන්න.

එවං වුත්තෙ අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටිච්ඡන්නං වා විවරෙය්‍ය. මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය. අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසා'හං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණංගතන්ති.

02. පහත සඳහන් පදවල උපසර්ග වෙන් කොට අර්ථ දක්වන්න.

පද	උපගර්ගය	අර්ථය
විහරති		
නිවාසෙත්වා		
පග්ගහිතා		
නිවෙසනං		
උපසඞ්කමි		
ආගච්ඡන්තං		
පරිරුන්ධති		
නිග්ගාහකො		
පදිස්සති		
පටිච්ඡන්නෙන		
පටිපූජෙති		
උපට්ඨීතෙ		
පබ්‍රැති		
අවජානති		
පරිභාසති		
පටිජානති		
විජානාථ		
සුදුල්ලභං		
දුග්ගතිං		
නිවාරෙති		
සමුපාගතං		
පරිබ්බාජං		
අභික්කන්තං		
නික්කුජ්ජිතං		
උක්කුජ්ජෙයා		
උපාසකං		

පාඩම 13 - පාලි පාඨ හා වරනැඟීම් වාචෝද්ගත කිරීම - 1

නිපුණතාව : 6.0 නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැඟීම් වාචෝද්ගත කරයි.

නිපුණතා මට්ටම : 6.1 නිර්දිෂ්ට පාලි පාඨ, ගාථා, සූත්‍ර හා වරනැඟීම් මතකයෙන් ප්‍රකාශ කරයි.
6.2 නිර්දිෂ්ට පාලි පාඨ, ගාථා, සූත්‍ර හා වරනැඟීම් මතකයෙන් ලියයි.

කාලච්ඡේද : 15 යි.

ඉගෙනුම් පල :
- නිර්දිෂ්ට පාලි පාඨ, සූත්‍ර, පිරිත්, ගාථා හා වරනැඟීම් නිවැරදි ව මතකයෙන් කියයි.
- නිර්දිෂ්ට පාලි පාඨ, සූත්‍ර, පිරිත්, ගාථා හා වරනැඟීම් නිවැරදි ව මතකයෙන් ලියයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :
- අත්ත රාජ ගුණවන්තු වැනි නාම සහ වත්තමානා භවිස්සන්ති හා අජ්ජතනී ආඛ්‍යාත මතකයෙන් වරනැඟීමට දන්නා ශිෂ්‍යයන්ට ඒ සඳහා අවස්ථාව දෙන්න.
- එම පෙර දැනුම තහවුරු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සියලු විභක්ත්‍යර්ථ ඔස්සේ නාම හා ආඛ්‍යාත වරනැඟීම තුළින් භාෂා ව්‍යවහාරයේ ප්‍රවීණත්වය සහ ව්‍යක්ත බව ලබා ගත හැකි බව පැහැදිලි කරන්න.

පාඩම සංවර්ධනය :

පියවර 01
- මීට පෙර උගත් **නාම වරනැඟීම** පාඩම් සහ පෙළ පොත කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- එම නාම වරනැඟීම් නිවැරදි ව මතකයෙන් ලිවීමට, වගුගත කිරීමට හා ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- මීට පෙර උගත් **ආඛ්‍යාත වරනැඟීම** පාඩම් සහ පෙළ පොත කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- පෙළ පොතේ එන නියමිත ආඛ්‍යාත විභක්තිවල ප්‍රත්‍යයමාලා වාචෝද්ගත කරන්නටත් වගුගත කොට ලියා දැක්වීමටත් සිසුන් යොමු කරන්න.
- ගුරුවරයාගේ සහායක් නොමැති ව වරනැඟීම් ලියා දැක්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- කණ්ඩායම් වශයෙන්, සාමූහික වශයෙන් සහ කේවල වශයෙන් නිර්දිෂ්ට වරනැඟීම් පුන පුනා කියමින් වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.

පියවර 02
- සතර කමටහන් සහ අට්ඨසංවෙගවත්‍ථු මතකයෙන් ප්‍රකාශ කිරීමටත් ලියා දැක්වීමටත් සිසුන් යොමු කරන්න.
- ඒවා කණ්ඩායම් වශයෙන්, සාමූහික වශයෙන් සහ කේවල වශයෙන් පුන පුනා කියමින් වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.
- පන්තියේ එක් කෙළවරක සිට අරඹා නිර්දිෂ්ට සූත්‍ර හා සූත්‍ර වෘත්ති පාඨයෙන් පාඨය මතකයෙන් ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.

පියවර 03
- **බාලාවතාර සන්‍ධි කාණ්ඩය** සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එහි එන සූත්‍ර හා සූත්‍ර වෘත්ති සිසුන් සමග සාමූහික ව උච්චාරණය කරන්න.

- අදාළ සූත්‍ර තනි තනි ව ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- එම සූත්‍ර වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.
- ඇමුණුම 01 අභ්‍යාස කිරීමට සිසුන් යොදවන්න.

ඇගයීම හා තක්සේරුකරණය :

- අදාළ නාම හා ආඛ්‍යාත මතකයෙන් නිවැරදි ව වරනැගීම, වගුගත කර දැක්වීම
- අදාළ පාලි සූත්‍ර පාඨ හා ගාථා මතකයෙන් ප්‍රකාශ කිරීම, ලිවීම
- බාලාවතාර සන්ධි කාණ්ඩයේ සූත්‍ර වෘත්ති මතකයෙන් ප්‍රකාශ කිරීම, ලිවීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01
- පෙළ පොත
- බාලාවතාරයේ සන්ධි කාණ්ඩය

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය දෙවන පොත
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

01. පහත සඳහන් ගාථා සම්පූර්ණ කරන්න.

- බුද්ධානුස්සති මෙත්තා ච අසුභං මරණස්සති,
  ....
- සබ්බකාලගතෙ ධම්මෙ සබ්බෙ සම්මා සයං මුනි,
  ....
- අනෙකෙහි ගුණොඝෙහි සබ්බසත්තුත්තමො අහු,
  ....
- පඤ්ඤා'ස්ස සබ්බධම්මෙසු කරුණා සබ්බජන්තුසු,
  ....
- දිස්සමානො'පි තාවස්ස රූපකායො අචින්තියො,
  ....

02. පහත සඳහන් ගාථා සම්පූර්ණ කරන්න.

- අත්තූපමාය සබ්බෙසං ....
  පස්සිත්වා කමතො මෙත්තං ....
- සුඛී භාවෙය්‍ය නිද්දුක්ඛො ....
  හිතා ච මෙ සුඛී හොන්තු ....
- ඉමම්හි ගාමක්ඛෙත්තම්හි ....
  තතො පරඤ්ච රජ්ජෙසු ....
- සමන්තා චක්කවාළෙසු ....
  සුඛිනො පුග්ගලා භූතා ....
- තථා ඉත්ථී පුමා චෙව ....
  දෙවා නරා අපායට්ඨා ....

ඇමුණුම 02

01. පහත සඳහන් බාලාවතාර සූත්‍ර පාඨ සම්පූර්ණ කරන්න.

- පුබ්බමධොඨිතමස්සරං ....
- සරා................................ ....
- .... යුත්තෙ.
- වා පරො ....
- .... ලුත්තෙ.
- ඉවණ්ණො................................ ....
- .... ය්‍යානෙ.
- .... වාගමා.
- අබ්භො................................
- ලොපඤ්ච................................
- වග්ගෙ ඝොසා ....
- වග්ගන්තං .... වග්ගෙ.
- ස................................ ....
- .... වා සරො.
- බ්‍යඤ්ජනො ච................................

පාඩම 14 - පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කිරීම - 11

නිපුණතාව : 6.0 නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි.

නිපුණතා මට්ටම : 6.3 නිර්දිෂ්ට ගාථා, සූත්‍ර හා පිරිත් ගණ සජ්ඣායනය කරයි.

කාලච්ඡේද : 10 යි.

ඉගෙනුම් පල :

- නිර්දිෂ්ට ගාථා පාඨ නිවැරදි ව සජ්ඣායනය කරයි.
- නිර්දිෂ්ට සූත්‍ර හා පිරිත් ගණ සජ්ඣායනය කරයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :

- නියමිත පිරිත් කොටසක් තනි ව සජ්ඣායනයට ශිෂ්‍යයකුට අවස්ථාව දෙන්න.
- එම පිරිත් කොටස ම ගණ සජ්ඣායනයට පිරිසකට අවස්ථාව දෙන්න.
- මෙම අවස්ථා දෙකෙහි ඇති වෙනස පිළිබඳ කරුණු සාකච්ඡා කරන්න.
- ගණ සජ්ඣායනයේ දී ඇති වන ධ්වනි මාධුර්යය, සමූහයකගේ චිත්ත ඒකාග්‍රතාවක වටිනාකම සහ අඛණ්ඩ ව පවත්වා ගෙන යාමේ සෞන්දර්යය සාකච්ඡා කරන්න.

පාඩම සංවර්ධනය :

- මහාපිරුවාණා පොත් වහන්සේ පන්තියට ඉදිරිපත් කරන්න.
- පිරිත් සජ්ඣායනය කිරීමේ දී වැරදි උච්චාරණය තුළින් සිදුවන හානිය හා ඉන් බුද්ධභාෂිතයට වන විකෘතිය සහ අගෞරවය අවධාරණය කර පෙන්වන්න.
- පිරිත් සජ්ඣායනය කිරීමේ දී නිවැරදි උච්චාරණය ඉතා වැදගත් වන බව හා ඉන් ලබා ගත හැකි සුවිසල් ආශිර්වාදය පිළිබඳ කියා දෙන්න.
- සාම්ප්‍රදායික නිවැරදි සජ්ඣායනා ක්‍රම සහිත පිරිත් දේශනා ඇතුළත් වන හඬ පටයක් ඇසීමට සලස්වා රිද්මයානුකූල ව හා නිවැරදි ව ගාථා, සූත්‍ර හා පිරිත් වාචෝද්ගත කර ගැනීමේ වැදගත්කම පහදන්න.
- පළමු ව පන්තියේ එක් කෙළවරක සිට අරඹා කොටසින් කොටස මතකයෙන් සම්බන්ධ කරමින් අඛණ්ඩ ව ගාථා, සූත්‍ර හා පිරිත් සජ්ඣායනයට අවස්ථාව සලසා දෙමින් වාචෝද්ගත කරවන්න.
- අනතුරු ව කණ්ඩායම් වශයෙන් ද, සාමූහික ව ද, සජ්ඣායනා කරවන්න.
- එකිනෙකාගේ හඬ අඩුවැඩි වන අයුරින් සජ්ඣායනා කිරීමට වඩා ගණසජ්ඣායනයේ දී සාමූහික ව එකිනෙකාගේ හඬ ඉස්මතු නො වන පරිදි කීම තුළින් එහි ඇති ශ්‍රැති ගෝචරත්වය හා මාධුර්යයත් ප්‍රායෝගික ව අත්විඳීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.
- පිරිත් දේශනාවල ඇති ආශිර්වාදය, ආරක්ෂාව සහ නිවැරදි භාවිතයේ අවශ්‍යතාව පිළිබඳ බුද්ධිමණ්ඩල සාකච්ඡාවක් පැවැත්වීමට සිසුන් යොමු කරන්න.
- ඇමුණුම 01හි අභ්‍යාස සිසුන්ට ලබා දෙන්න.

ඇගයීම හා තක්සේරුකරණය :

- පිරුවාණා පොත් වහන්සේ පරිශීලනය කරමින් නිර්දේශිත පිරිත් තෝරා ගැනීම
- නිර්දිෂ්ට පිරිත් පාඨ හා ගාථා නිවැරදි ව උච්චාරණය කරමින් මතකයෙන් ප්‍රකාශ කිරීම
- පිරිත් සූත්‍ර මතකයෙන් ලියා දැක්වීම
- සාමූහික ව එකිනෙකාගේ හඬ ඉස්මතු නො වන පරිදි ගණසජ්ඣායනය

- පිරිත් දේශනාවල ඇති ආශීර්වාදය, ආරක්‍ෂාව සහ නිවැරදි භාවිතයේ අවශ්‍යතාව පිළිබඳ බුද්ධිමණ්ඩල සාකච්ඡාවක් පැවැත්වීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01
- පිරුවාණා පොත් වහන්සේ
- අදාළ පිරිත් දේශනා ඇතුළත් සංයුක්ත තැටි
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- චතුභාණවාරපාළි
- පිරුවාණා පොත් වහන්සේ

ඇමුණුම 01

01. පහත සඳහන් ගාථාවල හිස්තැන් පුරවන්න.

- භාවෙත්වා .... ආවජ්ජෙය්‍ය ....,
  මහාසංවෙගවත්ථූනි අට්ඨ.................................
- ජාතිජරාව්‍යාධි................................. අතීතඅප්පත්තක.................................,
  ඉදානි ආහාරගවෙට්ඨිදුක්ඛං................................. ඉමානි අට්ඨ.

- පාතො ච සායම'පිචෙව ඉමං ....
  ආසෙවතෙ සතතමත්ත.................................,
  .... සො'ති විපුලං හතපාරිපන්ථො
  සෙට්ඨං සුඛං .... සුඛෙන චා'ති.

02. පහත සඳහන් ගාථා සම්පූර්ණ කරන්න.

- ....,
  කායං අසුභතො පස්සං අසුභං භාවයෙ සති.
- ....,
  පටික්කුලානි කායෙ මෙ කුණපානි ද්විසොළස.
- ....,
  නානාකිමිකුලා'වාසො පක්කචන්දනිකා විය.
- ....,
  තථා අහං මරිස්සාමි මරණං මම හෙස්සති.
- ....,
  මරණත්ථාය ඔකාසං වධකො විය එසති.

පාඩම 15 - සන්ධි

නිපුණතාව : 7.0 පාලි භාෂාවේ සන්ධි හඳුනාගෙන භාවිත කරයි.

නිපුණතා මට්ටම : 7.1 පාලි භාෂාවේ සන්ධි හඳුන්වා සන්ධි ප්‍රයෝජන දක්වයි.
7.2 සන්ධි කාර්යය හඳුන්වා නිදසුන් සපයයි.
7.3 සන්ධි ප්‍රභේද නම් කොට, කෙටියෙන් පැහැදිලි කරමින් නිදසුන් සපයයි.

කාලච්ඡේද : 12 යි.

ඉගෙනුම් පල :

- සන්ධි යනු මොනවා දැයි හඳුන්වයි.
- සන්ධි ප්‍රයෝජන ලියයි.
- සන්ධි කාර්යය ලියයි.
- ඒ ඒ සන්ධි කාර්යයට නිදසුන් සපයයි.
- සන්ධි ප්‍රභේද නම් කරයි.
- නිර්දිෂ්ට කෘතිවලින් සන්ධි පද උපුටා ලියයි.
- ඒ ඒ සන්ධි ප්‍රභේදය හඳුන්වා නිදසුන් සපයයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :

- වඩු මඩුවක මේසයක් සාදන දර්ශනයක් පිළිබඳ සාකච්ඡා කරන්න.
- **'සන්ධි නැත්නම් මේසයක් නැත'** මේ ප්‍රකාශය ඉදිරිපත් කරන්න.
- වඩුවා විසින් ගැළපෙන ලී ගෙන උපකරණ භාවිතයෙන් එය සකසන අයුරු විමසන්න.
- වඩුවා මේසය සෑදීමට අවශ්‍ය ලී වර්ග සුදුසු පරිදි තෝරා ගනිමින්, කපා ලියවා ඇණ ආදිය උපයෝග කරගෙන මේසය සකසන්නාක් මෙන් භාෂාවක දී ද ගැළපෙන වචන ගෙන අනවශ්‍ය අකුරු කපා(**ලෝප**) නො ගැළපෙන අකුරු වෙනුවට ගැළපෙන අකුරු වෙනත් තැන්වලින් ගෙන(**ආදේශ**) හෝ අමුතුවෙන් අකුරු යොදවා(**ආගම**) පද සන්ධි කරමින් සුමට පද නිර්මාණය කරන අයුරු පැහැදිලි කරන්න.
- සන්ධි පදවලින් භාෂාවක ඇති වන සුඛෝච්චාරණය පෙන්වා දෙන්න.
- සිසුන් දන්නා එවැනි සන්ධි පද ඉදිරිපත් කරවන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1

- සන්ධියක් යනු කුමක් දැයි පෙර දැනුම ඇසුරෙන් සාකච්ඡා කරන්න.
- සන්ධි කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන සනිදර්ශන ව පෙන්වා දෙන්න.
- පෙළ පොතේ සන්ධි ඇතුළත් පාඩම්වලට සිසු අවධානය යොමු කරවමින් සන්ධි කාර්යය සාකච්ඡා කරන්න.
- පද දෙකක් සන්ධි කිරීමට උපයෝගී කරගන්නා **'සන්ධි විධි'** නිදසුන් සමගින් සාකච්ඡා කරන්න.
- පෙළ පොත යොදා ගනිමින් ස්වර, ව්‍යඤ්ජන හා නිග්ගහීත සන්ධි ප්‍රභේදවලට නිදසුන් සොයා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ස්වර, ව්‍යඤ්ජන හා නිග්ගහීත සන්ධි ප්‍රභේදවලට අයත් පද විසන්ධි කර පෙන්වමින් ඇමුණුම 01හි අඩංගු 'අනිත්ථිගන්ධකුමාර' කථා වස්තුවේ ඇතුළත් සන්ධි පද උපුටා විසන්ධි කරමින් එහි දී ඇති වගුව සම්පූර්ණ කිරීමට සිසුන් මෙහෙයවන්න.

- විසන්ධි පද කිහිපයක් ලබා දී සන්ධි ප්‍රභේදය නම් කරමින් සන්ධි කිරීමේ තරගයක් සඳහා සිසුන් යොදවන්න.
- ඇමුණුම 02 අභ්‍යාස සඳහා සිසුන්ට අවස්ථාව දෙන්න.

මූලික වදන් සංකල්ප :

- **ස්වරසන්ධිය**
  සන්ධි වන පද දෙකේ පෙර පදයේ අග අකුර හා පසු පදයේ මුල් අකුර ස්වරයක් නම් එය ස්වර සන්ධියකි.
- **ව්‍යඤ්ජන සන්ධිය**
  සන්ධි වන පද දෙකේ පෙර පදයේ අග අකුර ස්වරයක් වී පසු පදයේ මුල් අකුර ව්‍යඤ්ජනයක් වේ නම් එය ව්‍යඤ්ජන සන්ධියකි.
- **නිග්ගහීත සන්ධිය**
  සන්ධි වන පද දෙකේ පෙර පදයේ අග අකුර නිග්ගහීතය වී පසු පදයේ මුල් අකුර ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් වී නම් එය ව්‍යඤ්ජනය සන්ධියකි.
- **බාහිර සන්ධි** - වෙන් වෙන් ව ඇති පද දෙකක් තුළ සිදු වන සන්ධිය
- **අභ්‍යන්තර සන්ධි** - තනි පදයක් තුළ සිදු වන සන්ධිය
- **ලෝප** - අකුරක් නො කියා අත්හැරීම
- **ආදේශ** - අකුරක් වෙනුවට වෙනත් අකුරක් පැමිණ වීම
- **ආගම** - සන්ධි වන පද දෙක අතරට අමුතුවෙන් අකුරක් පැමිණ වීම
- **හ්‍රස්ව** - දීර්ඝ ස්වරය හ්‍රස්ව ස්වරයක් බවට පත් වීම
- **දීර්ඝ** - හ්‍රස්ව ස්වරය දීර්ඝ ස්වරයක් බවට පත් වීම
- **ද්විත්ව** - එක අකුර දෙකක් බවට පත් වීම
- **ආරෝහණය** - හල් අකුරට ස්වර අකුරක් පැමිණ වීම
- **විපර්යාසය** - අක්ෂරවල ස්ථාන මාරු වීම

ඇගයීම හා තක්සේරුකරණය :

- සන්ධි හැඳින්වීම
- සන්ධි ප්‍රයෝජන ප්‍රකාශ කිරීම හා ලිවීම
- සන්ධි විධි උදාහරණ සහිත ව මතකයෙන් ප්‍රකාශ කිරීම හා ලිවීම
- සන්ධි ප්‍රභේද විස්තර කිරීම
- දෙනු ලබන ඡේදයකින් සන්ධි පද උපුටා විසන්ධි කිරීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01 සහ 02
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය 01, 02
- පාලි රචනා 01, 02
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

01. පහත දැක්වෙන ඡේදය ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න.

සො'පි පසන්නමානසො හුත්වා නිවත්තො, සද්ධිං වාණිජකෙහි තෙසු තෙසු ජනපදෙසු වණිජ්ජං පයොජෙන්තො මහාවත්තනියං නාම කන්තාරං පාපුණි. තත්ථ තෙසං සබ්බෙසුයෙව සකටෙසු පානීයං පරික්ඛයමගමාසි. තත්ථ සබ්බමනුස්සානඤ්ච බලිවද්දානඤ්ච පානීය නාහොසි. අථ සො වාණිජො පිපාසාභිභූතො තෙසු තෙසු සකටෙසු පානීයං පරියෙසන්තො විචරති. අථෙකස්මිං සකටෙ මනුස්සා තං දිස්වා කාරුඤ්ඤෙන එත්ථාගච්ඡ, ඉමස්මිං කොළම්බෙ ථොකං පානීයං අත්ථි, පිවා'ති වදිංසු. තතො සො ගන්ත්වා පානීයං පිවි. තස්ස තං රසං මුද්දිකපානරසසදිසං අහොසි. පිවන්තො'ව සො එවං චින්තෙසි. සම්මා සම්බුද්ධස්ස තදා මෙ දින්නමුද්දිකපානස්ස නිස්සන්දො අජ්ජ සම්පත්තො භවිස්සතීති අච්ඡෙරබ්භුතචිත්තො සොමනස්සජාතො ගන්ත්වා සයමෙව චාටියා පිධානං විවරි. සකලාපි සා චාටි මුද්දිකපානෙන පරිපුණ්ණා අහොසි. තතො සො රසවන්තං ඔජවන්තං අපරික්ඛයං දිබ්බපානසදිසං පානීයං දිස්වා පරමාය පීතියා ඵුටසරීරො උග්ඝොසෙසි, සබ්බෙ පානීයං පිවන්තූති. තං සුත්වා සබ්බෙ සන්නිපතිත්වා පානීයං දිස්වා අබ්භුතචිත්තා ජාතා. වාණිජො තෙසං මජ්ඣෙ බුද්ධානුභාවං පකාසෙන්තො ආහ.

සන්ධි පදය	විසන්ධි පදය	සන්ධි කාර්යය	සන්ධි නාමය

ඇමුණුම 02

01. පහත වාක්‍යවල ඇති විසන්ධිපද සන්ධි කර නැවත ලියන්න.

i. සද්ධා ඉධ විත්තං පුරිසස්ස සෙට්ඨං.
ii. සම්ම, ඉදානි අහං විහාරං ගන්ත්වා තයා කතපණ්ණසාලායං නිසින්නං ථෙරං දිස්වා ආගතො අම්හි.
iii. කො අපි ත්වං භන්තෙ ඉති? ථෙරස්ස භාගිනෙය්‍යො අම්හි ඉති.
iv. කරොමි තෙ තං වචනං, ත්වං අසි ආචරියො මම.
v. තං හි තස්ස සකං හොති. තං ච ආදාය ගච්ඡති.
vi. යදා අහං නගරං අගමාසිං, තදා එකො පුරිසො මම ඡත්තං ගණ්හි.
vii. අපි දිබ්බෙසු කාමෙසු රතිං සො න අධිගච්ඡති.
viii. බුද්ධො ඉති වචනං සෙට්ඨං, බුද්ධො ඉති පදං උත්තමං.
ix. සාමි බාරාණසියං දක්ඛිණද්වාරෙ මහානිග්‍රොධො අත්ථි. තත්ථ අහං වසාමි.
x. තථා උපමං ධම්මවරං අදෙසයි.

02. පහත සඳහන් සන්ධිපද විසන්ධි කර දක්වන්න.

කාමතො'ති	රොදතී'ති
කරිස්සාමා'ති	අඤ්ඤො'ති
නප්පතිට්ඨහිස්සති	අථස්ස
අනෙස්සාමා'ති	ආහරථා'ති
සහසා'ව	තමඤ්ඤං
නාලත්ථන්ති	කාලකතා'ති
ගාථමාහ	දෙසනාවසානෙ
සාධූති	සොළසවස්සුද්දෙසිකා
තෙපි	අභිරූපා'ති
වක්ඛන්තී'ති	සයම්පි
දුබ්බිනීතා'සි	ඉදානෙවාහං
සඤ්ඤමකාසිං	නාමෙතන්ති
ධීතා'ති	අග්ඝතී'ති
දස්සෙහී'ති	නිප්පභං
ආනෙථා'ති	කුමාරො'පි
කඤ්චනරූපකතො'පි	අත්ථී'ති
සවණ්ණවසෙනෙ'ව	ආනෙන්තු'ති
සා'පි	යානුග්ඝාතෙන
සමුප්පාදිත	අන්තරාමග්ගෙයෙ'ව
කාලමකාසි	ආගතාගතං

පාඩම 16 - සමාස

නිපුණතාව : 8.0 පාලි භාෂාවේ සමාස හඳුනාගෙන භාවිත කරයි.

නිපුණතා මට්ටම : 8.1 සමාස කෙටියෙන් හඳුන්වයි.
8.2 සමාස ප්‍රයෝජන පෙන්වා දෙයි.
8.3 සමාස ප්‍රභේද නම් කරයි.
8.4 නිදසුන බැගින් සපයමින් ඒ ඒ සමාස ප්‍රභේදය කෙටියෙන් පැහැදිලි කරයි.

කාලච්ඡේද : 06 යි.

ඉගෙනුම් පල :
- සමාස යනු මොනවා දැයි පැහැදිලි කරයි.
- සමාස ප්‍රයෝජන ලියා දක්වයි.
- සමාස ප්‍රභේද කර ලියයි.
- ඒ ඒ ප්‍රභේදයට නිදසුන බැගින් සපයයි.
- එක් එක් සමාස ප්‍රභේදය කෙටියෙන් හඳුන්වයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :
- පහත පාඨය හුණු පුවරුවේ ලියන්න.
  සමාසො පදසඞ්ඛෙපො(සමාස යනු පද සංක්‍ෂේපය යි.)
- එම පාඨයෙහි සරල සිංහල අදහස සිසුන් සමග සාකච්ඡා කරන්න.
- භාෂාවක සුබොච්චාරණය හා අලංකරණය සඳහාත් රිද්මය අවශ්‍ය තන්හි දීත් සමාසවලින් කෙරෙන මෙහෙවර පැහැදිලි කරන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1
- පෙළ පොත කෙරෙහි සිසු අවධානය යොමු කරවමින් සමාසවල කාර්යය කේවල වශයෙන් විමසන්න.
- ඇමුණුම 01 සිසුන්ට සපයා සමාස ප්‍රභේද හය පිළිබඳ සාකච්ඡා කරන්න.
- එක් එක් සමාස ප්‍රභේදය සඳහා කාලච්ඡේදයක් බැගින් යොදා ගනිමින් පහත ආකාරයට ඉගෙනුම් ඉගැවීම් කාර්යයේ නියැලෙන්න.
  - සමාස ප්‍රභේදය හඳුන්වා දීම
  - නිර්දිෂ්ට නිදසුන් ඇසුරෙන් අදාළ සමාස ප්‍රභේදය පැහැදිලි කිරීම
  - සමාස පදය සඳහා විග්‍රහ වාක්‍යය සාකච්ඡා කිරීම
  - සමාස පදය සහ විග්‍රහ වාක්‍යය සටහන් කිරීම
  - සමාස පදය සිංහලෙන් අර්ථ දැක්වීම
  - සමාස පදයක් හඳුනා ගන්නා ආකාරය පැහැදිලි කිරීම
  - අසමාස පද සමාස කර දැක්වීම
  - සමාස සහිත පාලි වාක්‍ය සිංහලටත් සිංහල වාක්‍ය පාලියටත් පරිවර්තනය කිරීම
- සමාස ප්‍රභේද 06 මතකයෙන් ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- ගුරුවරයා සමාස පදය ඉදිරිපත් කළ විට විග්‍රහ වාක්‍ය ප්‍රකාශ කිරීමටත් විග්‍රහ වාක්‍යය ඉදිරිපත් කළ විට සමාස පදය ප්‍රකාශ කිරීමටත් තරගයක් පවත්වන්න.
- ඇමුණුම 02 අභ්‍යාස කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

මූලික වදන් සංකල්ප :
- සමාස - පද සංක්ෂේප කිරීම සමාස යි.

ඇගයීම හා තක්සේරුකරණය :
- සමාස යනු කුමක් දැයි ප්‍රකාශ කිරීම
- සමාස හඳුන්වන **සමාසො පදසඞ්ඛෙපො** පාඨය මතකයෙන් ප්‍රකාශ කිරීම
- සමාස ප්‍රභේද 06 පිළිවෙළින් නම් කිරීම
- එක් එක් සමාසයකට උදාහරණයක් බැගින් දැක්වීම
- සමාස පදයක් හඳුනා ගන්නා ආකාරය ප්‍රකාශ කිරීම
- අසමාස පද සමාස කර දැක්වීම
- සමාස සහිත පාලි වාක්‍ය සිංහලටත් සිංහල වාක්‍ය පාලියටත් පරිවර්තනය කිරීම

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 01 සහ 02
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :
- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය දෙවන පොත
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

සමාස

පද දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකතු කොට එක පදයක් වශයෙන් කෙටි කොට දැක්වීම සමාස නම් වේ. එහි ප්‍රභේද හයකි.

01. **කම්මධාරය සමාසය** - ලිඞ්ග විභක්ති වචනවලින් සමාන වූ විශේෂණ විශේෂ්‍ය පද දෙකක් තනි පදයක් ලෙස කෙටි කිරීම කම්මධාරය සමාසය යි. **මහන්තො වීරො = මහාවීරො**
02. **දිගු සමාසය** - සංඛ්‍යා වාචී පදයක් විශේෂණය ලෙස යෙදී සිදුවන සමාසය යි.
    තයො ලොකා = තිලොකං
03. **තප්පුරිස සමාසය** - මෙහි දී සමාස වන මුල් පදය දුතියාවේ පටන් සත්තමිය තෙක් විභක්තියකට අයත් වන අතර එම විභක්ති අර්ථවලට ප්‍රධානත්වයක් ලැබේ.
    විකාලෙ භොජනං = විකාලභොජනං
04. **ද්වන්ද සමාසය** - එක ම විභක්තියකට අයත් නාමපද දෙකක් හෝ වැඩි ගණනක් එක ම පදයක් ලෙස දැක්වීම ද්වන්ද සමාසය යි. **දෙවා ච මනුස්සා ච = දෙවමනුස්සා**
05. **බහුබ්බීහි සමාසය** - සමාස වන පදවලින් පිටස්තර අන්‍ය අර්ථයක් සමාස වූ පදයෙන් ගෙන දීම මෙහි මූලික ලක්ෂණය යි. **දසබලානි යස්ස සො දසබලො = බුද්ධො**
06. **අව්‍යයීභාව සමාසය** - සමාසයේ මුල් පදය උපසර්ග හා නිපාතවලින් යුක්ත නම් එය අව්‍යයීභාව සමාසය යි. **හත්ථස්ස පච්ඡා = පච්ඡාහත්ථං**

ඇමුණුම 02

02. පහත සඳහන් සමාස පදවල සමාස ප්‍රභේදය හා අර්ථය දක්වන්න.

සමාස පදය	සමාස ප්‍රභේදය	අර්ථය
සරණගතො		
අන්‍ධබධිරො		
රාජභයං		
දුක්ඛප්පත්තො		
පත්තචීවරං		
ආගතමණො		
බහුතාපසො		
යාවජීවං		
චතුරඞ්ගුලං		
බහිනගරං		
චතුද්දිසා		
උපරිපාසාදං		
අග්ගමහෙසී		
සීහලදීපෙ		
භික්ඛුවෙසං		
රාජද්වාරෙ		
උපරාජා		
වුද්ධසසකස්ස		
වනවාසී		

සමාස පදය	සමාස ප්‍රභේදය	අර්ථය
පතිදිනං		
චතුප්පදා		
සුවපොතකො		
සකිරණකරා		
ගිරිකන්‍දර		
ජලජීවිනො		
නිබ්බිසො		
සච්චකිරියං		
අනත්තමනො		
ගෙහඞ්ගණෙ		
මාතාපිතරො		

පාඩම 17 - තද්ධිත

නිපුණතාව : 9.0 පාලි භාෂාවේ තද්ධිත හඳුනාගෙන භාවිත කරයි.

නිපුණතා මට්ටම : 9.1 තද්ධිත කෙටියෙන් හඳුන්වයි.
9.4 තද්ධිත ප්‍රයෝජන ලියා දක්වයි.
9.2 තද්ධිත ප්‍රභේද නම් කරයි.
9.3 ඒ ඒ තද්ධිත ප්‍රභේදයට නිදසුන බැගින් සපයයි.

කාලච්ඡේද : 06 යි.

ඉගෙනුම් පල :
- තද්ධිත හඳුන්වයි.
- තද්ධිතවල ප්‍රයෝජන මොනවා දැයි පෙන්වා දෙයි.
- තද්ධිත ප්‍රභේද ලියයි.
- ඒ ඒ තද්ධිත ප්‍රභේදයට නිදසුන බැගින් සපයයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :
- ඇමුණුම 01හි පිටු පෙරළනයේ පළමු වන පිටුවේ ඇති පහත ගාථාව සජ්ඣායනා කරන්න.
  සාමඤ්ඤ වුද්ධි භාවත්ථා - ව්‍යයතො තද්ධිතං තිධා
  තත්‍රාදි චතුධාපච්චා - නෙකත්තත්ථ්‍යා සබ්බතො
- පිටු පෙරළනයේ දෙවන පිටුවේ ඇති රුක් සටහන හා ගාථාව ගළපමින් එහි අර්ථය පැහැදිලි කර තද්ධිත ප්‍රත්‍යය ඉස්මතු කර පෙන්වන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1
- තද්ධිත පිළිබඳ ලියවුණු ගාථාව සිසුන් සමග සජ්ඣායනා කරන්න.
- තද්ධිත හඳුන්වා දෙමින් එහි සරලාර්ථය පැහැදිලි කර දෙන්න.
- තද්ධිත පදවල ප්‍රයෝජන පැහැදිලි කර දෙන්න.
- පිටු පෙරළනය සුදුසු පරිදි භාවිත කර තද්ධිත ප්‍රභේද නිදසුන් සහිත පෙන්වා දෙමින් තද්ධිත පද සාදාගන්නා ආකාරය පැහැදිලි කරන්න.
- පිටු පෙරළනයෙහි අංක 03 සිට 10 දක්වා ඇති තද්ධිත ප්‍රභේද කාඩ්පත් කට්ටලයක් සෑම ශිෂ්‍යයකු ලවා ම සකස් කරවන්න.
- එම කාඩ්පත්වල ඇති තොරතුරු සිසුන් ලවා කියවමින් ඒවා හුණුපුවරුව මත සමස්තය ගොඩනැගෙන පරිදි පිළිවෙළින් රඳවන්න.
- ඇමුණුම 02 ඇතුළත් තද්ධිතපද ලැයිස්තුව සිසුන්ට ලබා දෙන්න.
- ඒවා ඇත්තේ පෙළ පොතෙහි කවර ස්ථානයක දැයි ගවේෂණයට සිසුන්ට අවස්ථාව දෙමින් පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා තත්පර ගණනක් තුළ ගුරු භවතා නම් කරන තද්ධිත පදය පෙළ පොතින් සොයා දැක්වීමේ තරගයක් පවත්වන්න.
- පෙළ පොතේ අදාළ පාඩමේ ඇති තද්ධිත පද කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- ඇමුණුම 03 අභ්‍යාස සඳහා සිසුන් යොමු කරන්න.

මූලික වදන් සංකල්ප :
- **තද්ධිත :** ප්‍රත්‍යයාර්ථ නාම විශේෂයකි. නාමයකට අගින් ඊට හිතවත් වූ ප්‍රත්‍යය එක්කොට සාදා ගන්නා පද විශේෂයකි.

ඇගයීම හා තක්සේරුකරණය :

- තද්ධිත යන්න නිර්වචනය කිරීම
- තද්ධිත ප්‍රයෝජන ලියා දැක්වීම
- තද්ධිතයේ ප්‍රධාන ප්‍රභේදවලට නිදසුන් දැක්වීම
- සාමඤ්ඤ තද්ධිතයේ අනු කොටස් හතර නම් කිරීම හා නිදසුන් ඉදිරිපත් කිරීම
- පෙළ පොතේ ඇති තද්ධිත පද උපුටා දැක්වීම හා ඒවායේ අර්ථය ප්‍රකාශ කිරීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01 අනුව සකස් කරගත් පිටු පෙරළනය, ඇමුණුම 02 සහ 03
- කාඩ්පත් කට්ටල සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය දෙවන පොත
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

පිටු පෙරළනය

- පිටුව 01

සාමඤ්ඤ වුද්ධි භාවත්ථා - ව්‍යයතො තද්ධිතං තිධා
තත්‍රාදි චතුධාපච්චා - නෙකත්තත්ථ්‍යත්ථ සබ්බතො

- පිටුව 02



- පිටුව 03

තද්ධිත හැඳින්වීම

නාමයකින් පර ව විවිධ අර්ථයන්හි නොයෙක් ප්‍රත්‍යය යෙදී සෑදෙන නාම සමූහය තද්ධිත නම් වේ.
උදා: සමණ + ණෙර = සාමණෙර (සාමණේර තෙම)
ගුණ + වන්තු = ගුණවන්තු (ගුණ ඇති)
සබ්බ + දා = සබ්බදා (හැමකල්හි)

- **පිටුව 04**

තද්ධිත ප්‍රභේද
තද්ධිත නාම ප්‍රධාන වශයෙන් කොටස් තුනකට (03) බෙදේ.
1. සාමඤ්ඤ තද්ධිත
2. භාව තද්ධිත
3. අව්‍යය තද්ධිත

- **පිටුව 05**

ප්‍රභේදය - අපච්චත්‍ථ තද්ධිතය
යම් කෙනකුගේ දරුවෙක් යන අර්ථ පැවසෙයි. **ණ, ණායන** ආදි ප්‍රත්‍යය යෙදේ.

උදාහරණ

නාමය	ප්‍රත්‍යය	තද්ධිත පදය	තේරුම
වසිට්ඨ	ණ	වාසිට්ඨ	වසිට්ඨගේ පුතා
මොග්ගල්ල	ණායන	මොග්ගල්ලායන	මොග්ගල්ලානගේ පුතා

- **පිටුව 06**

ප්‍රභේදය - අනේකත්‍ථ තද්ධිතය
නොයෙක් අර්ථවල යෙදෙන තද්ධිත මෙයට අයත් වේ. **ණික, ඉය, ආලු, මය** ආදි ප්‍රත්‍යය යෙදේ.

උදාහරණ

නාමය	ප්‍රත්‍යය	තද්ධිත පදය	තේරුම
සකට	ණික	සාකටික	ගැලෙහි නියුක්ත වූයේ
සඞ්ඝ	ණික	සඞ්ඝික	සංඝයාට අයත්
මනුස්සජාති	ඊය	මනුස්සජාතිය	මනුස්ස ජාතියෙහි වූ
දයා	ආලු	දයාලු	කරුණා බහුල කොට ඇත්තේ
සුවණ්ණ	මය	සුවණ්ණමය	රනින් කරන ලද

- පිටුව 07

ප්‍රභේදය - අත්‍ථ්‍යත්‍ථ තද්ධිත

යමකුට ධනය ආදි යමක් ඇත්නම් ඒ ඇති බව ප්‍රකාශ කිරීමට **වන්තු, මන්තු** යන ප්‍රත්‍යය යෙදේ.

උදාහරණ

නාමය	ප්‍රත්‍යය	තද්ධිත පදය	තේරුම
ධන	වන්තු	ධනවන්තු	ධනය ඇති
බුද්ධි	මන්තු	බුද්ධිමන්තු	නුවණ ඇති
වාචා	ආල	වාචාල	වැඩි කථා ඇති

- පිටුව 08

ප්‍රභේදය - සඞ්ඛ්‍යා තද්ධිත

සඞ්ඛ්‍යා ශබ්ද කෙරෙන් පර ව විවිධ ප්‍රත්‍යය යෙදී සෑදෙන පද සඞ්ඛ්‍යා තද්ධිත නම් වේ. **ම, ක, ඨ** වැනි ප්‍රත්‍යය යෙදෙයි.

උදාහරණ

නාමය	ප්‍රත්‍යය	තද්ධිත පදය	තේරුම
සත්ත	ම	සත්තම	සත්වෙනි
ද්වි	ක	ද්වික	දෙකේ සමූහයයි
චතු	ඨ	චතුත්‍ථ	සතරවෙනි

- පිටුව 09

ප්‍රභේදය - භාව තද්ධිත

යම් ශබ්දයක පැවැත්මට හේතු වූ ගුණක්‍රියාදි ලක්‍ෂණ 'භාව' නම් වේ. ඒ ලක්‍ෂණ පවසත හොත් ශබ්ද කෙරෙන් පර ව **ත්ත, තා** ආදි ප්‍රත්‍යය වේ.

උදාහරණ

නාමය	ප්‍රත්‍යය	තද්ධිත පදය	තේරුම
ලහු	තා	ලහුතා	සැහැල්ලු බව
මනුස්ස	ත්ත	මනුස්සත්ත	මිනිසත් බව
අරොග	ණ්‍ය	ආරොග්‍ය	නීරෝගී බව
පණ්ඩිත	ණ්‍ය	පණ්ඩිච්ච	පණ්ඩිත බව

- පිටුව 10

ප්‍රභේදය - අව්‍යය තද්ධිත
මේ ගණයට අව්‍යය ලක්‍ෂණ ඇති තද්ධිත පද අයත් වේ. මේවා විභක්තිවල නො වරනැගෙයි. ත්‍ථ, දා, ධා, තන, දානි වැනි ප්‍රත්‍යය යෙදෙයි.

උදාහරණ

නාමය	ප්‍රත්‍යය	තද්ධිත පදය	තේරුම
සබ්බ	ත්‍ථ	සබ්බත්‍ථ	සැමතැන
සබ්බ	දා	සබ්බදා	හැමකල්හි
බහු	ධා	බහුධා	බොහෝ ආකාරයෙන්
අජ්ජ	තන	අජ්ජතන	අද, අද වූ
ඉම	දානි	ඉදානි	දැන්

ඇමුණුම 02

දෙවසිකං - දිනපතා
මත්තඤ්ඤුතා - පමණ දැනීම
අජානනතා - නො දන්නා
ඉස්සරියං - අධිපති බව
ඡෙකතා - දක්ෂබව
අරහත්තං - රහත් බව
පාපකෙන - පවටකු විසින්
ජානපදෙහි - ජනපදවැසියන් විසින්
ව්‍යාපාදිතත්තා - නසන ලද බැවින්
පමාණකාරිනො - පමණ දන්නවුන්
ඔපම්මං - උපමාවක්
දීඝසො - දිගින්
සාමණෙරො - සාමණේරයන් වහන්සේ

ඇමුණුම 03

\+ ලකුණ සහිත පදය ඉවත් කොට සිසුන් ලවා හිස්තැන් සඳහා සුදුසු පිළිතුරු ලබා ගන්න.

ප්‍රත්‍යය	නාමය + ප්‍රත්‍යය	තද්ධිත පදය	තේරුම
අව	මනු + අව	මාණව	ඔහුගේ පුතා
ආයන	කච්ච + ආයන	කච්චායන	කච්චගේ පුතා
ඉක	අභිධම්ම + ඉක	ආභිධම්මික	අභිධර්මය දන්නා
ඉක	සක්‍යපුත්ත + ඉක	සක්‍යපුත්තික	සක්‍යගේ පුතා
ඉය	පාප + ඉය	පාපීය	පවිටු
ඛත්තුං	එක + ඛත්තුං	එකක්ඛත්තුං	එක්වරක්
තම	පාප + තම	පාපතම	අතිශයින් ම පවිටු
තා	මුදු + තා	මුදුතා	මෘදු බව
තා	ජන + තා	ජනතා	ජන සමූහය

ප්‍රත්‍යය	නාමය + ප්‍රත්‍යය	තද්ධිත පදය	තේරුම
ධා	දස + ධා	දසධා	දසවැදෑරුම්
මන්තු	සති + මන්තු	සතිමන්තු	සිහි ඇති
ඉට්ඨ	පාප + ඉට්ඨ	පාපිට්ඨ	පවිටු
වන්තු	ගුණ + වන්තු	ගුණවන්තු	ගුණ ඇති

1. තද්ධිත හඳුන්වන්න.
2. තද්ධිතයේ ප්‍රයෝජන ලියා දක්වන්න.
3. තද්ධිතයේ ප්‍රධාන ප්‍රභේද තුන නම් කරන්න.
4. සාමඤ්ඤ තද්ධිතයේ ප්‍රභේද තුන ලියා දක්වන්න.
5. යම් කෙනකුගේ දරුවෙක් යන අර්ථය පැවසෙන තද්ධිතය හා තද්ධිත ප්‍රභේදය නම් කරන්න.
6. අනේකත්ථ තද්ධිතයෙහි යෙදෙන ඔබ උගත් ප්‍රත්‍යය පහක් ලියන්න.
8. භාව තද්ධිතය හඳුනාගත හැකි ලක්ෂණය කුමක් ද?
9. අව්‍ය තද්ධිතයෙහි යෙදෙන ප්‍රත්‍යය මොනවා ද?
10. පවිටු, මෘදුබව, සිහි ඇති, රනින් කරන ලද, සත්වෙනි යන අරුත් දෙන තද්ධිත පද පාලියෙන් ලියන්න.

11. පහත ජේදයේ ඇති තද්ධිත පද උපුටා දක්වන්න.

යස්මිං භික්ඛවෙ සමයෙ රාජානො අධම්මිකා හොන්ති රාජයුත්තාපි තස්මිං සමයෙ අධම්මිකා හොන්ති. රාජයුත්තෙසු අධම්මිකෙසු බ්‍රාහ්මණගහපතිකාපි තස්මිං සමයෙ අධම්මිකා හොන්ති. බ්‍රාහ්මණගහපතිකෙසු අධම්මිකෙසු නෙගමජානපදාපි තස්මිං සමයෙ අධම්මිකා හොන්ති. නෙගමජානපදෙසු අධම්මිකෙසු විසමං චන්දිමසුරියා පරිවත්තන්ති. විසමං චන්දිමසුරියෙසු පරිවත්තන්තෙසු විසමං නක්ඛත්තානි තාරකරූපානි පරිවත්තන්ති. විසමං නක්ඛත්තෙසු තාරකරූපෙසු පරිවත්තන්තෙසු විසමං රත්තින්දිවා පරිවත්තන්ති.

12. **පහත දැක්වෙන තද්ධිත පදවල අර්ථ ලියන්න.**

i. මච්ඡරියං	ii. සාකටිකො
iii. මෙධාවී	iv. වාචාලො
v. යසවන්තු	vi. භාගිණෙය්‍ය
vii. ආරොග්‍යං	viii. දාරුමයං
ix. පාපතරො	x. නාවිකො

13. **පහත සඳහන් තද්ධිත පදවල නාමය හා ප්‍රත්‍යය වෙන්කොට දක්වන්න.**

i. මාණවො	ii. කච්චායනො
iii. පාපිට්ඨො	iv. ගුණවා
v. දසධා	vi. පාපතමො
vii. ආභිධම්මිකො	viii. ජනතා
ix එකකබතතුං	x. සතිමා

14. පහත සඳහන් පදවල තද්ධිත ප්‍රභේදය නම් කරන්න.

තද්ධිත පදය	සිංහල අර්ථය	ප්‍රභේදය /අනු ප්‍රභේදය
වාසිට්ඨ	වසිට්ඨගේ පුත්‍රයා	
මොග්ගල්ලායන	මොග්ගල්ලාගේ පුත්‍රයා	
කච්චායන	කච්චගේ පුතා	
දයාලු	දයා බහුල	
ආභිධම්මික	අභිධර්මය දන්නා	
නාවික	නැවියා	
සාකටික	ගැල්කරුවා	
සාමණෙර	ශ්‍රමණයාගේ පුත්‍රයා	
පාපතම	අතිශයින් ම පව්ටු	
මුදුතා	මෘදු බව	
දසධා	දසවැදෑරම්	
සතිමන්තු	සිහි ඇති	
ගුණවන්තු	ගුණ ඇති	
මෙධාවී	ප්‍රඥාව ඇති	

15. පහත සඳහන් නාමවලට ඉය, ණ, තර, ඉක, එර, ධා, තා, මන්තු, වන්තු, ණායන, ඊ, ණ්‍ය, ත්‍ථ, ත්ත, ආලු, ථ යන ප්‍රත්‍යය යොදා අර්ථවත් තද්ධිත නිර්මාණය කර එම තද්ධිත පදයේ අර්ථය දක්වන්න.

නාමය	ප්‍රත්‍යය	අර්ථය
මොග්ගල්ල		
පාප		
භණ්ඩාගාර		
සීල		
බුද්ධි		

නාමය	ප්‍රත්‍යය	අර්ථය
මුදු		
සමණ		
සත්ත		
දක්ඛිණා		
දිවා		
සබ්බ		
ධන		
මනුස්ස		
ගුණ		
අරොග		
සති		
වසිට්ඨ		
දයා		
චතු		

16. පහත දැක්වෙන තද්ධිත පද බහුවචනයට හරවා ඒවායේ අර්ථ ලියා දක්වන්න.

i. වාසිට්ඨ
ii. ධනවන්තු
iii. වාචාල
iv. මොග්ගල්ලායන
v. සාකටික
vi. බුද්ධිමන්තු
vii. සුවණ්ණමයං
viii. ආභිධම්මිකස්ස
ix. මානවා
x. සක්‍යපුත්තිකො

17. **පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.**

i. යසවන්තො ගුණවන්තො ච භවිස්සති.
ii. නාවිකො නාවාය ගංගං තරති.
iii. මෙධාවී නිච්චං ඔවදති.
iv. සාමණෙරො ආභිධම්මිකෙන ගාමං පවිසති.
v. පාපතරො සූකරිකො සූකරං මංසං රොචෙති.
vi. මච්චරියො දානං න දෙති.
vii. ආරොග්‍යාපරමා ලාභා.
viii. අහං දාරුමයබුද්ධරූපං ච වන්දාමි.
ix. වාචාලො අත්තනො වාචාලභාවං න ජානාති
x. සාකටිකො සකටෙන නගරං ගච්ඡිස්සති.

18. **පහත දැක්වෙන වාක්‍ය බහුවචනයට හරවා සිංහලට පරිවර්තනය කරන්න.**

i. කනිට්ඨභාතරො පාඨසාලං ගච්ඡති.
ii. සාමණෙරො පණ්ණසාලෙ වසති.
iii. ආභිධම්මිකො ධම්මං දෙසෙති.
iv. සතිමන්තො සම්මා උග්ගණ්හාති.
v. පදිකො දක්ඛිණදිසං නික්ඛමති.
vi. බුද්ධො නවමෙ මාසෙ ලංකාදීපං උපාගමි.
vii. ගුණවන්තො සීලවන්තං වන්දති.
viii. සීලවන්තො සබ්බඤ්ඤූ පූජිතො හොති.
ix. තව මනුස්සත්තං අහං පස්සාමි.
x. සංඝෙ දින්නං න නස්සති.

පාඩම 18 - කිතක

නිපුණතාව : 10.0 පාලි භාෂාවේ කිතක හඳුනාගෙන භාවිත කරයි.

නිපුණතා මට්ටම : 10.1 කිතක කෙටියෙන් හඳුන්වයි.
10.2 කිතක ප්‍රභේද නම් කරයි.
10.3 කිතක ප්‍රභේදවලට නිදසුන් සපයයි.

කාලච්ඡේද : 06 යි.

ඉගෙනුම් පල :

- කිතක හඳුන්වා දෙයි.
- තද්ධිත හා කිතක අතර වෙනස පෙන්වා දෙයි.
- ඒ ඒ කිතක ප්‍රභේදයට නිදසුන් සපයයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :

- පහත වාක්‍ය සිසුන්ට ඉදිරිපත් කරන්න.
  සබ්බෙහි කුසලං කත්තබ්බං
- මෙහි **කත්තබ්බ** යන පදය උපුටා දක්වන්න.
- එය වියුක්ත කොට පෙන්වමින් ධාතුවක් හා කිතක ප්‍රත්‍යයක් එක්වීමෙන් කිතක නම් පද විශේෂය භාෂාවෙහි නිර්මාණය වන බව පැහැදිලි කරන්න.
- කිතක යන්න සාකච්ඡා කරන්න.
- ධාතුව සහ ප්‍රත්‍යය එකතු කොට සකස් කරන ලද කිතක පද තුනක් හුණු පුවරුවේ ලියන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1

- පෙළ පොතෙහි '**අට්ඨාරසමො පාඨො**' කෙරෙහි සිසු අවධානය යොමු කරවන්න.
- කිතක පදයක් සාදාගන්නා ආකාරය පෙන්වා දී කිතක පදයක් හඳුනා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.
- තද්ධිත පදයක් හා කිතක පදයක් අතර ඇති වෙනස පැහැදිලි කොට දෙන්න.
- කිතක ප්‍රභේද නාමික ව හඳුන්වා ඒවා සිසුන් ලවා වාචෝද්ගත කරවන්න.
- ඒ ඒ කිතක ප්‍රභේද නිදසුන් සහිත ව කෙටියෙන් විස්තර කරන්න.
- ඇමුණුම 01 පරිදි එක් ධාතුවක් ඇසුරෙන් විවිධ කිතක පද නිර්මාණය කර ගන්නා අයුරු පෙන්වා දෙන්න.
- පෙළ පොතෙහි උද්ධෘත පාඨවල සහ නිර්දිෂ්ට කෘතිවල ඇති කිතක පද උපුටා දැක්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 03 අභ්‍යාස කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

මූලික වදන් සංකල්ප :

- **කිතක නාම** - ධාතුවක් අගට කිතක ප්‍රත්‍යයක් එක්වීමෙන් සැදෙන පද විශේෂයකි.
- **ධාතු** - ක්‍රියාපදයක මූලය ධාතුව යි.
- **කිතක ප්‍රභේද** - අතීත කිතක, වර්තමාන කිතක, අනාගත කිතක, ත්‍රෛකාලික කිතක, අව්‍යය කිතක

ඇගයීම හා තක්සේරුකරණය :
- කිතක පද හැඳින්වීම
- තද්ධිත පදයක් හා කිතක පදයක් අතර ඇති වෙනස පැහැදිලි කිරීම
- කිතක පදයක් සාදාගන්නා ආකාරය දැක්වීම
- කිතක ප්‍රභේද ප්‍රකාශ කිරීම
- ඒ ඒ කිතක ප්‍රභේදයට අයත් කිතක පදවලට නිදසුන් ඉදිරිපත් කිරීම
- දෙනු ලබන ඡේදයකින් කිතක පද උපුටා දැක්වීම

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 01 සහ 02
- පෙළ පොත

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :
- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය 01, 02
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- නාමමාලා
- බාලාවතාරය
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි පදාවතාරය

ඇමුණුම 01

ධාතුව	අර්ථය	තබ්බ	ත	අන්ත	ත්වා	තුං
කර	කිරීම	කත්තබ්බ	කත	කරොන්ත	කත්වා	කාතුං
පච	පිසීම	පචිතබ්බ	පචිත	පචන්ත	පචිත්වා	පචිතුං
භාස	කීම	භාසිතබ්බ	භාසිත	භාසන්ත	භාසිත්වා	භාසිතුං

ඇමුණුම 02

01. **පහත සඳහන් කිතක පද වගුගත කරන්න.**

'ගහෙතබ්බං, පස්සන්ත, කත, චරමාන, දෙය්‍ය, කරිස්සං, පූජකො, යාචිතුං, හසිත, කාරකො, ධම්මධරො, දෙසිත, පස්සිතුං, සවනීයං, බාදිස්සං, ගච්ඡන්ත, වන්දිත්වා, පචිස්සං.'

කිච්ච	ත්‍රෛකාලික කිතක	අතීත කිතක	වර්තමාන කිතක	අනාගත කිතක	අව්‍යය කිතක

02. පහත ඡේදයෙහි ඇතුළත් කිතක පද උපුටා දක්වන්න.

අථ බො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන බාරාණසී ඉසිපතනං මිගදායො, යෙන පඤ්චවග්ගියා භික්ඛූ, තෙනුපසඞ්කමි. අද්දසංසු බො පඤ්චවග්ගියා භික්ඛූ භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන අඤ්ඤමඤ්ඤං සණ්ඨපෙසුං. ''අයං ආවුසො සමණො ගොතමො ආගච්ඡති, බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය. සො නෙව අභිවාදෙතබ්බො, න පච්චුට්ඨාතබ්බො, නාස්ස පත්තචීවරං පටිග්ගහෙතබ්බං. අපි ච බො ආසනං ඨපෙතබ්බං. සචෙ සො ආකඞ්ඛිස්සති නිසීදිස්සතී''ති. යථා යථා බො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ උපසඞ්කමති, තථා තථා තෙ පඤ්චවග්ගියා භික්ඛූ නාසක්ඛිංසු සකාය කතිකාය සණ්ඨාතුං. අසණ්ඨහන්තා භගවන්තං පච්චුග්ගන්ත්වා එකො භගවතො පත්තචීවරං පටිග්ගහෙසි. එකො ආසනං පඤ්ඤාපෙසි. එකො පාදොදකං පාදපීඨං පාදකඨලිකා උපනික්ඛිපි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ බො භගවා පාදෙ පක්ඛාලෙසි. අපිස්සු භගවන්තං නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරන්ති. එවං වුත්තෙ භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොච, ''මා භික්ඛවෙ තථාගතං නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරිත්ථ. අරහං භික්ඛවෙ තථාගතො සම්මා සම්බුද්ධො. ඔදහථ භික්ඛවෙ සොතං, අමතමධිගතං, අහමනුසාසාමි. අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා''ති.

03. පහත දැක්වෙන කිතක පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

i. කත්තබ්බං

....

ii. යාචකො

....

iii. පධීත්වා

....

iv. සුණන්තො

....

v. ඛාදිතුං

....

vi. ලිඛිතො

....

vii. ධාවන්තා

....

viii. පූජෙත්වා

....

ix. සාවකො

....

x. පාතුං

....

04. පහත සඳහන් කිතක පදවල ප්‍රභේදය හා අර්ථය දක්වන්න.

කිතක පදය	ප්‍රභේද නාමය	අර්ථය
නිබ්බත්තො		
උපගන්තුං		
ගය්හමානො		
ගහෙත්‍වා		
වයප්පත්තො		
ආගතා		
උප්පජ්ජමානො		
දිස්වා		
ආගතස්ස		
ඔලොකයමානා		
ඨිතං		
පක්කොසාපෙත්‍වා		
දින්නා		
නිසින්නො		
කත්‍වා		
නහාපෙතුං		
සුතං		
ධාවන්තො		
කාරාපෙත්‍වා		
වන්දිතුං		

පාඩම 19 - නිර්දිෂ්ට ගද්‍ය පාඨ පරිවර්තනය

නිපුණතාව : 11.0 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය සඳහා කියවයි.

නිපුණතා මට්ටම : 11.1 අනිත්ථිගන්ධකුමාරවත්ථු මාධ්‍ය භාෂාවට නගයි.
11.2 අඤ්ඤතරබ්‍රාහ්මණවත්ථු මාධ්‍ය භාෂාවට නගයි.
11.3 පඤ්චසතදාරකවත්ථු මාධ්‍ය භාෂාවට නගයි.

කාලච්ඡේද : 30 යි.

ඉගෙනුම් පල :
- නිර්දිෂ්ට කථාවලට පදානුපදික අර්ථ ලියයි.
- නිර්දිෂ්ට කථා මාධ්‍ය භාෂාවෙන් ලියයි.
- නිර්දිෂ්ට කථා සාරය මතකයෙන් කියයි.
- නිර්දිෂ්ට කථාවල ජීවනාදර්ශ පෙන්වා දෙයි.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රවේශය :
- ත්‍රිපිටකයේ ධම්මපදයෙහි නියෝජනය පෙන්වා දෙන්න.
- ධම්මපදට්ඨකථාව හා එහි කතුවරයා හා කාලය පිළිබඳ විස්තර කරන්න.
- ධම්මපදයේ ගාථා තේරුම් ගැනීමට අටුවාවේ වැදගත්කම අවධාරණය කරන්න.
- පියවග්ගයේ එන ධම්මපදට්ඨකථාවලින් ගත හැකි ජීවන ආදර්ශ මිනිසත් භවයක සංවර්ධනයට ඉවහල් කරගත හැකි ආකාරය සාකච්ඡා කරන්න.

පාඩම සංවර්ධනය :

පියවර 1
- ධම්මපදට්ඨකථාවෙහි පියවග්ගය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ධම්මපදට්ඨකථාව පන්තියට ඉදිරිපත් කරමින් එහි එන නිර්දේශිත කථා කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- සුදුසු පරිදි කාලච්ඡේද වෙන් කර ගනිමින් අනිත්ථිගන්ධකුමාරවත්ථු, අඤ්ඤතරබ්‍රාහ්මණවත්ථු, පඤ්චසතදාරකවත්ථු යන ධම්මපදට්ඨකථා සම්බන්ධයෙන් පහත සඳහන් ඉගෙනුම් ඉගැන්වීම් කටයුතුවල නිරත වන්න.

– සිසුන්ට පෙළ පොතේ එන අදාළ කථාව හඬනගා කියවීමට අවස්ථාව දෙන්න.
– කථා වස්තුවේ අර්ථය සිංහල භාෂාවෙන් පැහැදිලි කර සාකච්ඡා කරන්න.
– ඒ ඒ ශිෂ්‍යයාගෙන් කථා සාරය විමසමින් සමස්ත කථාව ගොඩනැංවීමට අවස්ථාව දෙන්න.
– කථාවල ජීවනාදර්ශය සාකච්ඡා කරන්න.

- අදාළ කථාවලින් ගත හැකි ජීවන ආදර්ශය වර්තමාන සංසිද්ධි හා ගළපමින් සිත් ඇදගන්නා සුලු ආදර්ශවත් ලිපියක් සිංහල භාෂාවෙන් නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.
- සිසුන්ගේ නිර්මාණ A4 කඩදාසිවල ලියා තේමාවක් යොදා ග්‍රන්ථයක් සේ සකස් කරවන්න.
- ඇමුණුම 01හි අභ්‍යාස කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

මූලික වදන් සංකල්ප :
- ධම්මපදට්ඨකථා : ඛුද්දකනිකායට අයත් ධම්මපදපාළියට හෙළටුවාවක් ආශ්‍රයෙන් බුද්ධඝෝෂ හිමියන් විසින් ක්‍රි.ව. පස්වන සියවසේ දී සපයන ලද අටුවාව යි.

ඇගයීම හා තක්සේරුකරණය :

- නියමිත කථාවලට පදගතාර්ථ ලියමින් මාධ්‍ය භාෂාවෙන් පැහැදිලි කිරීම
- විශේෂ පද විස්තර සහිත ව දැක්වීම
- කථා සාරය මතකයෙන් ප්‍රකාශ කිරීම
- නිර්දිෂ්ට කථා ආශ්‍රිත ධර්මාර්ථ චරිතායනය කළ හැකි වන සේ නිර්මාණ ඉදිරිපත් කිරීම

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01
- පෙළ පොත
- ධම්මපදට්ඨකථා

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- ධම්මපදට්ඨකථා
- ධම්මපදපාළි

ඇමුණුම 01

01. **නිර්දිෂ්ට ගද්‍ය කොටස් ඇසුරු කොට පාලියට නගන්න.**

i. උපන් දින සිට
ii. රෙදි තිරයකින්
iii. ප්‍රතික්ෂේප කර
iv. ඉතා විසිතුරු
v. කළ පින් ඇති කුමාරිකාවක්
vi. තොටට යන මග
vii. රූමත් කුමරියක්
viii. පිළිසඳර කථාව නිමවා
ix. සතුටු සිතින්
x. ඉතා සියුමැලි බැවින්
xi. සතුටු සාමීචි කථා
xii. පැළ සිටුවමි
xiii. හටගත් බලවත් ශෝක ඇත්තේ
xiv. මෙතැන් පටන්
xv. පන්සියයක් භික්ෂූන් පිරිවරා
xvi. උපන් සෙනෙහස ඇත්තාහු
xvii. වළඳා අවසානයෙහි
xviii. මුහුණ බලා දෙන භික්ෂාවක්
xix. දේශනය කෙළවර

තක්සේරුව සහ ඇගයීම

හැඳින්වීම

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළින් නිපුණතා පාදක විෂය මාලාව හඳුන්වා දීමේ දී **පාසල පදනම් කරගත් තක්සේරුකරණය** පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එසේම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනා ගෙන ඒවා දියුණු කරමින් හා පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟාකර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ ද යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයාගේ කාර්යභාරයයි. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකිය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම

ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් වුයේ දැ යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන් ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු ය. මේ සඳහා පවත්නා හොඳම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමයයි. යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම
7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්වනිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සෑම එකක්මත්, සෑම විෂයක් සම්බන්ධයෙන්මත්, සෑම විෂය ඒකකයකටමත්, යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

ආදර්ශ ප්‍රශ්න පත්‍රය
Model Paper

3 ශ්‍රේණිය /Grade 3

පාලි භාෂාව Pali　　**විභාග අංකය :..**

කාලය : පැය දෙකයි Time : Two hours

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

I කොටස

01. **කෙටි පිළිතුරු සපයන්න.**

i. පාලි වර්ණමාලවේ ස්වර ප්‍රභේද දෙක නම් කර එම ප්‍රභේදවලට අයත් අකුරු ලියා දක්වන්න.

ii. චතුත්ථී හා පඤ්චමී විභක්ති යෙදෙන අර්ථ දෙක ලියා උදාහරණය බැගින් ලියන්න.

iii. සත්ථු, පිතු, මාතු, මන යන ශබ්දවල පඨමා විභක්ති බහුවචන රූප ලියා දක්වන්න.

iv. බාලකො, මාතා, පුප්ඵං, සත්ථාරො යන පද සුදුසු සර්වනාම පද හා ගළපන්න.

v. පිතරා, මයි, තානි, තෙසු යන පදවල සිංහල තේරුම ලියන්න.

vi. අනුමති හා ආශීර්වාද යන අර්ථ යෙදෙන ආඛ්‍යාත විභක්ති නම් කරන්න.

vii. සදා, සචෙ, සනිකං, කුතො යන නිපාත පදවල තේරුම ලියන්න.

viii. ඵලානි පතන්ති හා මාතා ඔදනං පචි යන වාක්‍ය සිංහලට නගන්න.

ix. සන්ධි කිරීම සඳහා යොදා ගන්නා විධි හතරක් ලියන්න.

x. ඵඤ්ඤං, පටික්ඛිපිත්වා, අඤ්ඤතරො, නාභාපෙත්වා යන පදවල තේරුම් ලියන්න.

(ලකුණු 04 × 10 = 40 යි)

II කොටස

02. (අ) **පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.**

අයං පන තාපසානං අස්සමො. අයං පණ්ණසාලා. අස්මිං අස්සමෙ ජනා සබ්බෙ පසවො ච සකුණා ච සන්තුට්ඨා නිවසන්ති. බහවො රුක්ඛා ඉමස්මිං සන්ති. රුක්ඛා තෙ සාඛාහි විටපෙහි ච සජ්ජිතා. තහිං නිසින්නා පක්ඛිණො නිරන්තරං මධුරං කූජන්ති.

(ලකුණු 05 යි)

(ආ) **පහත සඳහන් පද සුදුසු පරිදි ගළපා අර්ථවත් වාක්‍ය තනන්න.**

i. ආහරිත්වා/සහ/මධුං/පිතරො/භුඤ්ජිංසු/අම්හාකං/දධිනා
ii. දාරූනි/මයං/විනා/ගන්ත්වා/අරඤ්ඤං/භුඤ්ජිස්සාම/තුම්හෙහි
iii. සොපාණං/ ගණ්හිතුං/ආරුහති/ දාරකො/ඡත්තං
iv. පස්සිත්වා/ලභාම/මයං/රූපානි/ලොචනෙහි/ච/දුක්ඛං/ච/සුඛං
v. රක්ඛන්ති/ මනුස්සෙ/වසුධායං/දෙවා

(ලකුණු 05 යි)

(ඉ) **පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.**

i. මැණියෝ බත පිසූහ.
ii. දැරිය වනයට ගියාය.
iii. මම අකුරක් ලියමි.
iv. කොළ වැටෙයි.
v. අශ්වයෝ මාර්ගයේ දුවත්. *(ලකුණු 05 යි)*

03. (අ) **පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.**

අථ නං එකදිවසං බ්‍රාහ්මණො ආහ. හො ගොතම ත්වං මම ඛෙත්තසොධනදිවසතො පට්ඨාය ආගතො. සචෙ මෙ සස්සං සම්පජ්ජිස්සති, තුය්හම්පි සංවිභාගං කරිස්සාමි. තුය්හං අදත්වා සයං න ඛාදිස්සාමි. ඉතොදානි පට්ඨාය ත්වං මම සහායොති. අථස්ස අපරෙන සමයෙන සස්සං සම්පජ්ජිතස්ස ''සම්පන්නං මෙ සස්සං ස්වෙදානි දායාපෙස්සාමී''ති දායනත්ථං කත්තබ්බකිච්චස්ස රත්තිං මහාමෙඝො වස්සිත්වා සබ්බසස්සං හරි.

(ලකුණු 08 යි)

(ආ) **'තණ්හාය ජායතී සොකො තණ්හාය ජායතී භයං' යන ගාථා පාඨය යොදා ගනිමින් කෙටි අනුසාසනයක් ලියන්න.**

(ලකුණු 07 යි)

04. (අ) **ලෝප, ආදේස, ආගම යන සන්ධි විධි තුනට නිදසුන් තුනක් සපන්න.**

(ආ) **ස්වර සන්ධියේ අසවර්ණාදේශය හා වකාරාදේශය හඳුන්වා නිදසුන් දෙක බැගින් ලියන්න.**

(ඉ) **ලොපඤ්ච තත්‍රාකාරො, පරද්වෙභාවො ඨානෙ, ඔ අවස්ස, දීඝං යන සූත්‍ර හඳුන්වා උදාහරණය බැගින් සපයන්න.**

(ලකුණු 03 + 04 + 08 = 15 යි)

05. (අ) **පහත දැක්වෙන පදවල ශබ්ද ප්‍රකෘතිය ලියන්න.**

i.	මයි	ii.	ඉමිනා	iii.	එසො
iv.	තම්හා	v.	පිතා	vi.	මුනිනා

(ආ) **චර ධාතුව අජ්ජතනී ආඛ්‍යාත පරස්සපදයේ වරනගා වගුගත කර දක්වන්න.**

(ඉ) **සමාස ප්‍රභේද හය(06) ලියන්න.**

(ලකුණු 03 + 06 + 06 = 15 යි)

06. (අ) **පහත සඳහන් වාක්‍යය දී ඇති සුදුසු නිපාත පද යොදා සම්පූර්ණ කරන්න.**
(අභිණ්හං, සචෙ, පුරා, ආරකා, මා, උපරි, තථා, ආවුසො, කුහිං, සහසා)

i. …………….. මං අපාදකො හිංසි.
ii. කුමාරි ……… පාසාදෙ තිට්ඨති.
iii. …………….. කති වස්සො'සි ත්වං?
iv. යථා මාතා වදති …………….. අහං කරිස්සාමි.
v. සො ……………..අගච්ඡි.

vi. …………….. ත්වං නහායිස්සසි, අහම්පි නහායිස්සාමි.
vii. …………….. තව භාතා?
viii. ……………..බොධිසත්තො බාරාණසියං උප්පජ්ජි.
ix. පාපමිත්තො ……………..පරිවජ්ජෙය්‍ය.
x. තුම්හෙහි …………….. පච්චවෙක්ඛිතබ්බං.

(ආ) **පහත දැක්වෙන වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.**

i. අහං පාඨසාලං ගච්ඡාමි.
ii. ත්වං බුද්ධං වන්දසි.
iii. වානරො රුක්ඛං ආරුහති.
iv. අධිපති භත්තං භුඤ්ජති.
v. චොරො ඡත්තං චොරෙති.

(ලකුණු 10 + 05 = 15 යි)

***

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. වාරය ඃ දෙවැනි වාරය

2. ආධාරක අංකය ඃ 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම ඃ 7.1, 7.2 සහ 7.3

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය ඃ
   - සන්ධි හැඳින්වීම, ප්‍රයෝජන, කාර්යය, ප්‍රභේද සහ නිදර්ශන

5. ආධාරකයේ ස්වභාවය ඃ පිටු පෙරළනයක් සැකසීම

6. ආධාරකයේ අරමුණු ඃ
   - සන්ධි භාවිතය පිළිබඳ නිපුණත්වයක් ලබා ගැනීම
   - සන්ධි පිළිබඳ පෘථුල දැනුමක් හිමි කරගැනීම

7. ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

   ගුරු උපදෙස් ඃ
   - පන්තියේ සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා එක් එක් කණ්ඩායමට වෙන වෙන ම සන්ධි ප්‍රභේදයක් බැගින් පවරා ඒ ඒ ප්‍රභේදයේ හැඳින්වීම, ප්‍රයෝජන, කාර්යය, සහ නිදර්ශන ඩිමයි කඩදාසියක ලියා පිටු පෙරළනයට එක් පිටුවක් බැගින් සකස් කිරීමට උපදෙස් දෙන්න.
   - අදාළ පිටුව කැමැති පරිදි වර්ණ ගන්වා චිත්තාකර්ෂණීය ලෙස සැකැසීමට යොදවන්න.
   - පිටු සකස් කිරීමට නිශ්චිත කාල රාමුවක් ලබාදෙන්න.
   - අදාළ පිළිවෙළට පිටු අමුණා පිටු පෙරළනය ගොඩනැඟීමට සිසුන්ට සහාය වන්න.
   - පිටු පෙරළනය නිතර පරිහරණය කළ හැකි ස්ථානයක රඳවන්න.
   - අදාළ නිර්ණායකයන්ට ලකුණු ලබා දෙන්න.

   සිසු උපදෙස් ඃ
   - තම කණ්ඩායමට සකස් කිරීමට නියමිත සන්ධි ප්‍රභේදය ගුරුවරයා හා සාකච්ඡා කොට තීරණය කරන්න.
   - තොරතුරු හොඳින් ඉස්මතු වී ඇතට පෙනෙන සේ නිවැරදි ව ලියන්න.
   - පිටු පිළිවෙළට අමුණා පිටු පෙරළනය ගොඩ නඟන්න.
   - නිර්ණායක මැනවින් තේරුම් ගෙන උසස් ලෙස කණ්ඩායමේ කාර්යය සිදු කරන්න.

ලකුණු පරාසය

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථ යි 02
- සංවර්ධනය විය යුතු ය 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය දෙකෙන් බෙදා අවසාන ලකුණු සටහන් කිරීම නිර්දේශ කෙරේ. ශිෂ්‍යයා ලබා ගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් දෙකෙන් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවට වටයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

9-10	විශිෂ්ට මට්ටමේ නිපුණතාව
8	ඉහළ මට්ටමේ නිපුණතාව
6-7	සම්මාන මට්ටමේ නිපුණතාව
4-5	ආසන්න මට්ටමේ නිපුණතාව
5 ට	අඩු නිපුණතාවට ළඟා නො වූ

මෙය නිදර්ශක ආධාරකයක් පමණි. ගුරුවරයාට ස්වාධීන ව ආධාරක සැලසුම් සකස් කරගත හැකි ය.

නිර්ණායකය	සිසුන්ගේ නම්							
1. මාතෘකාවට අදාළ බව								
2. කරුණුවල නිවැරදි බව								
3. පිටු පිළිවෙළට සැකසීම								
4. දත්තවල ප්‍රමාණාත්මක බව								
5. නිර්මාණාත්මක බව								
එකතුව								